# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015 මාර්තු 18** වන අඟහරුවාදා
2015 பங்குனி 18 செவ்வாய்க் கிழமை
Thuesday 18th March 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුවමාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභාගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.48 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.48* ***க்கு சபை கூடியது***
*The Provincial Council met at 09.48 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

---

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. ඔබතුමාගේ අවධානයට යොමු කරනවා කාර්ය පටිපාටි රීති අංක 8(4) ට. එහි සඳහන් වෙනවා, උදෑසන 09.30 ට මෙම සභාව රැස්විය යුතුයි කියලා. ඒකෙන් අදහස් වෙන්නේ 09.30 ට මේ සභාව රැස් වුණේ නැත්නම් මේ සභාව නීති විරෝධීයි කියන එක. පසුගිය සභාවේදී ගණපූරණය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් වෙලා මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මේ සභාවේ සාකච්ඡාවට ගන්න බැරි වුණා. එම නිසා සභා රීති කියන ඒවා තමන්ට ඕනෑ ඕනෑ විධියට පාවිච්චි කරන්න බැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් වගකීම තිබෙන්නේ ගරු සභාපතිතුමනි, ඔබතුමාට. එම නිසා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. යෝජනාවක් සම්බන්ධයෙන් කථා කිරීමේදී ගණපූරණයට අදාළ වෙනවා නම් මේ 8 (4) රීතියත් මේ සභාවේම රීතියක්. ඒ නිසා ඒකත් මේකට අදාළයි. එම නිසා මේ සභාව නීති විරෝධීයි කියලා මම මේ සභාවට පෙන්වා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමාට මම බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. එම රීතිය සභාවට පෙන්වා දීම සම්බන්ධයෙන්. මම මගේ නිල කාමරයට පැමිණියා 09.15 වනකොට. මම ලේකම්තුමාත් සමග සාකච්ඡා කළා සභා ගර්භය තුළ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය කොහොමද කියන එක. ඇත්ත වශයෙන්ම 09.40 වනකොටත් සභාව තුළ නියමිත මන්ත්‍රී සංඛ්‍යාව හිටියේ නැහැ. ඒකයි මට ප්‍රශ්නය වුණේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, මම පෙන්වා දෙන්නේ 09.30 ට සභාව පටන් අරගෙන ගණපූරණය නැත්නම් මේ සභාව නතර කරන්න ඕනෑ. විනාඩි 10 ක් කල් තියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් මම එහෙම කරන්නේ නැහැ. මොකද, මම නිතරම උත්සාහ ගන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, අපි කියන්නේ එහෙම කරන්න ඕනෑ. මොකද, මේ සභාවේ යෝජනාවක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේදී ගණපූරණය සලකනවා නම් අනෙක් කෘත්‍යයන් සම්බන්ධවත් ඒ විධියටම කටයුතු කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමාගේ අදහසට ගරු කරමින්, මට ඉදිරියට ඒ ආකාරයට කටයුතු කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මම ඉදිරියේදී බොහෝ දුරට උත්සාහ කරන්නේ ආරම්භයේදී ගණපූරණය නොමැති වුණත්, සභාව ආරම්භ කරන්නයි මම උත්සාහ කරන්නේ. ඇත්ත වශයෙන්ම ගණපූරණය පවත්වාගෙන යෑම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය බොහෝ දුරට අඩු වෙලා තිබෙන්නේ. ඒ නිසා මම උත්සාහ කරනවා, මන්ත්‍රීවරු නොමැති වුණත් මේ සභාව අරගෙන යන්න. නමුත් ඔබතුමන්ලා ඒ වාගේ රීති ප්‍රශ්න ඉදිරිපත් කරනවා

නම් ඉදිරියේදී සභාවේ නියමිත මන්ත්‍රී සංඛ්‍යාව නැත්නම් අනිවාර්යයෙන්ම මම සභාව පවත්වාගෙන යන්නේත් නැහැ. ඒ පිළිබඳව ගරු ඇමැතිවරුන්ටත්, දෙපැත්තේම සංවිධායකවරුන්ගේත් අවධානයට මම යොමු කරනවා. ඒ අයගේ වගකීමක් සභාවේ ගණපූරණය පවත්වාගෙන යෑම. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සංවිධායකතුමන්ලාගේ වගකීමක්. මම ඔබතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙනවා, එම රීතිය මේ සභාවට පෙන්වා දීම සම්බන්ධයෙන්.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 2015.03.03 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2015.03.04 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඉදිරිපත් කරනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, වතුරුගම, බටේපොළ, කඳුමුල්ල පාර, අංක 169 හි පදිංචි ඒ.පී. රෝහිණී ද වාස් ගුණවර්ධන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, බණ්ඩාරගම, රයිගම/බටහිර, කුඹුක පාර හි පදිංචි පී.එල්. ගුණරත්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. බත්තරමුල්ල, පැලවත්ත, රෝහිනා මාවත, අංක 824 හි පදිංචි ටී.එම්.එස්. තෙන්නකෝන් යන අයගේ පෙත්සම සහ

ii. බොරලැස්ගමුව, කටුවාවල, දෙනියවත්ත හි පදිංචි ලිලානි චන්ද්‍රිකා විදානපතිරණ යන අයගේ පෙත්සම.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පිළියන්දල, වැව්ල, ගහබඩ පාර, අංක 59/2A හි පදිංචි කේ.එස්. පෙරේරා යන අයගේ පෙත්සම සහ

ii. සීදූව, රද්දොළුගම, අංක 119 හි පදිංචි කේ.ඒ.එස්.ආර්. දයානන්ද සහ ඩබ්ලිව්. ජානක ප්‍රනාන්දු යන අයවලුන්ගේ පෙත්සම.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පන්නිපිටිය, දේගහවත්ත පාර, අංක 536/9 හි පදිංචි හර්ෂ වීරතුංග යන අයගේ පෙත්සම සහ

ii. කොළඹ 10, මාලිගාවත්ත පෙදෙස, අංක 151 ඩී/2 හි පදිංචි එම්.එස්. සලීම්ඩීන් යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කරනවා.

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)[ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)[On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය දැන් උත්තර දීලා තියෙන්න ඕනෑ එකක්. දැන් මාස 02 ක් වෙනවා. දිගින් දිගටම කල් ගන්නවා. මේ සභාවට ප්‍රශ්න ගොඩක් ඇත්තෙත් නැහැ. ප්‍රශ්න කිහිපයයි තියෙන්නේ. හරි නම් ප්‍රශ්න 15 ක් මේ න්‍යාය පත්‍රයකට එන්න ඕනෑ. එහෙමත් නැහැ. මාස 02 කට වැඩි කාලයක් මේ ප්‍රශ්නයට ගත්තා කියලා කියන්නේ වර්තමාන ආණ්ඩුවේ දින 100 කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ප්‍රශ්න කරන කට්ටියමයි මේ වැරැද්ද කරන්නේ. දින 100 කාර්යක්ෂමතාවය පිළිබඳ ප්‍රශ්න කරනවා. මේ සභාවට ඉදිරිපත් කරන ප්‍රශ්නයට උත්තර දෙන්න මෙපමණ කාලයක් ගන්නවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, මේකේ ප්‍රධාන දේ ගරු ප්‍රධාන ඇමැතිතුමා අද ලංකාවේ නැහැ. ඒක එක. දෙවැනි එක මේකේ අහලා තිබෙන ප්‍රශ්න පිළිබඳව - තවමත් ක්‍රියාත්විතයේ නම් ලැයිස්තු ඉස්කෝලවලට එවනවා. ඉතින් ඒ නිසා මට මේකට කෙලින් උත්තරයක් දෙන්න අපහසුයි. ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නයට කල් ගත්තේ. මොකද, ඔබතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවොත් මම ඒකට උත්තර දෙන්න බැඳිලා ඉන්නවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමා ආවාම උත්තර දෙන්න තමයි සති දෙකක කාලයක් නැවත ඉල්ලන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

එහෙම ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ. ක්‍රියාත්විතයෙන් මේ සඳහා පරක්කු කරනවා. ළමයි ගෙවල්වල ඉන්නවා. ඒ ළමයින් පීඩනයකින් ඉන්නේ. ඒ නිසාම තමයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ මොහොත වන කොට ක්‍රියාත්විතයෙන් ඇවිල්ලා තිබෙන්නේ මෙපමණයි කියලා මේකට උත්තරය දෙන්න ඕනෑ. ඒකයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සති දෙකක් ඇතුළත ඒකට උත්තර දෙන්න.

***න්‍යාය පත්‍රයේ අංක 01 හා 02 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon.Lakshman Nipuna Arachchi, - Member, under item No. 01 and 02 in the Agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr. Nimal Lansa on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

## බස්නාහිර පළාතේ ක්‍රීඩා අමාත්‍යාංශය : ක්‍රීඩා විෂය තනතුර

WESTERN PROVINCIAL MINISTRY OF SPORTS: POSITION ON SPORTS SUBJECT

**03.**

**රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ හා සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**ප්‍ර/VI(1)/15/16)**

අ. i. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා විෂයේ තනතුරු ලබා දීමේ ක්‍රමවේදය කුමක්ද?

ii. එහි නිලධාරීන් පත් කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ ආවරණය කර තිබේද?

iii. එහි ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර පරිපාලන සේවයට අයත් නිලධාරියෙකුගේ සේවයට අයත්ද?

ආ. i. 2013/2014 වසර තුළ ක්‍රීඩා භාණ්ඩ මිලදී ගත් ක්‍රමවේදය කුමක්ද?

ii. ලබා ගත් ක්‍රීඩා භාණ්ඩවල ප්‍රමිතිය සහතික කර තිබේද?

iii. නියමිත පිරිවිතරයන්ට පරිබාහිරව ලබා ගත් ක්‍රීඩා භාණ්ඩ සඳහා කරන ලද වියදම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දිය හැකියද?

iv. ලබාගත් ක්‍රීඩා භාණ්ඩ අමාත්‍යාංශයේ ගබඩා කර තිබේද?

ඇ. 2013/2014 වසර සඳහා වියදම් පිළිබඳ වාර්තාවක්, පළාත් ක්‍රීඩා විද්‍යායතනය සඳහා යොදන ලද මුදල් පිළිබඳ සවිස්තර වාර්තාවක් තිබේද?

ඈ. මෙම අමාත්‍යාංශයේ 6/2006 රාජ්‍ය වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමට අනුව ලබා දී ඇති චක්‍රලේඛයේ නිර්දේශයන්ට අනුගතද? ඒ සඳහා ලබා දී ඇති නිර්දේශ අනුව ලබා දී ඇති වැටුප් හා වැටුප් තලවල පිහිටුවීම පිළිබඳව සවිස්තර වාර්තා ඉදිරිපත් කිරීමට හැකිද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අ. i.

| | |
|---|---|
| ක්‍රීඩා අධ්‍යක්ෂ | 01 |
| ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී | 01 |
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී | 05 |
| ක්‍රීඩා පුහුණුකරු | 16 |
| ක්‍රීඩා නිලධාරී | 43 |

ඉහත සඳහන් තනතුරු අතුරින් ක්‍රීඩා අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී, දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී හා ක්‍රීඩා පුහුණුකරු තනතුරු සඳහා පත්වීම් ලබා දෙනුයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි. බස්නාහිර පළාතට අදාළව ක්‍රීඩා නිලධාරීන් බඳවා ගැනීමේ බලතල 2014.04.24 දින සිට අමාත්‍යාංශ ලේකම් වෙත පැවරී ඇත. කෙසේ වෙතත් මේ වන තෙක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබා දී ඇති ක්‍රීඩා නිලධාරී පත්වීම්වලට අමතරව අමාත්‍යාංශ ලේකම් විසින් පත්වීම් ලබා දී නොමැත.

ii. ඉහත දක්වා ඇති තනතුරු අතුරින් ක්‍රීඩා නිලධාරීන් හැර අනෙකුත් පත්වීම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත ලබා දෙනු ලබන පත්වීම් වන අතර ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී, දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී, ක්‍රීඩා පුහුණුකරු, ක්‍රීඩා නිලධාරී රාජකාරී ආවරණ පත්වීම් ලබා දීම පමණක් අමාත්‍යාංශ ලේකම් මගින් සිදු කරනු ඇත.

iii. ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ තනතුරක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කොට ඇත.

ආ. i. අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් සීමා සහිත බස්නාහිර පළාත් පාරිභෝගික හා අලෙවි සමුපකාර සමිති මහා සංගමයෙන් මිලදී ගැනීම් සිදු කර ඇත.

ii. පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පළාතේ ක්‍රීඩා භාණ්ඩ සපයන ආයතනය ලෙස වෙස්කෝ ආයතනය තෝරා ගැනීමේදී භාණ්ඩ වල ප්‍රතිමිතිය පිළිබඳව සෑහීමකට පත්වී ඇති අතර භාණ්ඩ භාරගත් නිලධාරීන් හා පුද්ගලයන් ඒවා නිසි පරිදි ලැබී ඇති බවට සෑහීමකට පත් වී ඇත.

iii. නියමිත පිරිවිතරයන්ට පරිබාහිරව ක්‍රීඩා භාණ්ඩ ලබාගෙන නොමැති බැවින් එවැනි වාර්තාවක් ලබා දිය නොහැක.

iv. මේ වනතෙක් භාර නොගත් ක්‍රීඩා භාණ්ඩ අමාත්‍යාංශයේ නිසි පරිදි ගබඩා කර ඇත.

ඇ. ඔව්.

ඔබතුමා ඉල්ලලා තිබෙන්නේ වියදම් මාලාවක්. ලොකු වියදම් මාලාවක් තියෙනවා. ඒක එකින් එක කියන්නද? ඒක සභාවට ඉදිරිපත් කරන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සභාවට ඉදිරිපත් කරනවා.

### 2013/2014 වියදම් වාර්තාව

| වියදම් විස්තරය | 2013 | 2014 |
|---|---|---|
| වැටුප් හා වේතන | 11,632,362.33 | 10,438,982.74 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 149,358.60 | 148,372.33 |
| වෙනත් දීමනා | 6,354,687.92 | 7,716,954.91 |
| ගමන් වියදම් | 1,075,509.59 | 1,088,677.69 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 298,948.41 | 302,800.20 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 320,490.00 | 516,000.00 |
| නිල ඇඳුම් | 4,000.00 | 12,000.00 |
| වාහන නඩත්තු වියදම් | 344,748.27 | 348,986.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු | 16,516.00 | 3,600.00 |
| තැපැල් හා විදුලි සංදේශ සේවා | 114,848.81 | 119,909.15 |
| විදුලිය හා ජලය | - | 48,471.34 |
| වරිපනම් බදු | - | 10,656.00 |
| වෙනත් සේවා | 327,985.00 | 617,800.00 |
| ක්‍රීඩා විද්‍යායතනය හා ශ්‍රී බෝධි ක්‍රීඩාංගනය | 5,439,796.64 | 4,954,763.39 |
| ක්‍රීඩා උපහාර උළෙල/ක්‍රීඩකයන් ගෙවීම් | - | 25,156,248.51 |
| දේපළ ණය පොලිය | 477,610.22 | - |
| වෙනත් | 20,293,184.20 | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | - | 199,665.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 195,000.00 | 496,300.00 |
| පළාත් නිශ්චිත (ගොඩනැගිලි හා ඉදිකිරීම්) | | 4,686,329.07 |
| පළාත් නිශ්චිත (පුහුණු ධාරිතා සංවර්ධනය) | | 756,463.00 |
| **එකතුව** | **47,045,045.99** | **57,622,979.33** |

### පොල්වත්ත ක්‍රීඩා විද්‍යායතනයේ වියදම්

| වියදම් විස්තරය | 2013 | 2014 |
|---|---|---|
| පුහුණු පාඨමාලා සඳහා | 4,310,107.80 | 1,022,444.20 |
| ජලය, විදුලිය, දුරකථන | 161,458.53 | 85,898.58 |
| ඉන්ධන | 7,440.00 | - |
| ආරක්ෂක සේවා | 654,296.20 | 458,690.72 |
| උපකරණ, යන්ත්‍ර, ගොඩනැගිලි නඩත්තු | 82,960.00 | 106,350.00 |
| වාහන අළුත්වැඩියා | 51,361.00 | 209,906.00 |
| වැටුප් හා වේතන | 149,550.61 | 101.314.00 |
| වෙනත් | 22,622.50 | 4,500.00 |
| පුවත්පත් | | 14,000.00 |
| සුළු මුදල් | | 41,064.00 |
| **එකතුව** | **5,439,796.64** | **2,044,167.50** |

ඇ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 නිර්දේශයන්ට අනුව වැටුප් ලබා දී ඇත. අදාළ නිලධාරීන් වැටුපේ පිහිටුවීමේදී ඔවුන්ගේ කාර්යක්ෂමතා සමත්වීම් ආදිය මත පිහිටුවා ඇති වැටුප් පියවරයන් වෙනස්විය හැකි අතර අදාළ නිලධාරීන් පිහිටුවා ඇති වැටුප් පරිමාණයන් පහත දැක්වේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව පිහිටුවා ඇති වැටුප් පියවර

01. ක්‍රීඩා නිලධාරී
වැටුප් කේත අංකය - MN-1-2006
වැටුප් පරිමාණය - රු. 12,920-120x10-140x11-210x10-290x10-20660

02. ක්‍රීඩා පුහුණුකරු
වැටුප් කේත අංකය - MN-3-2006
වැටුප් පරිමාණය - රු. 14,510-150x4-205x6-290x20-320x11-25660

03. දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී
වැටුප් කේත අංකය - MN-3-2006
වැටුප් පරිමාණය - රු. 14,510-150x4-205x6-290x20-320x11-25660

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු සභාපතිතුමනි, අමාත්‍යවරයෙකුගෙන් අපි ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ අමාත්‍යවරයා ඒ ප්‍රශ්නය සූදානම් කරගෙන ඇවිල්ලා තිබෙනවා. හැබැයි අපට හැකියාවක් තිබෙනවා නම් ඒ සූදානම් කරගෙන ආපු පිළිතුර අඩුම තරමින් ඒ සභාගත කිරීමට ප්‍රථම අදාළ මන්ත්‍රීවරයාට ලැබෙන්න සලස්වන්න. එහෙම වුණොත් ගරු සභාපතිතුමනි, අපට අතුරු ප්‍රශ්නයක් ඇසීමට හැකියාව ලැබෙනවා. මේ ආදර්ශය කොළඹ නගර සභාවේ තිබෙනවා. ගරු සභාපතිතුමනි, කොළඹ නගර සභාවේ අපි ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ ඒ පිළිතුර සූදානම් නම් සෑම මන්ත්‍රීවරයෙකුගේම මේසය මත එදා උදේ සූදානම් කරන ලද පිළිතුර තියෙනවා. එතකොට අපට හැකියාව තිබෙනවා - දැන් මේ රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. ලොකු වියදම් ලේඛනයක් තිබෙනවා කියලා ගරු ඇමැතිතුමා කිව්වා. නමුත් ඒ වියදම් ලේඛනය මත පදනම්ව අපට අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා නම් ඒ ප්‍රශ්නය ඇසීමට අපට අවස්ථාව අහිමි වෙලා යනවා.

දැන් මීට කලින් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා දීර්ඝ ප්‍රශ්න මාලාවක් අහලා තිබෙනවා. නමුත් එතුමාට අතුරු ප්‍රශ්නයක් ගොනු කර ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාට හැකියාවක් තිබෙනවා නම් මෙය සභා කටයුතු කාරක සභාවට යොමු කරලා මෙන්න මේ සාධාරණය ඉෂ්ට කරන්න. අතුරු ප්‍රශ්න ඇසීමේදී අදාළ මන්ත්‍රීවරයාට හරිම පහසුවක් වෙනවා. මම හිතන්නේ ඒකේ කිසි අපහසුතාවයක් නැහැ. සූදානම් කරගෙන ආපු පිළිතුරු මන්ත්‍රීවරයාට ලැබීමට සලස්වන එකයි තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි හෙට පැවැත්වෙන සභා කටයුතු කාරක සභාවේදී එය සාකච්ඡා කරනවා. ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමාටත් අනිවාර්යයෙන්ම සහභාගී වෙන්න කියන්න.

***න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය විදුලිබල හා බලශක්ති ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Lakshaman Nipuna Arachchi, member, under item No. 04 of the Agenda, was presented to the Hon. Minister of Electricity and Power and as two weeks time was asked for, it was ordered by Hon. Chairman that the question be referred to the next Council sitting.*

## මීගමුව ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රාථමික විදුහල : විදුහල්පතිවරයා
PANNANANDA PRIMARY SCHOOL, NEGOMBO: PRINCIPAL

**05.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/08)**

අ. මීගමුව අධ්‍යාපන කලාපයට අයත් ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රාථමික විදුහලේ විදුහල්පතිවරයාට එම පාසලට අදාළ සුදුසුකම් තිබේද?

ආ. තිබේ නම් එම සුදුසුකම් ලබා ගත්තේ කුමන වර්ෂයේ පැවැති විදුහල්පති විභාගයෙන්ද?

ඇ. එහිදී ඔහු ලැබූ ලකුණු ප්‍රමාණය කවරේද?

ඈ. ඔහු සහ තවත් ගුරුවරුන් දෙදෙනෙකු දරුවන්ගේ මානසිකත්වය බිඳ වැටෙන අයුරින් පාසල තුළ කටයුතු කරන බවට ඔබතුමා වෙත පැමිණිලි ලැබී තිබේද?

ඉ. එසේ නම් ඒ සඳහා ඔබතුමා ගෙන ඇති පියවර කුමක්ද?

ඊ. එසේ නොමැති නම් ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කරන්නේද?

උ. මෙම විදුහල්පතිවරයා විසින් චක්‍ර ලේඛවලට පටහැනි ලෙස මුදල් එකතු කිරීම පිළිබඳව විමර්ශනයක් සිදු කරන්නේද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On Behalf of Chief Minister]

අ. ඔව්. විදුහල්පති 2 - II ශ්‍රේණිය

ආ. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : 212/2010(F/R) දරන 2012.01.26 දිනැති නඩු තීන්දුව හා අංක 1086/26 දරන ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8 හා 9 වෙනි වගන්ති ප්‍රකාරව 2006 වර්ෂයේ පවත්වන ලද සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගෙන ඇත.

ඇ. අධ්‍යාපන ලේකම්ගේ අංක : ඊඩී/04/60/07/01/05/01 නඩු - 2012 උප ගොනුව 04 හා 2014.09.19 දිනැති ලිපියෙන් අධ්‍යාපන ලේකම් විසින් පත්වීම ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගෙන් විමසිය යුතුය.

ඈ. පැමිණිලි ලැබී නැත.

ඉ. අදාළ නොවේ.

ඊ. පැමිණිලි කිසිවක් ලැබී නොමැති නිසා විමර්ශනයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

උ. චක්‍රලේඛවලට පටහැනිව මුදල් එකතු කිරීම පිළිබඳව පැමිණිලි කිසිවක් ලැබී නැත. එසේ වෙතත් මෙම විමසීම අනුව විමර්ශනයක් සිදු කිරීමට අදාළ නිලධාරීන් පත් කිරීමට කටයුතු කරනු ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. එම අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දීමට එතුමාට හැකියාව තිබෙනවාද? මේක ගරු ප්‍රධාන ඇමැතිතුමාට අදාළ ප්‍රශ්නයක්.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On Behalf of Chief Minister]

ඔබතුමා ප්‍රශ්නය අහන්න, අපි ඒක ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරලා ඊළඟ සභාවේදී -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ, එහෙම නම් මට අවස්ථාව තියාගන්න ඕනෑ ගරු ප්‍රධාන ඇමැතිතුමා ආවට පස්සේ මේ අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් ප්‍රශ්න අහන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා ආවට පස්සේ උත්තර දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ සම්බන්ධයෙන් පසුගිය සභා වාරයේදී මම ගරු ප්‍රධාන ඇමැතිතුමාව පෞද්ගලිකව මුණ ගැහිලා එතුමාට, ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්තුමාට දෙමව්පියන් පිරිසක් විසින් මේ චෝදනා සම්බන්ධව ඉරිපත් කරන ලද ලිපියක් ලබා දුන්නා. එතකොට මට දැනගන්න ඕනෑ. මොහු කියනවා, මේ සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් ලැබිලා නැහැයි කියලා. ඇත්තටම මා විසින්ම මේ පැමිණිල්ල ලබා දීලා තිබෙනවා. එතකොට ඒ සම්බන්ධයෙන් මේ වනවිට අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය කුමක්ද? මේ ලිපියට අනුව අරගෙන තිබෙන ක්‍රියා මාර්ගයක කුමක්ද?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, පැහැදිලිවම මම උත්තර දීලා තිබෙන්නේ දැනට මේ පිළිබඳව විමර්ශනයක් කිරීමට ලිපියක් ලැබී නොමැත. ඔබතුමා ළඟ ලිපියේ කොපියක් තිබෙනවා නම්, අපි දැනට නිලධාරීන් පත් කරලා තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමැතිතුමා පසුගිය සභා වාරයේදී මම ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරියේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් දයා සෙනරත් මැතිතුමාට මේ ලිපිය ලබා දුන්නා. එහිදී ඔහුගේ පැත්තෙන් ප්‍රකාශ කළා, මේ සම්බන්ධයෙන් - ගරු ප්‍රධාන ඇමැතිතුමාත් පිළිගත්තා මේ පාසලේ ප්‍රශ්නයක් තිබෙන බවට. ඒ නිසා මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන බව.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On Behalf of Chief Minister]

ලිපිය දීලා තිබෙනවා නම් ගැටළුවක් නැහැ ගරු සභාපතිතුමනි. මේ උත්තරේ පැහැදිලිව කියලා තිබෙනවා, අදාළ නිලධාරීන් පත් කිරීමට කටයුතු යොදා ඇත කියන එක. ඒ අනුව ඒ නිලධාරීන්ට කියන්නම් මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා සති දෙකක් ඇතුළත වාර්තාවක් දෙන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට දැනගන්න ඕනෑ වෙලා තිබෙන්නේ, මේක ලබා දීලාත් දැන් සති දෙකක් වෙනවා. මේ විදුහල්පතිවරයාගේ ක්‍රියා කලාපය නිසා මේ පාසලේ බරපතළ ගැටළුවක් තිබෙනවා. 5 ශ්‍රේණියේ පුංචි දරුවන්ට කියනවා, ඔයගොල්ලෝ පාසලෙන් ඉවත් වෙලා යන්න කියලා. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. ඒක ගරු ප්‍රධාන ඇමැතිතුමාත් පිළිගෙන තිබෙනවා. ඒ නිසා තමයි මට දැන ගන්න ඕනෑ - දැන් සති දෙකක් වෙනවා. තවදුරටත් කල් ඇරිය යුතු දෙයක් නොවෙයි. කඩිනමින් කළ යුතු දෙයක්.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, අද අධ්‍යාපන ලේකම්තුමාට පැහැදිලිව අපි උපදෙස් දෙන්නම් මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. බොහොම ස්තූතියි.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මම අද කථා කරන්න බලාපොරොත්තු වුණේ, වර්තමානයට දේශපාලනය ඇවිල්ලා තිබෙන විධිය. එතැනදී වර්තමානය ගැන කථා කරන්න බැහැ අපට අතීතය ගැන පොඩි ආවර්ජනයක් කරන්නේ නැතුව. අපට මතක තිබෙන සීමාවේ ගත්තොත් එහෙම 1970 සමගි පෙරමුණු ආණ්ඩුව බලයට පත් වුණා. මම හිතන්නේ, බලයට පත් වෙලා ආණ්ඩුවට මාස 06 ක්වත් යන්න හම්බ වුණේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ රටේ කැරැල්ලක් ඇති කරලා 1971 අප්‍රේල් 05 වැනිදා රට වටේම භීෂණය ඇති කරලා

ඒ ආණ්ඩුව අස්ථාවර කළා. බෝක්කු කැඩුවා. පාලම් කැඩුවා. මිනී මැරුවා. ගිනි තිබ්බා. බස් ගිනි තිබ්බා. ඒ ආණ්ඩුව දුවන්න බැරුව අවුරුදු 20 කට ඒ ආණ්ඩුව පස්සට ගියා. ජනතා විමුක්ති පෙරමුණ එදා මේ රට විනාශ කිරීමේ පළමුවැනි වෙඩි මුරය තියන්න පටන් ගත්තා. මම හිතන්නේ එදා සිරිමාවෝ මැතිනිය ඒ කැරල්ල මර්දනය කරන්න ගියාම - මනම්පේරිය වාගේ තරුණියෝ මැරෙන්න ඇති. ඒවා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

2004 සන්ධානය ගහනකොට ඒක අමතක වුණාද දන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

77 ජේ.ආර්. ජයවර්ධන මහත්තයා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

2004 සන්ධානය හදනකොට ඒක අමතක වුණාද දන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

5/6 ක බලයක් ගත්තේ - ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට 5/6 ක බලයක් ගන්න මුල් අඩිතාලම දාලා දුන්නේ ජනතා විමුක්ති පෙරමුණ. ඊළඟට ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මොනවා වුණත්, විවෘත ආර්ථික ක්‍රමය රටට ගෙනැල්ලා ඒකේ අඩුපාඩුවක් තිබුණත් අපි කටුනායක ජීවත් වෙන්නේ, කටුනායක වෙළඳ කලාප ඇති කරලා අපේ ප්‍රදේශයේ අයට සාධාරණව ජීවත් වෙන්න හොඳ ක්‍රමයක් ඒ තුළින් ඇති වුණා. රටේ විශාල සංවර්ධනයක් ඇති වුණා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හදිසියේ ජනතා විමුක්ති පෙරමුණ මතක් වුණේ මොකද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

89 දී මේ ජනතා විමුක්ති පෙරමුණ භීෂණය පටන් ගත්තා. ලක්ෂ ගණනක් තරුණයෝ මැරුවා. UNP අයට ඉන්න දුන්නේ නැහැ. ශ්‍රී ලංකා පක්ෂයේ අයට ඉන්න දුන්නේ නැහැ. මම හිතන්නේ ප්‍රේමදාස මහත්මයාට පිං සිද්ධ වෙන්න එදා සමූල ඝාතනය කළේ නැහැ. අපරාදේ එදා සමූල ඝාතන කළා නම් එහෙම ජනතා විමුක්ති පෙරමුණ අද මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වර්තමාන දේශපාලන තත්ත්වය ගැන කථා කරන්න මගෙන් ඉල්ලීම් කරලා තියෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. අතීතයෙන් එන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ තරම් ඈතට යන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මේ ආකාරයෙන් ඇවිල්ලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වර්තමාන දේශපාලනය ගැන කථා කරන්න..

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එදා ජනතා විමුක්ති පෙරමුණ දේශපාලනයේ රට ආපස්සට ඇදගෙන ගියා. මොන ක්‍රමයෙන් හරි අද ජාතික විධායක සභාවේ අනුර කුමාර දිසානායක මහත්මයා ඉන්නවා. මම ඔබතුමා හරහා අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට කියනවා කථා කරලා නායකතුමන්ලාට කියන්න මේ දණ්ඩ නීති සංග්‍රහයේ පළමුවැනි වගන්තිය සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයට. ඊට පස්සේ තමයි හොරකම, මංකොල්ලකෑම, දූෂණය, වංචාව තියෙන්නේ. එහෙමනම් වර්තමාන ජනාධිපතිතුමාට කියන්න විධායක සභාවේදී යෝජනාවක් ගෙන්න කියලා, කොමිසමක් පත් කරලා අර 60,000 ක් තරුණයෝ මරපුවා ගැන හොයන්න කියන එකට. ඊළඟට ජනතා විමුක්ති පෙරමුණ එදා පළාත් සභා ක්‍රමය ගේනකොට විශ්ව විද්‍යාල

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

අවුස්සලා තරුණයෝ මැරෙන්න ඇරියා. නමුත් මෝදි මහත්මයා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ 13 plus දෙන්න කියනකොට ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ බලු කුක්කෝ වාගේ පාර්ලිමේන්තුවෙන් නැගිටලා ගියේ නැහැ. මම කියන්නේ, ජනතා විමුක්ති පෙරමුණට හැමදාම කරන්නේ ධනපති ආණ්ඩු පවතින්න සල්ලි අරගෙන කඩේ යන එක. ජනතා විමුක්ති පෙරමුණ අදත් කරන්නේ ඒකම තමයි. රනිල් මහත්මයා එක්ක කථා කරලා ලැහැස්ති වෙලා එනවා. මෙයා යෝජනාව කියනවා. අරයා උත්තර දෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔය කඩේ යන ක්‍රමය නවත්වලා කියන්න 89 මිනී මරපුවාට, තමන්ගේ සහෝදරයෝත් මැරුණු ඒවාට කොමිසමක් පත් කරන්න කියලා. මට කියන්න බලන්න ජනතා විමුක්ති පෙරමුණේ මැරුණු සහෝදරවරුන්ගේ බිරින්දෑවරුන්ට, ළමයින්ට පාසල් පොතක් අරගෙන දුන්නාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔයාද අරගෙන දුන්නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපේ ගමේත් මරුණා. එක පාසල් පොතක් අරගෙන දුන්නේ නැහැ. දුවන්නේ බොරුවෙන්. වංචාවෙන්. මම හිතන්නේ ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත්, එක්සත් ජාතික පක්ෂයටත් ආණ්ඩුව ගෙනියන්න දුන්නේ නැහැ. ආණ්ඩුව ඇදලා දැම්මේ, රට විනාශ කළේ ජනතා විමුක්ති පෙරමුණ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ගෞරවනීය සභාවට නිග්‍රහ කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමන්ලා වාඩි වෙන්න. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, ලී බඩු කර්මාන්තයට අදාළව ජීවනෝපාය කර ගත් විශේෂයෙන්ම මොරටුවේ ලී බඩු කර්මාන්තයේ නියැලෙන්නන් මේ මොහොත වනවිට තම කර්මාන්තය පැත්තෙන් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව මෙම සභාවේත්, මධ්‍යම ආණ්ඩුවේත් අවධානයට යොමු කළ යුතුව ඇත. කලක් මහත් වූ අභිමානවත් ආර්ථික ජීවිතයකට හිමිකම් පෑ ලී බඩු කර්මාන්තය අද මේ වනවිට බරපතළ අර්බුදයකට ලක් වී තිබෙනවා. වඩු මඩු වැසී යමින් ශිල්පීන් හැටියට කර කියාගත නොහැකි මිනිසුන් බවට පත් වෙමින්, භාණ්ඩ වෙළඳාමේ නියුතු වූවන් තම නිවාස, යාන වාහන විකුණමින් එදා දිනයේ ජීවත් වන්නේ කෙලෙසද යන තත්ත්වයට පත් වෙමින් අද ඔවුන් අසරණ තත්ත්වයට ඇද වැටී තිබෙනවා. මෙය ඡන්දයකදී මනාපයක් ලබා ගැනීමට කරන වඩු උපකරණ කිහිපයක් බෙදා දීමෙන් ගොඩ ගත හැකි තත්ත්වයක් නොවෙයි. විවෘත ආර්ථික ක්‍රමයේ අත් විඳින ප්‍රතිවිපාක ලෙස ලී භාණ්ඩ වෙනුවට ආනයනය කරන ප්ලාස්ටික් භාණ්ඩ වෙළඳ පොළොට ආදේශවීමත් සමග මෙම කර්මාන්තයේ වැටීම ආරම්භ වුණා. මේ මොහොත වනවිට අප රට ආනයනය කරන ප්ලාස්ටික් භාණ්ඩ ගොඩ ගසන රටක් බවට පත් වී තිබෙනවා. එසේම වටිනා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි ආර්ථිකයක් තුළ තම නිෂ්පාදනය විකුණා ගැනීමට නොහැකි තත්ත්වයක් තුළ ලී බඩු කර්මාන්තය අඩපණ වී තිබෙනවා. එසේම පාරම්පරික කර්මාන්තයක් ලෙස හොඳ නිෂ්පාදන බිහි කරනවා වෙනුවට ලී ජාවාරම්කරුවන්ට හොරෙන් ගස් කපා නිමි භාණ්ඩ සැකසීමේ අයිතිය තමන් සතු කර ගැනීමට ලැබී ඇති ඉඩකඩ හරහා ඒ ඒ ප්‍රදේශවල ජාවාරම්කරුවන්ගේ ග්‍රහණයට ලී බඩු කර්මාන්තය ගොදුරු වී තිබෙනවා. විශේෂයෙන්ම මොරටු පුරවරයේ ලී බඩු කර්මාන්තකරුවන්ට නීත්‍යානුකූල ලෙස අධික මිලට දැව ලබා කරන නිෂ්පාදනයේ පිරිවැය වැඩි වී තිබෙන අතරතුර ජාවාරම්කාර මුදලාලිලාට හොර දැව මගින් අධික ලාභ ලබා ගැනීමට ඉඩකඩ සැකසී තිබෙනවා. බලපත්‍ර නොමැතිව නිමි භාණ්ඩ ප්‍රවාහනයට ලැබී ඇති අවසරය හොර ජාවාරම්කාර පනින රිලවුන්ට ඉනි මං බැඳීමක් බවට පත් වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුව යටතේ අදාළ ක්ෂේත්‍රවලට වග කියන අමාත්‍යාංශ තිබෙනවා. සීනිවලටත් ඇමැතිවරු බිහි වුණා. පළාත් සභාවටත් කර්මාන්ත යනුවෙන් පළාත් අමාත්‍යාංශයක් තිබෙනවා. නමුත් වඩු කර්මාන්තය සඳහා වග කියන අමාත්‍යාංශයක් හෝ වග කිව යුතු ආයතනයක් නැහැ. අද එම කර්මාන්තයේ ගැටළුවලට විසඳුම් දීම වෙනුවෙන් වග කිව යුතු ආයතනයක් හොයා

ගන්න නැහැ. එහෙයින් පළාත් සභාවක් ලෙසත්, රටක් හැටියට මධ්‍යම ආණ්ඩුවත් ලී බඩු කර්මාන්තය රැක ගැනීම සඳහාත්, එකී කර්මාන්තයේ නියැලෙන්නන් හා ඔවුනොවුන්ගෙන් යැපෙන්නන් මුහුණ දෙන ගැටළු සඳහාත් විසඳුම් ලබා දීම වෙනුවෙන් වහා මැදිහත් වී වඩු කර්මාන්තය රටේ සංවර්ධනයේ කොටසක් ලෙස නියාමනය කිරීමට පියවර ගත යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මොරටු පුරවරයේ අද පත්ව තිබෙන තත්ත්වයෙන් එකී ජනතාව ගලවා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ කර්මාන්ත විෂයය භාර ඇමැතිවරයාට මහ හැරිය නොහැකි වගකීමක් තිබෙන බවට මේ සභාවට අවධාරණය කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මේ සභාවේ තැන් තැන්වල සාකච්ඡා කරන්න එපා. මොකක්ද මේ සභාව? විහිළුවට ලක් කරන්න එපා. අතන එක සාකච්ඡාවක්. මෙතැන එක සාකච්ඡාවක්. විහිළුවට ලක් කරන්න එපා. සාකච්ඡා ගොඩයි. සභා ගොඩයි. දේශපාලන ප්‍රශ්න තිබුණාට මේ සභාවට පොඩ්ඩක් අවධානය යොමු කරන්න. ප්‍රශ්න තියෙනවා නම් ඒවා සාකච්ඡා කරන්න, කරුණාකරලා මේ සභා ගර්භයෙන් එළියට යන්න.

මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතිය පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ මේ සභාවේ වරින් වර, වරින් වර ප්‍රශ්න ගණනාවක් අදාළ ඇමැතිවරුන්ගෙන් ඇහුවා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා සමූපකාර ඇමැතිවරයා හැටියට ඉඳිද්දී අපි වරින් වර මේ සමූපකාර සමිතියේ තීන්දු තීරණ පිළිබඳවත්, ක්‍රියා කලාපය පිළිබඳවත් ප්‍රශ්න නැඟුවා. ඉන් අනතුරුව වර්තමාන අමාත්‍ය නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා අමාත්‍ය ධූරයට පත් වුණාට පස්සෙත් මේ සමූපකාර සමිතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අපි දිගින් දිගට ප්‍රශ්න නැඟුවා. මට මතක් වෙනවා, ගිය සභා වාරයේ විශේෂ ප්‍රකාශයක් විධියට මම පැහැදිලි කළා. මේ සමූපකාර කොමසාරිස්වරයා, අදාළ ඇමැතිවරු තමන්ගේ හෘදය සාක්ෂියට අනුව දන්නවා මේ යන ක්‍රියා පිළිවෙත වැරැදියි කියලා. නමුත් සමහර පළාත් සභාවේ අමාත්‍යවරුන්ට ඉහළින් ගිය බලයක් නිසා මේ වැඩ කටයුත්ත කර ගන්න බැරි වෙලා දීර්ඝ කාලයක් මේ ප්‍රශ්නය ඇදුනා. ඒ ඇදීම තුළම මේ සභාපතිවරයා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයට දිගින් දිගට වැරැදි කරන්න අවශ්‍ය අවස්ථාව, අවකාශ ලබලා දුන්නා. ඉන් අනතුරුව තමයි මම මේ සම්බන්ධව දීර්ඝ විස්තරයක් කොමසාරිස්වරයාට, අදාළ අමාත්‍යවරුන්ට ලබලා දුන්නත් කිසි දෙයක් වුණේ නැත්තේ. ඉන් අනතුරුව මට මතකයි වර්තමාන ගරු අමාත්‍ය ගාමිණී තිලකසිරි මැතිතුමා රන් බඩු විකිණීමේදී ඇති වුණු අක්‍රමිකතාවයක් පිළිබඳව මේ සභාවේ ප්‍රශ්න කළා විතරක් නොවෙයි. දිගින් දිගට විද්‍යුත් මාධ්‍යවලත්, ඒ වාගේම මුද්‍රිත මාධ්‍යවලත් මේ කාරණය පිළිබඳව සාකච්ඡාවට ලක් කළා. හැබැයි අපි සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. හොඳ දෙයක් කළාම ඒ හොඳ දේට ගෞරවය ලබලා දෙන්න ඕනෑ. මේ පිළිබඳව අපි කරපු පැමිණිලි, මේ පිළිබඳව අප දක්වන ලද විමර්ශන සැලකිල්ලට අරගෙන වර්තමාන ගරු අමාත්‍ය නිමල් ලාන්සා මැතිතුමාත්, එතැනින් ගියාම සමූපකාර කොමසාරිස්වරයාත් මේ සමූපකාර සභාපතිවරයා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය අපි ඉදිරිපත් කරලා තිබෙන චෝදනා හය මාසය ඇතුළත විභාග කරලා ඒකට පරීක්ෂණයක් කරලා තීන්දුවක් දෙන තත්ත්වයට පත් කරලා මේ වන කොට සමූපකාර කොමසාරිස්වරයා යටතට බලය පවරාගෙන තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

හොරු ටික ඇතුළේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඒකත් ඇමැතිතුමාගේ, කොමසාරිස්වරයාගේ බලය.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

හොරු ටික ඇතුළේ තියාගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විතරයි නවත්වලා තියෙන්නේ. හොරු ටික -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇතුළේ හොරු ඉන්නවා නම් සභාපති මෙපමණ කල් මොනවාද කළේ? අන්තිමට සේවකයෝ

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

60% ක් 65% ක් එළියට බැස්සා. ඒ තත්ත්වයට මේක වර්ධනය වුණා. සමූපකාර මහ සභාව පවත්වන්න යන්න තීන්දු කළේ බදුල්ලේ. ලක්ෂ 5 ක් 6 ක් වියදම් කරලා. මේවා කොමසාරිස්වරයාට කිව්වාම කොමසාරිස්වරයා නැවැත්තුවා. අයථා ගණුදෙනු අනන්ත අප්‍රමාණ වෙලා තිබෙනවා. ඒ නිසා සමූපකාර ව්‍යාපාරය ආරක්ෂා කර ගන්න නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාත්, සමූපකාර කොමසාරිස්වරයාත් ගත්තු තීන්දුවට අපේ ගෞරවයත්, ස්තුතියත්, ප්‍රසාදයත් මේ අවස්ථාවේදී පළ කරනවා කියන ටික විතරක් මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. හැබැයි, මෙතැන එක කාරණයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. හොරු අල්ලන්න නිතරම කථා කරන ජනතා විමුක්ති පෙරමුණේ හෝමාගම ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා, එදා සේවකයෝ එළියේ පිකටිං කරද්දී ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා සභාපතිවරයාගේ කාමරය ඇතුළට වෙලා හිටියා. හේතුව තමයි සභාපතිවරයා ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරු ගණනාවක් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දැන් අනුරකුමාර දිසානායක මැතිතුමා අගමැතිතුමාගේ කාමරේ ඉන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඒක ඇතුළේ ඉඳීම අපට පුගුප්සාජනක කාරණයක් කියන එක මේ අවස්ථාවේදී මතක් කරමින් නැවත වතාවක් මේ ප්‍රකාශය කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ වරප්‍රසාද කඩ වීමක් සම්බන්ධයෙන්. මොකද, පසුගිය සමූපකාර උපදේශක කාරක සභා රැස්වීමේදී හෝමාගම සමූපකාරය පිළිබඳව පරීක්ෂණයක් කරලා තීරණයක් ගන්නවා නම්, ඒ තීරණය පිළිබඳව සියලු මහජන නියෝජිතයින් දැනුවත් කරනවා කියලා කිව්වා. නමුත් පසුගිය සතියේ සමූපකාර කොමසාරිස්වරයාට ඕනෑ විධියට, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ඉල්ලීම අනුව සමූපකාරය අත්හිටුවලා තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, එතුමාට -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මගේ වරප්‍රසාද කඩ වීමක්. කඩ වුණු වරප්‍රසාදය තමයි මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලාට විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පොඩ්ඩක් ඉන්න. මගේ වරප්‍රසාද කඩ වුණා. මට උපදේශක කාරක සභාවේදී ගත්තු තීරණය පිළිබඳව දැනුවත් වීමට. පොඩ්ඩක් ඉන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

කොහේද වරප්‍රසාද කඩ වෙලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ, බැහැ. දෙන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මගේ වරප්‍රසාද කඩ වුණේ පසුගිය උපදේශක කාරක සභා රැස්වීමේදී දැනුවත් කරලා තීන්දුවක් ගන්නවා කියලා කොමසාරිස්තුමා කිව්වා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඔක පරිපාලන -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පරිපාලන නොවෙයි. වරප්‍රසාදයක්. ඒ අනුව කොමසාරිස්තුමා කිසිම තීරණයක් නැතුව සමූපකාරය අත්හිටෙව්වා. හැබැයි, අත්හිටෙව්වේ මේකේ හොරකම් කරපු හොරු ටික සමූපකාරය ඇතුළේ තියලා තමයි ඕක අත්හිටෙව්වේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

එතුමාගේ වරප්‍රසාද කඩ වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ නමක් කිව්වේ නැහැ. ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සාධාරණ පරීක්ෂණයක් කරනවා නම් කොමසාරිස්තුමාට තිබෙන අයිතියක්, ඒකට සාධාරණය ඉෂ්ට කිරීම. ඒක නිසා අපේ වරප්‍රසාද කඩ වුණේ, අපට කියලා තීරණයක් ගන්න ඕනෑ. දැනුවත් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ නමක් එතුමා සඳහන් කළේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

මේවා හැන්සාඩ් එකේ -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මගේ වරප්‍රසාදය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

එතුමාගේ වරප්‍රසාදයක් කැඩුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා නමක් කිව්වේ නැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

දැනුවත් කරනවා කියලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මෙතුමා කියපු කථාව නොවෙයි. සමූපකාර ඇමැතිතුමා කියපු දේ ගැන මම කියන්නේ. අපට අවස්ථාව දෙනවා කියලා කොමසාරිස්තුමා කළේ, අත්තනෝමතික ක්‍රියාවක්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

වැඩේ වෙලා තිබෙන්නේ එතුමාගේ නැන්දාගේ පුතාත් ඉන්නවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මගේ නැන්දාගේ පුතාත් ඉන්නවා. සමූපකාරයේ ඕනෑ තරම් කට්ටිය ඉන්නවා. බලය තියෙන්නේ අපේ අතේ. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. කොමසාරිස්තුමා තීරණය ගත්තේ පක්ෂපාතීව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා මේකයි. පෞද්ගලික පැහැදිලි කිරීම් සම්බන්ධව විවාදවලට යන්න දෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් සිද්ධ වුණේ නැහැ. ඔබතුමාගේ නමක්වත් එතුමා කිව්වේ නැහැ.

ජගත් අංගගේ ගරු ඇමැතිතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා අවස්ථාව. ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඇමැති කාලේ සෞඛ්‍ය ගැන -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඇමැති කාලේ ඇමැතිකම් කළා. දැන් මේක කරන්නේ. හරි අමාරුයි නේ? නැඟිට්ටාම ගාය හැදෙනවා. කසනවා වාගේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, නිශ්ශබ්ද කරලා දෙන්න. ඊට පස්සේ මට කාලේ දෙන්න. කථා කරන්න දෙන්නේ නැහැ. කෑගහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා දැන් සැරයි. හරිම සැරයි. එතුමාට කථා කරන්න දෙන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ජාතියක සතු උත්තරීතරම දායාදය, වස්තුව දරුවන් හැටියට තමයි සමස්ත ලෝකයේම ජනතාව කථා කරන්නේ. ශ්‍රී ලංකාවේ ජනතාව අතරින් 27% ක් මේ රටේ බස්නාහිර පළාතේ ජීවත් වෙනවා. මේ බස්නාහිර පළාතේ ජීවත් වන දරුවන්ගෙන් අධ්‍යාපනය ලබන පාසල් සංඛ්‍යාව 1270 ක්. මේ 1270 තුළ අධ්‍යාපන කටයුතුවල නියැළී සිටින දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වයන් මඟ හැරීම සඳහා පසුගිය කාල පරිච්ඡේදය තුළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ක්‍රියාත්මක වුණු මන්ද පෝෂණය තුරන් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දළ වශයෙන් මාසයකට වැය වන මුදල මිලියන 35 ක්. ගරු සභාපතිතුමනි, මේ පාසල් 835 තුළ දරුවන් 147,868 දෙනෙක් මේ පෝෂණ ව්‍යාපෘතියෙන් පෝෂණය ලබනවා. මම ජීවත් වන පානදුර ආසනයේ, තල්පිටිය කණිෂ්ට විද්‍යාලය, මහ වාද්දුව කණිෂ්ට විද්‍යාලය, වේරගම කණිෂ්ට විද්‍යාලය මේවා ඉතාමත් ග්‍රාමීය මට්ටමේ පවත්වාගෙන යන පාසල්. ඉතාමත් අනුවේදනීය කථාවක් ගරු සභාපතිතුමනි. මේ පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන, දරුවන්ට ආහාර සපයන එක මහත්මයෙක් මට ඇවිල්ලා කිව්වා, අනේ සර් මට කරන්න දෙයක් නැහැ. මට මේ ළමයින්ගේ ඇස්වල කඳුළු බලාගෙන ඉන්න බැහැ. පාසල් වත්තට අල්ලපු වත්තේ තමයි මේ සැපයුම්කරු ඉන්නේ. දවල්ට දරුවෝ ඇවිල්ලා අහනවාලු අනේ මාමේ අද අපට කන්න මොනවාත් දෙන්නේ නැද්ද කියලා. නමුත් ගරු සභාපතිතුමනි, පුරා මාස දෙකක් මේ වන තුරු පළාත් සභාවට මධ්‍යම ආණ්ඩුවෙන් මිලියන 70 ක හිඟ මුදලක් තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මේ මුදල් පළාත් සභාවට එන්න ඕනෑ. මේ පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න මේ පාසල් 835 ටම මේ වනතුරු මිලියන 70 ක් හිඟ තිබෙනවා. අද දවස වනකොට, මාර්තු මාසේ අවසන් වනකොට මිලියන 105 ක්, ලක්ෂ 1050 ක් මේ ව්‍යාපෘතිය කරන්න සල්ලි එන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලේ ඉල්ල ගන්න තිබුණා නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒ ආණ්ඩුව කාලේ දුන්නා. මේ ආණ්ඩුවෙන් තමයි නැත්තේ. ඒකයි මේ කියන්නේ. ගරු සභාපතිතුමනි,

මේ තත්ත්වය යටතේ අපි යහපාලනය තුළ ඉතාමත් සාධාරණ විධියට මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න, අනාගත දරු පරපුර මේ රට තුළ ආරක්ෂා කරන්න මහ දැවැන්ත විධියට සැලසුම් සකස් කරමින් කථා කරන්නේ. පොඩි එකා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

සෞඛ්‍ය ඇමැති වෙලා ඉන්න කොට කථා කළේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

දරුවෝ ගැන කථා කළත් කැසිල්ල හැදෙනවා. මහ එවුන් ගැන කථා කරන කොට කැසිල්ල හැදුනාට කමක් නැහැ. ඔවුන් ඡන්දදායකයෝ. මේ පොඩි උන්ට ඡන්දය නැහැ. මොනවක්වත් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කවුද වඩාගත්තේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කවුද දරුවෝ වඩා ගත්තේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව ඇති වන වේදනාව උදේ ඉඳලා හවස් වනකල් අපි කථා කරනවා. ගරු සභාපතිතුමනි, මේ රටේ දරු පරපුර, මේකට කෑ කෝ ගහන, බාධා කරන හැම කෙනාටම දරුවෝ ඉන්නවා. උන්ගේ දරුවෝ යන්නේ ලොකු ලොකු ඉස්කෝලවලට. කොළඹ 07 ආනන්ද, නාලන්ද, රෝයල්, තෝමියන්, තර්ස්ටන්, ඉසිපතන, විශාකා, අනුලා, දේවි යන දරුවන්ගේ තාත්තලා වන අපේ මන්ත්‍රීවරුන්ට කිසි ගාණක් නැහැ. කන්න නොවෙයි. වමාරන්නත් බඩු තියෙනවා. මේ දුප්පත් පවුල්වල දරුවන්ගේ පෝෂණය පිළිබඳව කථා කරන කොට කැසිල්ල හැදෙනවා. කසනවා. ඉන්න බැහැ. හරි අමාරුයි. හරි දුකයි. (බාධා කිරීම්) නමුත් ගරු සභාපතිතුමනි, අපට මේ වේදනාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මේ පාසල් 1270 ම සමස්ත දරුවන්ට මේ ප්‍රශ්නය තිබෙනවා කියලා මම කියන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අපි නිල ඇඳුම් බෙදනවා. රෝයල් එකේ නිල ඇඳුම් බෙදුවාම කොල්ලෝ නිල ඇඳුම්වලින් ෆුඩ් බෝල් ගහනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා මොනවාද දැක්කේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අනේ මේ කට තියාගෙන ඉන්න ලොක්කා. හරිද? පොඩි එවුන්ගේ දුප්පත් කොල්ලා ගැන කථා කරන කොට කැසිල්ල. මේ කසාන පාරට බෙහෙතක් ඕනෑ ගරු සභාපතිතුමනි. මේ කසාන පාරට බෙහෙතක් ඕනෑ. මොන සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හරි. පොඩි එකාගේ බඩේ වේදනවා, මන්ද පෝෂණය ගැන කථා කරන කොට කසනවා කසනවා ඉවරයක් නැහැ. ලැජ්ජයි. වාඩි වෙන්න. පොඩි එකාගේ කසාන පාර පොඩි එකාට කසන්නේ නැහැ. පොඩි එකාට ඡන්දෙත් නැහැ. උගේ මනාපේත් නැහැ. උගේ බඩගින්න ගැන කථා කළාම ඔන්න මහ ලොකු විපක්ෂය. යහපාලනයේ කැක්කුම හැදිලා. ගරු සභාපතිතුමනි, මේ යහපාලනයේ කැක්කුම. පොඩි එකාගේ කුසගින්න ගැන කථා කළාම යහපාලනයේ කැසිල්ල. ඒකට කියන්නේ කසානය. ඕක දැන් ලංකාවෙන් වඳ කරලා තිබුණේ. දැන් ආපහු ඇවිල්ලා. ගරු සභාපතිතුමනි, - ආ අද සිරස ඇවිල්ලා. මෙතුමාගේ පින්තූරේ අද ඒකේ යයි. ඒකට තමයි ඔය කතින්නේ. කැහැලා, කැහැලා පින්තූරේ දාගත්තාම කැස්ස හොඳ වෙනවා. ඒක හොඳ වෙනවා. තව කැගහන්න. අපි කෑගහුවාට බඩු යන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ පාසල් 835 දරුවන්ගේ මන්ද පෝෂණය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම රජය විසින් පළාත් සභාවට ලබා දුන්නු මුදල වහාම ලබා දෙන්න කියලා ඔබතුමා මගින් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දෙන ලෙස මා ඉතාමත් කාරුණිකව ඉල්ලනවා. මෙය ඉතා අසාධාරණයක්. මේ දරුවන්ගේ

[ගරු ජගත් අංගගේ]

කුසගින්නට ඔච්චන් කරන්න හොඳ නැහැ. දරුවන්ගේ කුසගින්න කියන්නේ මේ රටේ අහිංසක දරුවන්ගේ ජීවිත එක්ක කරන සෙල්ලමක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මගේ ගමේ මගේ පාසලේ දරුවෝ වැට මායිමේ වැටේ එල්ලිලා අල්ලපු ගෙදර භාණ්ඩ සපයන්නන්ගෙන් කෑම ටික ඉල්ලලා අඬා වැළපෙන යුගය ආරම්භ වෙලා. මේක වහාම අත්හිටුවන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් ගන්න ඔබතුමාගේ කාරුණික අවධානය මම ඉතාමත් බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 11.08 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.08 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී 12 (1) රීතිය යටතේ මට පෙනී යනවා මේ සභාවේ ගණපූරණය නොමැති බව. ඒ නිසා කරුණාකර සීනුව නාද කරන්න.

මේ අවස්ථාවේ සභා ගර්භයේ සිටින ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස මම මේ රීතිය ප්‍රකාශ කරන්නම්. 12 (1) රීතිය.

"*පනතේ 10 (4) වන වගන්තියේ නියමිත පරිදි සභාවේ ගණපූරණය මුළු මන්ත්‍රීසංඛ්‍යාවෙන් 1/3 ක් විය යුතුය. සභාවේ ගණපූරණය නොමැති බව සභාපතිවරයාට පෙනී යන හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් ඔහුගේ අවධානය යොමු කරවනු ලබන හෝ සෑම විටකදීම කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කළ යුතුය. විනාඩි 05 ක ඇවෑමෙන් ගණපූරණයක් ඇති නොවේ නම් පනතේ 10 (5) වගන්තිය අනුව සභාව කල් තැබීමට හෝ ගණපූරණයක් ඇති වනතුරු රැස්වීම අත්හිටුවීමට හෝ සභාපතිවරයා ක්‍රියා කළ යුතුය. ගණපූරණය ගණන් ගැනීමේදී සභාපතිවරයාද ඊට ඇතුළත් විය යුතුය*"

විනාඩි 05 ක කාලයක් ඉකුත්ව ගියා. නමුත් තවම සභාව තුළ ගණපූරණය සම්පූර්ණ වී නොමැති බැවින් මම තවත් විනාඩි 15 ක කාලයක් ලබා දෙනවා. ගණපූරණය සම්පූර්ණ වනතෙක් මම මෙම සභාව විනාඩි 15 කට මම කල් තබනවා.

***සභාව් ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුවනාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 11.29ට යළිත් රැස් විය.***
*Council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, it found no quorum Mr. Chairman, suspended the sitting temporarily and it resumed at 11.29 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාව වන විට සභා ගර්භය තුළ නියමිත ගණපූර්ණය සම්පූර්ණ වී තිබෙන බැවින් අදට නියමිත න්‍යාය පත්‍රය අනුව ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා කාර්ය පටිපාටි රීති 107 යටතේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මම එතුමාට අවස්ථාව ලබා දෙනවා එම යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමට.

# රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි,"*පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි.*"

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය, කේවල සහ සමානුපාතික ක්‍රමයට අනුව සකසා අනුමත කර ගත් නව මැතිවරණ ක්‍රමයට අනුව පවත්වන ලෙස මධ්‍යම රජයට යෝජනා කිරීම
PROPOSING TO THE CENTRAL GOVERNMENT TO HOLD THE FUTURE PARLIAMENTARY ELECTION ACCORDING TO THE NEW ELECTIONS SYSTEM APPROVED HAVING FORMULATED AS PER FIRST PAST THE POST AND PROPORTIONATE REPRESENTATION SYSTEM

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

*ගරු සභාපතිතුමනි,"පළාත් පාලන ආයතන, පළාත් සභා හා පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයින් තෝරා පත් කර ගැනීමේදී දැනට පවත්වන මනාප ඡන්ද ක්‍රමය තුළින් හැබෑ ජනතා සේවයට කැපවුන ජනතා නියෝජිතයින් තේරී පත් නොවන අතර ධනය හා බලය මුල් කර ගත් එක්තරා කණ්ඩායමක් එකී ධනය හා බලය තව තවත් වර්ධනය කර ගැනීමේ අරමුණින් අසීමිතව මුදල් වියදම් කර එසේම බලය යොදවා කෘතීම මහජන නියෝජිතයින් වශයෙන් පත් වීම පසුගිය මැතිවරණ ව්‍යාපාරවලදී දක්නට ලැබුණ සාමාන්‍ය තත්ත්වයකි.*

*2015 ජනවාරි මස 08 වන දින පැවැති ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය ලැබ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මැතිවරණ පොරොන්දුවක් වූ දින 100 කින් අලුත් රටක් යන වැඩ සටහනේ මාර්තු 02 වන දින නව මැතිවරණ ක්‍රමය පිළිබඳව කමිටු යෝජනා ලබාගෙන ඒ අනුව අදාළ නීති රීති සකස් කිරීම, මාර්තු 17 වන අඟහරුවාදා දිනය නව මැතිවරණ ක්‍රමය ඇතුළත් සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර හැකිතාක් ඉක්මණින් සම්මත කිරීම යන කරුණු සඳහා කාල පරාස වෙන් කර ඇත.*

*අද වන විට මේ දිනයට ළඟා වී ඇති අතර ඒ අනුව එකී දින වකවානු ඇතුළත් පවත්නා මනාප ඡන්ද ක්‍රමය අහෝසි කර සමානුපාතික හා කේවල ඡන්ද ක්‍රමය පිළිබඳව නීතිරීති හැකි ඉක්මණින් සම්මත කර දින 100 අවසානයේ එන පාර්ලිමේන්තු මැතිවරණය එම අනුමත කර ගන්නා නව මැතිවරණ ක්‍රමය අනුව පැවැත්විය යුතු යැයි මෙම ගරු සභාව රජයට යෝජනා කර සිටී."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[පූ.භා. 11.34]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මැතිවරණයක් කිට්ටු වනකොට සමානුපාතික නියෝජනය පිළිබඳව පසුගිය කාල පරිච්ඡේදය තුළ දීර්ඝ වශයෙන් කථා බහට ලක් වුණා කියන එක අපි කවුරුත් දන්න කාරණාවක්. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ මැතිවරණ ක්‍රමය හඳුන්වා දෙද්දී මේ මැතිවරණ ක්‍රමයට විශාල විවේචන ගණනාවක් තිබුණා. අපට දැනෙනවා, මුල්ම මැතිවරණය ඉතාම සාධාරණව මේ මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්වූවත් ඊළඟ මැතිවරණය පැවැත්වීමේදී මේ සඳහා මුදල් භාවිතා කිරීම, ධනය පාවිච්චි කිරීම වාගේම බලයද ඉතාම අඩු වැඩි වශයෙන් පාවිච්චි කරලා තිබෙනවා. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය දිගින් දිගටම දූෂිත මැතිවරණ ක්‍රමයක් විධියට බොහෝ දෙනා හඳුන්වලා තිබෙනවා. දැන් අපි දන්නවා සමහර පක්ෂ තුළ පසුගිය කාලයේ මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව දීර්ඝ විවේචනයන් තිබුණා. මේ මනාප ක්‍රමය පිළිබඳව, මනාප හිනාව පිළිබඳව ඒ වාගේම මනාප ඉල්ලීම කොයි තරම් හාස්‍ය ජනක කාරණයක්ද කියන එක පිළිබඳව පසුගිය කාල පරිච්ඡේදයේ දිගින් දිගටම සාකච්ඡාවට බඳුන් වුණු කාරණයක්. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය තුළ සැබෑ මහජන නියෝජිතයන් උද්දීපනය වෙන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියන එක සමාජයේ කථා බහට ලක් වුණා. අපි දන්නවා, ඉස්සර ආසනයකට මන්ත්‍රීවරයෙක් ඉඳිද්දී ඒ මන්ත්‍රීවරයා තමන්ගේ ආසනයේ මිනිස්සු වෙනුවෙන් වග කියනවා. ඕනෑම වෙලාවක මිනිස්සුන්ට ගිහිල්ලා ඒ මන්ත්‍රීවරයා, ඒ ඇමැතිවරයා හම්බ වෙන්න පුළුවන්. ඒ වාගේම මිනිස්සු අතර කෘතීමව හැසිරුණු නැති දේශපාලඥයෙක් බවට පත් වෙනවා. මේ මැතිවරණ ක්‍රමය තුළ අපට පෙනෙන එක කාරණයක් තමයි දේශපාලඥයාත් කට්ට කෛරාටික වෙනවා. ඡන්දදායකයාත් කට්ට කෛරාටික වෙනවා. දැන් උදාහරණයක් විධියට සල්ලි පාවිච්චි කරන්න පුළුවන් ඕනෑම කෙනෙකුට, මේ සැරේ

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

ඡන්දයේදී එක ගමකට අවිල්ලා තමන්ට තිබෙන මුදල් වියදම් කරලා, ඒ ඡන්දයෙන් ජයග්‍රහණය කරගන්න පුළුවන්කම ඇති වෙනවා. දැන් මම අත්වින්දා දැක්කා ගිය සැරේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාට වැඩ කරපු උදවිය මේ සැරේ අපේ ආසනය තුළම මේ දිස්ත්‍රික්කයේ වෙනත් අයට වැඩ කරන්න සූදානමින් ඉන්නවා. දැන් ඒ අය ගිහිල්ලා අපේ පක්ෂයේ උදවියටම ආරාධනා කරනවා එක්සත් ජාතික පක්ෂයේ අහවල් නායකයා එනවා. ඒ නිසා මෙතැනට එන්න කියලා. එතකොට එක්සත් ජාතික පක්ෂයේ උදවිය අහලා තිබෙනවා, තමුන්නාන්සේ එන්න කියන්න ඕනෑ නැහැ අපට, අපි හැමදාම හිටියේ මේ පක්ෂයේ. අපට කවුරුවත් පිට පැත්තේ අය මේ පැත්තට ඇවිල්ලා එන්න කියන්න ඕනෑ නැහැ කියලා.

මම කියන්නේ, මේ තුළම ව්‍යාපාරික පැලැන්තියක් එක පැත්තකින් බිහි වෙනවා, ඡන්දදායකයා හැටියට. මම කියන පුද්ගලයෝ දෙතුන් දෙනෙක් ඉන්නවා. ඒ අය විවිධ පස් කැපීම්, බොරළු කැපීම්, වැලි ගොඩ දැමීම් වාගේ කරන උදවිය. ඒ රජයෙනුත් ගන්න තිබුණු වරප්‍රසාද සියල්ල ගත්තා. මේ රජයෙන් ගන්න පුළුවන් වරප්‍රසාද ගන්න තමයි අපේ දිස්ත්‍රික්කයේ ඉන්න කවුරු හරි නායකයෙක් අල්ලගෙන එයාව ගෙන්නනවා ඒ මැතිවරණ කොට්ඨාශයට. මේකේදී එක පැත්තකින් දූෂණය සිද්ධ වෙනවා. ඒකයි මම කිව්වේ, දේශපාලඥයාත් කපටි වෙලා තිබෙනවා. දේශපාලනය කරන පුද්ගලයාත් කපටි වෙලා තිබෙනවා. අනෙක් එක මේ මැතිවරණ ක්‍රමය තුළම මිනිස්සු කොයි තරම් දේශපාලඥයාට නිගරු තත්ත්වයට පත් කරලා තිබෙනවාද කියන එක දේශපාලඥයා පසුගිය කාලයේ හැඳින්නුවේ මගෝඩිස්තුමාලා කියලා. මේ රටේ පුවත්පත්වල කාටූන් අඳිනකොට දේශපාලඥයා කියන පුද්ගලයා මගෝඩිස්තුමාලා හැටියට තමයි පත් වුණේ. අනෙක් එක විශාල මුදලක් වියදම් කරගත්තා. ඒ මුදල හම්බ කරන්න විවිධ දේවල් කරලා තිබෙනවා. ඒ නිසාම මේ මැතිවරණ ක්‍රමය දූෂිත තත්ත්වයට දිගින් දිගට පත් වෙලා තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ අද දවසේ - මම මේ පුද්ගලිකව ඉන්න ගමන් කල්පනා කළා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දැනට අවුරුදු 30 කට, 35 කට විතර හදාපු මැතිවරණ ක්‍රමයට එදා කොයිතරම් මිනිස්සු බැන්නත්, අද මේ ප්‍රධාන පක්ෂ තවමත් හොර ගල් අහුලනවා, මේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුද නැද්ද කියන තීන්දුවේ ඉඳිමින්. ඒ කියන්නේ වේලාවකට පක්ෂයේ නායකයන්ට දැනෙනවා, මේ මැතිවරණ ක්‍රමයෙන් බැහැර වුණොත් තමන්ට පාර්ලිමේන්තුවට යන්න බැරි වන තත්ත්වයක් උද්ගත වෙනවා කියලා. ඒ නිසා සාකච්ඡාවට අද බඳුන් වුණාට, මේ මැතිවරණ ක්‍රමයට අපි ප්‍රධාන පක්ෂ දෙක තුනම කොයිතරම් දුරට එකඟ වෙලා යයිද කියන තත්ත්වය අද තිබෙනවා. ඒ නිසා පක්ෂයක සාමාජිකයෙක් විධියට අපේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ දීර්ඝ වශයෙන් අපි මේක සාකච්ඡා කළා. අපි පක්ෂයක් හැටියට එකඟ වුණා. මේ මැතිවරණ නීති රීති වෙනස් කරලා මේ තිබෙන ක්‍රමයට යා යුතුයි කියලා. එතැනදී අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා, සුළු පක්ෂවලට අසාධාරණයක් නොවන ආකාරයට මේ මැතිවරණ ක්‍රමය සංශෝධනයට ලක් විය යුතුයි කියලා.

දැන් සමහර පුද්ගලයන් කියනවා, ඡන්දයකදී දිස්ත්‍රික්කයට විශාල මුදල් සම්භාරයක් වියදම් කරන පුද්ගලයා ආසනයකට පත් වුණාම, ඒ දිස්ත්‍රික්කයට වියදම් කරන මුදල් ආසනයටම වියදම් කරයි කියලා. අපි කියන්නේ ඒක කමක් නැහැ. ඒක එක පැත්තකින් හොඳයි. ඇයි? දිස්ත්‍රික්කයට වියදම් කරමින් ඒ මනුස්සයා ඒ ආසනයේ ඉන්නවා නම් මුළු අවුරුදු 06 පුරාම ආසනයට වියදම් කරපු ආකාරයටම වියදම් කරන්න වෙනවා. මිනිස්සු අහනවා නේ? ඔයා අපේ මහජන නියෝජිතයා. ඔයා ඡන්දය කාලයේ මේ විධියට වියදම් කළා. ඔයා ඡන්දය කාලයේ මේ විධියට දුන්නා. ඒ අනුව ඒකෙන් බැහැර වෙන්න ඒ පුද්ගලයාට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ ආකාරයෙන් ඔහු බැහැර වුණොත් වෙන්නේ, ඊළඟ මැතිවරණයට ඔහුට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙන එකයි. ඒ නිසා අපි කියන්නේ, ආසන ක්‍රමයට ඇවිල්ලා, බෙදුවාම හරි, ඒ මුදල් වියදම් කෙරුවාම හරි, ඒ ආසනය තුළ අවුරුදු හයම ඔහුට ඒ මුදල වියදම් කරමින් මිනිස්සු අතරේ ඔහුට ඉන්න සිද්ධ වෙනවා.

අපි දන්නවා, සමහර දේශපාලඥයන් මුදල් වියදම් නොකර ගෞරවාන්විත විධියට ආසනවල ජීවත් වුණා. උදාහරණයක් විධියට සෝමවීර චන්ද්‍රසිරි මහත්මයා වාගේ මිනිස්සු. ඒ මිනිස්සුන්ව අදටත් කැස්බෑව මැතිවරණ කොට්ඨාශයේ මිනිස්සු ඉතාම ගෞරවයෙන් යුක්තව සිහිපත් කරනවා. වහළයක් හෙවිල්ලන තැනට යනවා. මඟුල් ගෙදරට යනවා. මළ ගෙදරට යනවා. දානේ ගෙදරට යනවා. මිනිස්සුන්ට නැති බැරිකමක් වුණාම ඒ මනුස්සයා ඒකට උදව් කරනවා.

ඔහු ඒ මැතිවරණ කාලපරාසය තුළම ඒ ආසනය තුළ මිනිස්සුන්ට වගකියන පුද්ගලයෙක් විධියට ජීවත් වෙනවා. දැන් අද වෙලා තිබෙන්නේ, මේ දිස්ත්‍රික්ක මැතිවරණ ක්‍රමය තුළ මේ මැතිවරණයේදී එක ගමක් අල්ලා ගන්නවා. මනාප ඡන්ද ටිකත් එකතු කරගෙන ඒකෙන් ඔහු ශක්තිමත් වෙනවා. ඊළඟ මැතිවරණයේදී ඒ ගමට මොකුත් කරලා නැත්නම් මැතිවරණ කාලයේදී තව සල්ලි ටිකක් වියදම් කරලා එහා පැත්තේ ගම තමයි පාවිච්චියට ගන්නේ. ඒ නිසා මම කියන්නේ, ආසන ක්‍රමය මැතිවරණයට ආවාම මුදල් වියදම් කරන පුද්ගලයෙකුට, මැතිවරණ කාලය තුළදී විතරක් මුදල් වියදම් කරලා හරියන්නේ නැහැ. ඒක නිසා මේකේ දිගින් දිගටම අපි කියන කාරණය වෙන මොකුත් නොවෙයි. අපි දන්නවා, ඉස්සර මේ මැතිවරණ ක්‍රමය තුළ 1977 දක්වාම ආසනයට වගකියන, ආසනයේ මිනිස්සුන්ට ගිහිල්ලා උදේට හම්බ වෙන්න පුළුවන්, ආසනයේ මිනිස්සුන්ට ගිහිල්ලා කිසි ප්‍රශ්නයක් නැතිව, හයක් සැකක් නැතිව කථා කරන්න පුළුවන් මන්ත්‍රීවරයෙක් මේ ක්‍රමය යටතේ බිහි වුණා.

විශේෂයෙන්ම මේ යෝජනාව අපි ඉදිරිපත් කළේ වෙන මොකුත් නිසා නොවෙයි. මේ සැරේ ජනාධිපති මැතිවරණයේදී - මේ දින 100 වැඩ පිළිවෙළ එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළක් නොවෙයි. දැන් හුඟ දෙනෙක් කියනවා, මේ දින 100 වැඩ පිළිවෙළ එක්සත් ජාතික පක්ෂයේ කියලා. මේ එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළක් නොවෙයි. මහින්ද රාජපක්ෂ මහත්මයා පරාජය කිරීම සඳහා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කරපු වැඩ සටහනක්. මේ රටේ යහපාලනය ඇති කරන්න, ආර්ථික වශයෙන් විවිධ සහන ජනතාවට ලබා දෙන්න, මේ කොළේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඡායාරූපය එක්ක අපේ දින 100 වැඩ සටහන අපි ඉදිරිපත් කළේ. ඒ නිසා මේක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ වැඩ සටහනක්. අපි රජයට යෝජනා කරන්නේ, මේ රටේ වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මැතිවරණ කාලපරිච්ඡේදය තුළ ගෙයින් ගෙට බෙදපු, පුවත්පත්වල පළ කරපු, මේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ වාර්තාවෙන් වඩාත් පැහැදිලි කරන්න උත්සාහ කරපු කේවල ඡන්ද ක්‍රමය හා සමානුපාතික නියෝජනය දෙකම එකට එක් වුණු මැතිවරණ ක්‍රමයකට යන්න කියලා. ඒ නිසා මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ මැතිවරණ ක්‍රමයට යා යුතුයි කියලා රජයට කරන යෝජනාවයි මේ ඉදිරිපත් කළේ. එය සභාව හමුවට ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.45]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල**
Hon. Udaya Prabhath Gammanpila

ගරු සභාපතිතුමනි, අද මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සමඟ ගැට ගැසුණු තවත් දෙයක් තමයි, මේ මැතිවරණ ක්‍රමය ගෙන ඒමේ අවශ්‍යතාවය නිසාම පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමිය යුතුයි කියලා යෝජනාවක් ඇවිල්ලා තිබීම. අපි ඒකට විරුද්ධයි. ඇයි අපි ඒකට විරුද්ධ වෙන්නේ? වර්තමාන ජනාධිපතිතුමාට ජනවරමක් ලැබුණේ, යම් මැතිවරණ නිශ්චිත වැඩ සටහනකට. ඒ වැඩ සටහනේ සඳහන් වෙනවා, අප්‍රේල් මාසයේ 23 වැනිදා පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා කියලා. දැන් අද තර්කය වෙලා තිබෙන්නේ, වඩා වැදගත් වෙන්නේ ඉලක්කයද? වැඩ සටහනද? කියන එක. ගරු සභාපතිතුමනි, අපි හිතමු ප්‍රාදේශීය සභාවක් පාරක් කොන්ත්‍රාත් කරන්න ගත්තා. පාර කොන්ක්‍රීට් කරන්න මාසයක කාලයක් කොන්ත්‍රාත්කාරයාට ලබා දෙනවා. වැස්ස නිසා සමහරවිට මේක මාසයෙන් කරගන්න බැරි වෙන්න පුළුවන්. කොන්ත්‍රාත්කාරයාට තීරණය කරන්න බැහැ, මට වැඩේ කරන්න කාලය ගියා. මට වැඩේ වැදගත් කාලයට වඩා. මම මේක තනියෙන් කරගෙන යනවා කියලා. ඒ වෙනුවට ප්‍රාදේශීය සභාවට ගිහිල්ලා ආපහු ඒකට අවසරය අරගන්න ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ දින 100 වැඩ සටහන සම්පූර්ණ කරගන්න බැරි නම් අපි යන්න හදන්නේ කා ගාවටද? මේ දින 100 වැඩ සටහනට ජනවරම ලබා දුන්න මහජනතාව ඉදිරියට. මෙන්න අපේ ප්‍රගතිය. මෙතරම් අපි වැඩේ කරලා තිබෙනවා. ඉතුරු ටිකත් සාර්ථකව කරන්න දෙන්න අපට ජනවරමක් කියලා ජනතාවට කියන්න පුළුවන්. ඒ නිසා මගේ විශ්වාසය නම් මේ නව මැතිවරණ ක්‍රමය බිහි කිරීමට ඉදිරි මාසය හොඳටම ප්‍රමාණවත්. මැතිවරණ කොමසාරිස්වරයා ඉන්නෙත් ඒ ස්ථාවරයේ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය වෙනස් විය යුතුයි. මම හිතන්නේ, එතැන තර්කයක් නැහැ. මේක තිබෙන හොඳම ක්‍රමය. මේක රැක ගමු කියලා කෙඳිරිල්ලක්වත් මේ සමාජයෙන් නැහෙන්නේ නැහැ. අද මතු වෙලා තිබෙන්නේ කාලය ප්‍රමාණවත්ද? ඔව්. ප්‍රමාණවත්. අපි ඔක්කෝම එක හඬින් ඉන්නවා නම්, මේක ප්‍රමාණවත්.

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල]

ගරු සභාපතිතුමනි, හොඳ මැතිවරණ ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ තුනක් තිබෙනවා. පළමුවැනි ලක්ෂණය තමයි, මැතිවරණය ජයග්‍රහණය කරන පක්ෂයට සරල බහුතරයක්, ස්ථාවර ආණ්ඩුවක්, ස්ථාවර පාලනයක් ඇති කර ගැනීමේ හැකියාව තිබෙන්න ඕනෑ. අපේ වර්තමාන සමානුපාතික ක්‍රමයේත් යම් දිස්ත්‍රික්කයක් ජයග්‍රහණය කරන පක්ෂයට ප්‍රසාද මන්ත්‍රී ධූරයක් දීලා තිබෙන්නේ මේ ස්ථාවර භාවය ගෙනෙන්න. දෙවැනි කාරණය තමයි, සෑම ජනතාවටම තමන්ගේ නියෝජිතයන් නිශ්චිතව හඳුනාගන්න පුළුවන් වෙන්න ඕනෑ. මැති සභාවේ කවුද මාව නියෝජනය කරන්නේ කියලා. ගරු සභාපතිතුමනි, තුන්වැනි කාරණය, සමාජයේ තිබෙන්නා වූ විවිධ මතවාදයන් මහජන නියෝජිත සභාවල නිරූපණය වෙන්න ඕනෑ. කුඩා කුඩා හඬවල්වලටත් ඉඩක් නොතිබුණොත් තමයි ඒ අය ආයුධ අරගෙන, මහ පාරට බැහැලා ඔවුන්ගේ හඬ සමාජගත කරන්න උත්සාහ කරන්නේ. මෙන්න මේ කියන ප්‍රධාන ලක්ෂණ තුන අලුත් මැතිවරණ ක්‍රමයේ තිබෙනවාද?

දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටෙව්වා. මෙන්න මේ තේරීම් කාරක සභාවේ ඉදිරිපත් කරපු යෝජනාවේ, ඒ වාගේම දැනට නීතියක් වෙලා තිබෙන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පවතින මැතිවරණ නීතියේ මේ ලක්ෂණ තුන හොඳින් පිළිබිඹු වෙලා තිබෙනවා. ඒ නිසා අද අලුත් මැතිවරණ ක්‍රමයක් සකස් කිරීම සම්බන්ධයෙන් මහා විවාද පවත්වමින් කාලය නාස්ති කරන්න දෙයක් නැහැ. මේ වන විට පාර්ලිමේන්තුවේ යම් යම් පක්ෂවල සම්පූර්ණ එකඟතාවය නොලැබුණා වෙන්න පුළුවන්. විශේෂයෙන්ම අපි දන්නවා, සමහර කුඩා පක්ෂවල තමන්ගේ නියෝජනය පිළිබඳ, සුරක්ෂිත භාවය පිළිබඳ යම් ප්‍රශ්න තිබෙන්න පුළුවන්.

හැබැයි, පළාත් පාලන මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් ඒ යුගයේ මම පත්තරයකට ලිපියක් ලිව්වා. මම එක්තරා දිස්ත්‍රික්කයක් උදාහරණයක් ලෙස අරගෙන ඒ මන්ත්‍රී ධූර නව ක්‍රමය යටතේ බෙදන ආකාරය බැලුවා. ගරු සභාපතිතුමනි, පුදුම සහගත විධියට දැනට බෙදී තිබෙන ආකාරයටමයි කොට්ඨාශ ක්‍රමය ආවට පස්සෙත් බෙදිලා තිබෙන්නේ. මොකද, මේ මැතිවරණ ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණයක් හඳුන්වා දී තිබෙනවා. ඒ තමයි දැනට පවතින ක්‍රමයේ තිබෙන ද්විි ගණන දෝෂය. Double Counting Error කියන ද්විි ගණන දෝෂය ඉවත් කිරීම. අද ජාතික ලැයිස්තුවේ මන්ත්‍රී ධූර බෙදද්දී ජයග්‍රහණය කළ මන්ත්‍රීවරයා වෙනුවෙන් ගණනය කරපු ඡන්දය නැවත වතාවක් ජාතික ලැයිස්තුවෙනුත් ගණනය කරනවා. එකම ඡන්දයට මන්ත්‍රී ධූර දෙකක් ලැබෙනවා. හැබැයි, මේ අලුත් ක්‍රමයේදී කොට්ඨාශය ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරයාට ලැබුණු ඡන්ද සමානුපාතික ක්‍රමයට ඒ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් තෝරා ගැනීමේදී ගණනය කරන්නේ නැහැ. සලකා බැලෙන්නේ නැහැ. මොකද මේ වන විටත් කොට්ඨාශ ක්‍රමයෙන් ඒ ඡන්දවලට මන්ත්‍රීවරයෙක් දීලා තිබෙන නිසා. ඒ නිසා පරදින කුඩා පක්ෂවලට සමානුපාතික ක්‍රමයෙන් ලැබෙන ආසනවල වැඩි අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා කුඩා පක්ෂවලට බරපතළ අසාධාරණයක්, කලින් කොට්ඨාශ ක්‍රමයේ තිබුණු බරපතළ අසාධාරණය මේ ක්‍රමයේ සිද්ධ වෙලා නැහැ. පරාජිත ඡන්දවලින් පමණක් සමානුපාතික ක්‍රමයේදී තේරෙන මන්ත්‍රීවරුන් තෝරාගෙන තිබෙන නිසා. එතැනදී යම් යම් මොනවා හරි අඩුපාඩුවක් තිබෙනවා. පවතින ක්‍රමයේ දැනටමත් මොකක් හරි අඩුපාඩුවක් කවුරු හරි දකිනවා නම් අපට පුළුවන් සාකච්ඡා කරලා ඒ අඩුපාඩුවත් වෙනස් කරලා වඩාත් ජනතා මතය නියෝජනය වන - ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය විතරක්ම ප්‍රමාණවත් නැහැ. ස්ථාවරභාවයත් වැදගත්. රටක ස්ථාවරභාවය නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා මේ කාරණා දෙකම එක පිට ලැබෙන්න පුළුවන්. මේ දිනේෂ් ගුණවර්ධන තේරීම් කාරක සභාවේ යෝජනාව අපට ඉදිරියට ගෙන යැමට කිසිම බාධාවක් නැහැ. ඒ නිසා තවත් කල් මරන්නේ නැතිව, ඉදිරි මාසය ඇතුළත අපට මේ යෝජනාව ක්‍රියාත්මක කළ හැකියි.

සමහරු අහනවා, කොට්ඨාශ කඩන්න ඉතින් සෑහෙන කාලයක් යනවා නේ කියලා. ගරු සභාපතිතුමනි, එහෙම වෙන්න ඕනෑ නැහැ. 1978 ව්‍යවස්ථාවෙන් කොට්ඨාශ ක්‍රමය අහෝසි කළත් අදටත් අපේ මැතිවරණ ප්‍රතිඵල කියන්නේ කොට්ඨාශ ක්‍රමයටයි. මහ පොළවේ නැති කොට්ඨාශ ක්‍රමය අනුව ආසන සංවිධායකවරුන් හැම පක්ෂයෙන්ම පත් කරලා තිබෙනවා. නීති පොතේ නැති වුණාට ප්‍රායෝගිකව අදටත් කොට්ඨාශ ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මකයි. අද ඇති වෙලා තිබෙන එකම ප්‍රශ්නය, මේ කොට්ඨාශ අතර ඡන්ද දායකයන් ගණනේ බරපතළ විසංවාද මතු වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට කැස්බෑවේ එක් ලක්ෂ හැත්තෑ

තුන්දාහක් ඡන්ද දායකයන් ඉන්නකොට ඒක බටහිර කොළඹ හතළිස් දාහක් වාගේ අඩු ගණනක් වෙන්න පුළුවන්. හැබැයි, අපට ක්ෂණික වෙනස්කම් කරන්න පුළුවන්. බටහිර කොළඹයි, නැගෙනහිර කොළඹයි එකතු කරලා දකුණු කොළඹ කියලා ඡන්ද කොට්ඨාශයක්. දෙහිවලයි, රත්මලානයි එකතු කරලා ගල්කිස්ස කියලා ඡන්ද කොට්ඨාශයක්. මහා ලොකු සීමාවල් ගැන සිතමින් කාලය මරණවා වෙනුවට සරල ක්‍රමවේදවලින් අපට මේ ප්‍රශ්න විසඳගන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය අපි ගෙනාවේ නැත්නම් අර අපේ ගරු විපක්ෂ නායකතුමා ඉතාම නිවැරැදිව සඳහන් කළා වාගේ මැර බලයයි, ධන බලයයි විසින් ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කරනවා.

ගරු සභාපතිතුමනි, මුල් යුගයේදී ඡන්දය කරන්න, දිස්ත්‍රික්කයක් පුරා ඡන්දය කරන්න ඕනෑ. එකම පක්ෂයේ කට්ටිය සීමිත තාප්ප ප්‍රමාණය අත්පත් කරගන්න අසීමිත අපෙක්ෂකයන් සංඛ්‍යාවක් අතරේ ඇතිවන තරගයේ ප්‍රතිඵලයක් විධියට මැර බලයත් ඡන්දයට ඕනෑ වුණා. ඉස්සර ධන බලය විතරයි. ඊට පස්සේ මැර බලයත් එකතු වුණා. ඉතින් මේ ධන බලයයි, මැර බලයයි අරගෙන දේශපාලකයා ගමනක් යනකොට මුදලාලියි මැරයයි කල්පනා කරන්න ගත්තා මොකටද යකෝ අපි එක එකාට කඩේ යන්නේ. අපිම මේ ඡන්දය ඉල්ලුවා නම් ඉවර නේ කියලා. සම්ප්‍රදායක දේශපාලකයා ක්‍රමයෙන් ඈත් වුණා. සමාජ සේවය කරලා, අන්‍යෝන්‍යාධාර සමිතියට, මරණාධාර සමිතියට, සමූපකාරයට, ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා ආපු සම්ප්‍රදායික දේශපාලකයා ඉවත් වෙලා මුදලාලියි මැරයයි රටේ දේශපාලනය කරන්න ගත්තා. ඒක නිසා තමයි ගරු සභාපතිතුමනි, සමහර වේලාවට කථා කරලා බේරගන්න ඕනෑ ප්‍රශ්න අතින් පයින් විසඳගන්න සභාවල උත්සාහ කරන්නේ. ඒ නිසාම තමයි ගරු සභාපතිතුමනි, සභාවේ ඉන්න දන්නේ නැති මන්ත්‍රීවරු බිහි වෙලා තිබෙන්නේ. (බාධා කිරීමක්) දැනුත් පුංචි පුංචි හඬවල් ඇවිල්ලා අනේ මම මේ සභාවට නුසුදුසුයි නේද කියලා ජනතාවගෙන්ම ප්‍රශ්න කිරීම් සිදු වෙනවා.

ගරු සභාපතිතුමනි, අද අපි මේ කාරණය සලකා බලද්දී පළාත් පාලන මැතිවරණ නීතිය පාර්ලිමේන්තුවෙන් තේරීම් කාරක සභාවට යොමු කරලා, මේක තවත් වැඩි දියුණු කරන්න මොනවා හරි යෝජනාවක් තිබෙනවා නම්, ඒ යෝජනා ඉදිරිපත් කරලා ඒ නව මැතිවරණ ක්‍රමයෙන් - පහු පහු වෙනකොට කොහු කොහු වෙනවා කියලා තමයි අපි අහලා තිබෙන්නේ. ඒක නිසා ගරු සභාපතිතුමනි, අපි ඉතාම පැහැදිලිව කියනවා, අපට මේ මැතිවරණය කල් දාන්න අවශ්‍ය නැහැ. එදා මේ ලක්ෂ 62 ත් එක්ක එකතු වෙලා සන්ධානය පරාජයට පත් කරන්න කටයුතු කරපු නිසා සන්ධාන පාක්ෂිකයන්ගේ වෛරයට ගොදුරු වෙලා ඉන්න අතලොස්සක් මැතිවරණවලට භයේ මැතිවරණ කල් දාන්න කියලා කන්කෙඳිරි ගානවා. ජනතාව ඉස්සරහාට යන්න අපි කවදාවත් භය වෙන්නේ නැහැයි කියන එකත් මෙතුමන්ලාට මතක් කරන්න ඕනෑ. අපට ජනතාව ඉස්සරහාට යන්න ආත්ම ශක්තිය නැත්නම් අපි එදාට දේශපාලනයෙන් සමු ගන්නවා මිසක් මැතිවරණ කල් දාන්න කියලා කන්කෙඳිරි ගාන්නේ නැහැයි කියන එක සිහිපත් කරමින්, ගරු සභාපතිතුමනි, නැවුම් මැතිවරණ ක්‍රමයකින්, නැවුම් දේශපාලන සංස්කෘතියක් බිහි කරලා සාමකාමී මැතිවරණ යුගයකදී යළි මේ විපක්ෂයත් එක්ක නුදුරු අනාගතයේම අපි එකට හමු වේවා! කියලා ප්‍රාර්ථනය කරමින් මේ නව මැතිවරණ ක්‍රමය බිහි කර ගැනීම වෙනුවත්, නව මැතිවරණ ක්‍රමය හැකි ඉක්මණින් බිහි කරගෙන, ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය ඒ ක්‍රමයේ පැවැත්වීම වෙනුවෙන් ඕනෑම කෙනෙක් කරන ඒ අරගලයට පක්ෂ පාට භේදයකින් තොරව අපේ දායකත්වය ලබා දෙනවා කියන එක සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

[පූ.භා. 11.56]

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අපේ ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරනු ලැබූ මෙම යෝජනාව විශේෂයෙන්ම පසුගිය ජනාධිපතිවරණ සමයේ සිට කරලියට ආපු කථාබහක්. වසර ගණනාවක් තිස්සේ මෙම යෝජනාව පිළිබඳව කථාබහ කළත් පසුගිය මාස දෙක තුන අපේ දේශපාලනයේ විශේෂ ස්ථානයක් ගන්නවා. ඉතින් මේ ගැන අපි කථාබහේ යෙදෙන කොට, විශේෂයෙන්ම අපට සෑම ආසනයකටම මන්ත්‍රීවරයෙක් පත්වීම මම හිතන්නේ, මෙම යෝජනාව තරාදියකට ගත්තොත් එක පැත්තක, වාසිදායි පැත්තක්. විශේෂයෙන්ම සෑම ආසනයක්ම නියෝජනය කරන්න, සෑම ආසනයක්ම භාරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සිටීම මම හිතන්නේ ඉතාම වැදගත්. ඇත්තටම පෞද්ගලිකව අපි දන්නවා. මේ මනාප ක්‍රමයේදී ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත් ආසන 13 ක් තිබෙනවා. පාර්ලිමේන්තු මැතිවරණයක් හෝ

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

වේවා. පළාත් සභා මැතිවරණයක් හෝ වේවා. අපට විශාල මුදලක් මැතිවරණයකට වියදම් කරන්න සිදු වෙනවා. ඒක ඇත්ත. ඒ වාගේම තමයි ඒ වෙනුවෙන් විශාල ධනයක්, කාලයක්, මහන්සියක් යොදන්න සිදු වෙනවා. ඉතින් ආසන ක්‍රමය තිබුණොත් මේ වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරලා අපට විශාල කාලයක් එම ආසනයේ දියුණුව වෙනුවෙන්, ප්‍රදේශවාසීන් වෙනුවෙන් යොදන්න පුළුවන්. නමුත් මෙහි අනික් පැත්තක් ද තිබෙනවා. අපි බොහෝ වේලාවට මේ ආසන ක්‍රමය ගැන කථා කරන කොට සල්ලිකාරයෝ, ඒ වාගේම මැරයෝ මේ දේශපාලනයට එන එක වළක්වන්න ගෙන එන ලද යෝජනාවක් හැටියට කථා බහක යෙදෙනවා. ඒ වාගේම තමයි අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්ව ආකාරයටම මේක දිස්ත්‍රික්කයේ නැතිව එක ආසනයකටම මේ ධනයත්, මැර බලයත් යෙදෙව්වොතින් මොනවාගේ තත්ත්වයක් උදා වෙයිද කියන කාරණාවත් මම හිතන්නේ අපි සලකා බලන්න වෙනවා. මේක දිස්ත්‍රික්කයකට යොදනවාට වඩා මම හිතන්නේ ඊට වඩා බරපතළ කාරණයක් වෙනවා, එක ආසනයකට මේ ධනයයි, මැර බලයයි යොදනවා නම්. කොහොම වෙනසක් සිදු වෙයිද?

එතකොට තවත් කාරණාවක් තිබෙනවා. අපි බලන්න ඕනෑ. අපේ මේ පළාත් සභාවට වෙන්නේ මොකක්ද කියලා. දැන් මේ මනාප ක්‍රමයත් එක්ක යනකොට අපි හැම වේලාවේම කථා කරනවා, මේ පාර්ලිමේන්තු මැතිවරණයේදී මෙම අලුත් ක්‍රමය. නමුත් දැන් මේ පාර්ලිමේන්තුවට පමණක් සීමා නොවී පළාත් සභාවක් නියෝජනය කරන අපට, පළාත් සභාවේ කොහොමද මේවා නිර්ණය කරන්න ඕනෑ කියලා මම හිතන්නේ ඉතා ඉක්මණින් මේ වෙනසත් සිදු කරනවා නම්, මේ පළාත් සභා ක්‍රමයත් ඒ නිර්ණනය කරන ආකාරය පිළිබඳවත් කථා බහක යෙදෙන්න ඕනෑ. ඒ එක කාරණාවක්.

එතකොට අනික් පැත්තෙන් බලනකොට තමයි අපේ සුළු ජාතීන්ට සාධාරණයක් සිදු වෙන්න ඕනෑ. සුළු පක්ෂවලට. එතකොට ඒ සුළු ජාතීන්ට, සුළු පක්ෂවලට සාධාරණයක් ඉටු වෙලා - මම හිතන්නේ විශේෂයෙන්ම මුස්ලිම් කොංග්‍රස් එක, ජාතික හෙළ උරුමය, ජනතා විමුක්ති පෙරමුණ, වෙන ජාතීන් නියෝජනය කරන, විශාල කාර්ය භාරයක් පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ ඉටු කරන මේ පක්ෂ වලටත් මම හිතන්නේ, ඒ අයටත් සාධාරණයක් ඉටු වෙන ක්‍රමවේදයක් විය යුතුයි. ඒ වාගේම අපි කවුරුත් දන්නවා. අපි දැන් දශක තුනකට අධික කාලයක් විශාල ත්‍රස්තවාදී ප්‍රශ්නයකින් බොහොම අමාරුවෙන් බේරිලා, දැන් සාමය ඇති වෙලා තිබෙනවා. නැවතත් මේ දේශපාලනය නිසා ඒ ඒ සුළු ජාතීන්ට සාධාරණයක් ඉටු නොවී ඒ අයගේ හඬ පාර්ලිමේන්තුවේ පළාත් සභාවේ මතුවීම නොසලකා හැරියොත් නැවතත් අපට අර්බුදකාරී තත්ත්වයක් උදා වෙයි දෝ කියන ඒ සැකයත් මම හිතන්නේ අපි නිරාකරණය කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මම දරන මතය තමයි මේ වාගේ කාරණා සියල්ලම අපි මේ අලුත් යෝජනා ක්‍රමයේදී බැලුවොතින් මේකට වාසිදායි කාරණා විශාල ප්‍රමාණයකුත් තිබෙන අතරම, මේ ගැන අහිතකර කාරණා විශාල ප්‍රමාණයකුත් තිබෙනවා. ඉතින් මේවා නිරාකරණය කරන්න අපි ඉතා ඉක්මණින් - මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. පසුගිය මැතිවරණයේදී අපි දුන්න ප්‍රධාන පොරොන්දු අතරින් එකක් තමයි අප්‍රේල් මාසේ 23 වැනිදාට පාර්ලිමේන්තුව විසුරුවනවා කියන එක. එතකොට මේ පාර්ලිමේන්තුව විසුරුවන්න අපි සියලුමදෙනා එකතු වෙලා මේ කරන වෙනස්කම් ඉතා ඉක්මණින් සිදු කරලා නැවතත් පාර්ලිමේන්තු මැතිවරණයකට අප්‍රේල් මස 23 වැනිදාට යා යුතුමයි. ඒ කටයුත්ත කරන්න පුළුවන් නම් මම හිතන්නේ, අපි මේ යෝජනාවට සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න කැමැතියි.

ඒ වාගේම අනික් කාරණය තමයි අපි මේ මොන යෝජනා දුන්නත් මේ උත්තරීතර සභාවන්වලට, පළාත් සභාවට, පාර්ලිමේන්තුවට නාම යෝජනා දෙන්නේ පක්ෂයෙන්. මේ අපේක්ෂකයන්ට ඡන්දය දෙන්නේ ඡන්දදායකයින්. මහජනතාව. ඉතින් මම හිතන්නේ, මේ ක්‍රමවේදයට විතරක් හැංගිලා ඉඳලා අපට අහක බලාගෙන ඉන්න බැහැ. මේකට පක්ෂවලට වගකීමක් තිබෙනවා. අපි මේ මොනවා කථා කළත්, මේ මොන ආසන ක්‍රමවලට නාම යෝජනා භාර දුන්නත් හොරුන්ට, කුඩුකාරයන්ට, එහෙම නැත්නම් වෙනත් අපයෝජනවලට ලක් වෙන මේ හොරු ගුහාවන්වලට අපේක්ෂකත්වය භාර දුන්නොත් මේ ආසන ක්‍රමය තිබුණා කියලා වැදගත් වෙන්නේ නැහැ. එහෙමනම් අපේ පක්ෂවලට වගකීමක් තිබෙනවා. මේ උත්තරීතර සභාවන්වලට අපේක්ෂකත්වය ලබා දෙන කොට වගකීමකින් කටයුතු කරන්න. ඒ වාගේම තමයි, එතැනින්

එහාට ගියාට පස්සේ ජනතාවට නොයෙක් නොයෙක් හේතූන් මත පක්ෂ නාම යෝජනා භාරදුන්නොතින් එතකොට ජනතාවට වගකීමක් තිබෙනවා, මේ මොන අයටද අපි ඡන්දය දෙන්න ඕනෑය කියලා. ඉතින් මේක අන්තිමට ජනතාවගේ අතේ තිබෙන්නේ. එහෙමනම් ජනතාවටත් වගකීමක් තිබෙන්න ඕනෑ. බුද්ධිමත් වෙන්න ඕනෑ. වගකීමකින් කටයුතු කරන්න ඕනෑ. මේ උත්තරීතර සභාවල්වලට, පළාත් සභාවක් වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුව වෙන්න පුළුවන්. මොන වාගේ පුද්ගලයින්ද අපි මේවාට පත් කරන්න ඕනෑ කියන එක වගකීමකින් මම හිතන්නේ ජනතාව කටයුතු කරන්නත් අවශ්‍යයි. ඉතින් මේ කාරණා පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ.

මේවාටත් වඩා අපේ දේශපාලනය කියන එක දැන් පල්ලෙහා තත්ත්වයටම වැටිලා තිබෙන ප්‍රධාන හේතුවක් වෙනවා, මේ එක අපේක්ෂකයෙක් ඉඳන් අනික් අපේක්ෂකයාට සහයෝගය ලබා දෙන්න, එහෙම නැත්නම් වෙනත් හේතූන් මත අර පනින පැනිල්ල. එක වේලාවක එක අපේක්ෂකයෙක්ට සහයෝගය දෙනවා. ඊළඟ දවසේ වෙන කොට තවත් අපේක්ෂකයෙකුට සහයෝගය දෙනවා. සමහර වේලාවට මෙතැන ඉඳන් එතැනට ගිහිල්ලා එතැන සතියක් ඉඳලා ආපසු මෙතැනට එන අවස්ථා තිබෙනවා. මේ වාගේ දේවල් මම හිතන්නේ, නීතියෙන්ම තහනම් කරන්න ඕනෑ. අපේ ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරියේදී ඇති වෙනවා. මේ ව්‍යවස්ථා සංශෝධනයේදී විශේෂයෙන්ම මේ පක්ෂ මාරු කිරිල්ල ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. පක්ෂ මාරු කරන්න පුළුවන්. පක්ෂ මාරු කළොත් තමන්ගේ ඡන්දයෙන් පත් වූ ඒ අසුන අහෝසි විය යුතුයි. එහෙම නැතිව මේ එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලලා අනික් පක්ෂයට ගිහිල්ලා ඇමැතිකමක් අරගෙන එක්සත් ජාතික පක්ෂයේම ඉන්න අවස්ථා පසුගිය කාලයේ තිබුණා. ඒ වාගේම තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිට එක්සත් ජාතික පක්ෂයට එනවා. එක්සත් ජාතික පක්ෂයේ ඉඳගෙන කියනවා, නැහැ, නැහැ අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කියලා. මේ පැනිල්ලත් වහාම නතර කරන්න ඕනෑ. එතකොට ඒක නතර කරන්න නම්, ඒ වාගේ අවස්ථාවකදී පක්ෂයේ සාමාජිකත්වය අහෝසි වෙනකොට තමන්ගේ මන්ත්‍රී ධූරයත් අහෝසි වන ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඉතින් අපට මේ ඉදිරි කාල වකවානුවේදී ඉතා ඉක්මණින් - මේ සැම දෙයක්ම හැබැයි කළ යුත්තේ, අප්‍රේල් 23 දාට කලින්. අප්‍රේල් 23 වැනිදාට අපි අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයකට යනවා. අපේ පක්ෂය ගත්ත තීන්දුවක් ඒක. අපේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ගත්ත තීන්දුවක්. අපේ පසුගිය ජනාධිපතිවරණයේදී ගත්ත ඡන්ද පොරොන්දුවක්. ඉතින් මේ සැම කටයුත්තක්ම ඉතා කෙටි කාලයක් තුළදී සිදු කරලා ජනතාවට සාධාරණයක් ඉටු කරන්න කියන එක මම ප්‍රකාශ කරනවා. බොහොමත්ම ස්තුතියි.

[අ.භා. 12.05]

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.)

ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ගෙන එන ලද යෝජනාව පිළිබඳව අපි ඉතාමත්ම අගය කරනවා. එකම මැතිවරණ කොට්ඨාශයේ ඉන්න දෙන්නා. දීර්ඝ කාලයක් මේ මැතිවරණවලට අපි සම්බන්ධ වුණු පුද්ගලයන්. 1991 මම පළමුවැනි ප්‍රාදේශීය සභා මැතිවරණයට කැස්බෑව මැතිවරණ කොට්ඨාශයෙන් තරග කරලා සභාපති වුණා. 1994 පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී මම කැස්බෑව මැතිවරණ කොට්ඨාශයේ අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වෙලා කැස්බෑව මැතිවරණ කොට්ඨාශයේ වැඩි ඡන්ද ගණනාවකින් ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණා.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මොකක්ද දන්නේ නැහැ, ඔක්කෝම බලාගෙන සිටිද්දී අවධානය - ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, පොඩ්ඩක් සමාවෙන්න. මොකක් හරි ගැටලුවක් තිබෙනවා නම්, ඔබතුමන්ලා පොඩ්ඩක් එහා පැත්තට ගිහිල්ලා කථා කරනවාද? මෙතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙන්නේ. මම මේ සභාවේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්.

[ගරු රජිත හපුආරච්චිගේ]

එතකොට මට මේ සභාවේදී අදහස් දැක්වීමක් කිරීම සඳහා ඒ අවශ්‍යා කටයුතු සම්පාදනය වෙන්න ඕනෑ විපක්ෂය හරහා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හරහා තමයි ඒ කටයුතු සම්පාදනය වෙන්න ඕනෑ. ඉතින් මම ඒ ඉල්ලීම තමයි එතුමන්ට කරන්නේ. ඒ නිසා එතුමන්ලා මට කියා සිටිනවා, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයාගෙන් ඒ අවස්ථාව ලබා ගන්න කියලා. ඒක වැරැදියි. ඒ නිසා මගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා. මට මේ සභාවේදී මේ මාතෘකාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමක් කරන්න අවශ්‍යයි. ඒකට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මෙතුමා මොන පක්ෂයද නියෝජනය කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ආණ්ඩු පක්ෂයෙන් ඉල්ල ගන්න.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මේ සභාව තුළ කිසිම ඡන්දය පාවිච්චි කිරීමකදී මම ආණ්ඩු පක්ෂය නියෝජනය වෙන්න ඡන්දය පාවිච්චි කිරීමක් කරලා නැහැ. එහෙම කරලා නැහැ මම.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අපි පුවත්පත්වලින් දැක්කා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතාම පැහැදිලියි -

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ඒක ඇවිල්ලා පළාත් සභාව ඇතුළට අදාළ දෙයක් නොවෙයි නේ. පළාත් සභාව තුළ අපි විපක්ෂය තුළ නියෝජනය වෙන්නේ. ඒ නිසා මට ඒ අවස්ථාව විපක්ෂය තුළින් ලැබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, මට කථා කරන පැත්ත නොවෙයි වැදගත් වෙන්නේ. මේ මාතෘකාව සම්බන්ධයෙන් මට අදහසක් දක්වන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉල්ලන්නේ විනාඩි 05 ක්. මේක වාද විවාද කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමා ඔබතුමාගේ අභිමතය පරිදි කාලය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කාලය දෙන්න පුළුවන්. මේ යෝජනාව -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අජිත් කුමාර මන්ත්‍රීතුමාට දෙන්නෙත් ඒ විධියටමයි. ඒ නිසා ඒ විධියට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එතුමාට කාලය දෙන්නම්. ගරු ඇමැතිතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි -** අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, කථා කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඒ ප්‍රශ්නය දැන් ඉවරයි. ඒ මන්ත්‍රීතුමාට මම විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මේ මනාප ඡන්ද ක්‍රමය නිසා අපි දීර්ඝ කාලයක් මේ අපහසුතාවට - (බාධා කිරීම්)

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න අවශ්‍ය නැහැ. මම ගරු මන්ත්‍රීතුමාට කාලය ලබා දෙන්නම්. ගරු ඇමැතිතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමා, මම දෙපාරක් නැඟිට්ටා. තුන්වැනි පාරට වාඩි වුණොත් ආයේ කථා කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, අපේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව මම ඉතාමත්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ටික ඕනෑ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

කථා කරන්න හම්බ වුණේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ටික අවශ්‍ය නැහැ. මුල ටික ඕනෑ නැහැ. ඒ ටික රෙකෝඩ් වෙලා තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දැන් ඉතින් කළබල වෙන්න දෙයක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

94 කැස්බෑවට තරග කළා. ඒ ටික හරි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් සභාව නිශ්ශබ්ද කරලා දෙන්න. මට කාරණා ටිකක් කියන්න තිබෙනවා. මම කථා කරන්නේ ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය වෙනස් වෙන්න තිබුණේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමා අපේ පළාත් සභාවේ ඉන්න ජ්‍යෙෂ්ට ඇමැතිවරයෙක්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය වෙනස් වෙන්න තිබුණේ අද ඊයේ නොවෙයි. මේ ආපු හැම ආණ්ඩුවක්ම මේවා කල් තිබ්බා. හැම ආණ්ඩුවක්ම වගකියන්න ඕනෑ. හැම ආණ්ඩුවක්ම කියන්නේ, අපි ගිය ගමන් මේ ක්‍රමය වෙනස් කරනවා කියලා. පළාත් සභාවේදී, පළාත් සභාවේ ප්‍රශ්න ගැන කථා කරලා පළාත් සභාවට තැනක් ඕනෑයි කියලා පාර්ලිමේන්තුවට යන කිසිම කෙනෙක් පළාත් සභාව ගැන එහිදී වචනයක් කථා කරන්නේ නැහැ. මේක තමයි ක්‍රමය. මේ හැම පක්ෂයක්ම කළේ මේක කල් දැම්මා පමණයි. අද වර්තමාන ජනාධිපතිතුමා තමයි මේ ප්‍රශ්නයට ඉක්මන් විසඳුමක් දීලා මේ මැතිවරණ ඡන්ද ක්‍රමය වෙනස් කරන්න කටයුතු කරනවා කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. අද සමහර උදවිය කියනවා, අප්‍රේල් 23 වැනිදා වෙනකොට මේ සියල්ලම කරලා ඡන්දයකට

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

යන්න ඕනෑය කියලා. අද මේ රටේ මිනිස්සුන්ට ඡන්දයක් නොවෙයි ගරු සභාපතිතුමනි, අවශ්‍ය වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමා යම්කිසි පොරොන්දුවක් මිනිස්සුන්ට දුන්නා. මිනිස්සු බලාගෙන ඉන්නේ ඡන්ද නොවෙයි. පොරොන්දු ටික ඉෂ්ට කරන්න. ගරු සභාපතිතුමනි, අනිවාර්යයෙන්ම මේ ඡන්ද ක්‍රමය, ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය වෙනස් කරන්න පසුගිය දවස්වල රැස්වීම් ගණනාවක් ජනාධිපතිතුමා තිබ්බා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයන් එක්ක රැස්වීමක් තිබ්බා. ඒ රැස්වීමට සමහර පක්ෂවල නායකයන් සහභාගි වුණේ නැහැ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහභාගි වුණා. එතුමා මේකේ තිබුණු යම් යම් ප්‍රශ්න ඉදිරිපත් කළාම වර්තමාන ජනාධිපතිතුමා ඊට විසඳුම් ලබා දුන්නා. සියලු දෙනාම පිළිගත්තා. මේකට යම්කිසි කාලසීමාවක් අවශ්‍යයි. මේ 23 වැනිදා සිට මාසයකින් කරන්න පුළුවන්කමක් නැහැ. අඩුම තරමේ මාස තුනක්වත් මේ වැඩේට යනවා. අපි ගරු ජනාධිපතිතුමාට කියන්නේ, මේ මාස තුන ඉක්ම වුණාට කමක් නැහැ. මේ ඡන්ද ක්‍රමය වෙනස් කරලා මේ මැතිවරණය තියන්න කටයුතු කරන්න -

[සභාවේ ඝෝෂා]

මේක මගේ අදහස. තමුන්නාන්සේලාට පක්ෂ විධියට මට කතා කරන්න බැහැ. මගේ අදහස ගරු සභාපතිතුමනි, මම කථා කරන්නේ.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය මේ වේලාවේ වෙනස් නොවුණොත් ජීවිතයේ කිසිම දවසක මේ ක්‍රමය වෙනස් කරන්න ආණ්ඩුවක් කටයුතු කරන්නේ නැහැ. මේක සත්‍ය. මේවායින් අසාධාරණයට ලක් වුණු පුද්ගලයෙක් මම. මම 1994 පාර්ලිමේන්තු මැතිවරණයට මම කැස්බෑව ආසනයෙන් ඉදිරිපත් වුණා. මම වැඩි ඡන්ද 14,000 කින් කැස්බෑව ආසනය ජයග්‍රහණය කළා. නමුත් මේ අනුපාත ක්‍රමය නිසා මට පාර්ලිමේන්තු යන්න බැරි වුණා. හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ පාර්ලිමේන්තු මැතිවරණ දෙකකට මම ඉදිරිපත් වුණා. ඒ මැතිවරණ දෙකේදීත් හෝමාගම ආසනය ජයග්‍රහණය කළා. මට එදත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මේ ජරා ජීර්ණ ක්‍රමය නිසා අපි වාගේ මිනිස්සුන්ට මෙතැනට යන්න පුළුවන්කමක් නැහැ. අර කිව්වා වාගේ සල්ලි තිබෙන, යම් යම් දේවල්වලින් මුදල් උපයාගත්ත මිනිස්සු - තමුන්නාන්සේලා දන්නවා. මීට වාර කිහිපයකට පෙර පැවැති පළාත් සභා මැතිවරණයේදී අපි හැමදාම දෙවැනි ස්ථානයට නැත්නම් පළමුවැනි ස්ථානයට හිටපු මිනිස්සු. කොහෙන්වත් ආපු උදවිය. සල්ලි ආවේ කොහෙන්ද කියන එක අපි දන්නේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

සීය සීය එකතු කරලා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ මිනිස්සු තමයි මේකේ ප්‍රධාන තැන්වලට ආවේ. පළමුවැනියා දෙවැනියා වුණේ. සාධාරණව ඡන්ද කරපු මිනිස්සු නොවෙයි. සාධාරණව හම්බ කරපු මිනිස්සු නොවෙයි. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ ක්‍රමය අනිවාර්යයෙන්ම වෙනස් විය යුතුයි. මම කියන්නේ අද සුළු පක්ෂවලට මේ ක්‍රමය අනුව කිසිම අසාධාරණයක් වෙන්නේ නැහැ. ඒක පිළිඅරගෙන තිබෙනවා. එක්තරා පක්ෂයක් දෙකක් සන්ධානයේ රැස්වීම්වලට සහභාගි නොවුණාට ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සියලුම පක්ෂ පිළි අරගෙන තිබෙනවා, මේ ගමන යන්න ඕනෑ. මේ විධියට සිද්ධ වෙනවා කියන එක. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය අනිවාර්යයෙන් වෙනස් විය යුතුයි. මේ ක්‍රමය නිසා සාමාන්‍ය පුද්ගලයෙකුට පාර්ලිමේන්තුවට යන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා. අපි හැමදාම ගිහිල්ලා පාර්ලිමේන්තුවේ කෙළවරක නවතිනවා. දහ දෙනෙක් යන කොට දොළොස් වැනියා වෙනවා. නැත්නම් එකළොස් වැනියා වෙනවා. මේ ජීවිතයේ හැමදාම කොහෙන් හරි මිනිහෙක් දාලා, සල්ලි ටිකක් වියදම් කරලා ආවා නම් ඒ පුද්ගලයාට පාර්ලිමේන්තුවට යන්න පුළුවන්කම ලැබෙනවා. උදාහරණ ලෙස කියන්න පුළුවන් ප්‍රාදේශීය සභා. මේ ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වන පුද්ගලයන් ඉන්නවා. මංජු ශ්‍රී අරංගල මැතිතුමා, අපි දන්නවා. දීර්ඝ කාලයක් අපි ප්‍රාදේශීය සභා නියෝජනය කළා. 1991 ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් හැටියට මම කටයුතු කළා. අපි 1991 දේශපාලනය කළේ, අද වර්තමානයේ දේශපාලනය නොවෙයි. 1991 කැස්බෑව

ප්‍රාදේශීය සභාවේ සභාපති මම. එදා එක්සත් ජාතික පක්ෂයේ පාලන ක්‍රමයක් මේ රටේ තිබුණේ. කැස්බෑව ආසනයේ අමාත්‍යවරයා ගාමිණී ලොකුගේ මැතිතුමා. අපි එදා ජයග්‍රහණය කරලා සභාපති තනතුරට පත් වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. නමුත් එදා තත්ත්වය නොවෙයි, ගරු සභාපතිතුමනි අද වර්තමානයේ. අද වර්තමානයේ අපට නම් කියන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා, ඕනෑම මැතිවරණ කොට්ඨාශයක එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඇවිල්ලා ඡන්දය ඉල්ලලාත් ඒ මිනිහත් පළමුවැනියා වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බන්දුල ගුණවර්ධන.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මොකක්ද? මම මේ පළාත් පාලන ආයතන ගැන කථා කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

නම කියන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේ පළාත් පාලන මැතිවරණවලදී පසුගිය කාලයේ තමුන්නාන්සේ දකින්න ඇති. ගම්පහ දිස්ත්‍රික්කයෙන් දකින්න ඇති. හිටියේ යූ.ඇන්.පී සභාපති. අපේ පැත්තට ආවා. ඡන්දය ඉල්ලුවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් පළමුවැනියා. මේ සල්ලිවලින්. නරක වැඩ වලින් සල්ලි හොයලා, මිල මුදල් හොයලා වැරැදි විධියට ඒවා වියදම් කරන්න පුළුවන්කම. දුප්පත් අහිංසක මිනිහෙකුට ඒ තැනට යන්න බැහැ. ඒ නිසා මේ ක්‍රමය ඉතාමත්ම ඉක්මණින් නවත්වන්න සිද්ධ වෙනවා. අපි පසුගිය මැතිවරණ වේලාවේදී ඡන්ද ප්‍රතිඵල කිව්වාම එක්තරා පුවත්පතක තිබුණා, පාන්දර එක වෙනකොටත් ගාමිණී තිලකසිරි පාර්ලිමේන්තුවේ කියලා. අදත් තිබෙනවා. මම මේ කියන්නේ පහුවදා පත්තරේ තිබෙනවා. පාන්දර වෙනකොට නැහැ. ඒක වෙනම ප්‍රශ්නයක්. නමුත් මම හිතන්නේ නැහැ, ආයේ එවැනි දේවල් සිද්ධ වෙයි කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මේ ක්‍රමය අනිවාර්යයෙන් වෙනස් විය යුතුයි. මේ ක්‍රමය වෙනස් කරලා පාර්ලිමේන්තු මැතිවරණය තියන්න ඕනෑ. ඉන් අනතුරුව පළාත් සභා, ප්‍රාදේශීය සභා සියල්ලම මේ ක්‍රමය අයින් කරලා අපි මේ කටයුතු කරන්න වැඩ සැලසීමට අපේ අනුමැතිය ලබා දෙනවා කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.17]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු මැතිවරණය පමණක් නොවෙයි. මේ පවත්වන මැතිවරණ ක්‍රමයේ මනාප ක්‍රමය වෙනස් කරලා ආසන මට්ටමට යා යුතුයි කියන අපේ ගරු විපක්ෂ නායකතුමා ගෙනෙන ලද යෝජනාව අතිශයින්ම කාලෝචිත යෝජනාවක් හැටියට ප්‍රකාශ කරමින් මගේ කථාව පටන් ගන්න බලාපොරොත්තු වෙන්නේ. අද මෙතැන කථා කරපු සෑම දෙනාම කථා කළේ පවතින මැතිවරණ ක්‍රමයට වඩා ආසන මට්ටමේ මැතිවරණ ක්‍රමයක් සුදුසුයි කියලා. ඒක අද අපි විතරක් නොවෙයි, සමස්ත ජනතාවම පිළිගත්ත දෙයක්. සෑම අවස්ථාවකම. විශේෂයෙන් පසුගිය ජනාධිපතිවරණයේදී රැව්පිළි රැව් දුන්න දෙයක් තමයි ආසනයට වගකියන මන්ත්‍රීවරයෙක් පත්විය යුතුයි කියලා. අද මේ ක්‍රමය තුළ ආසනයට වග කියන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරුන් මනාප ක්‍රමයෙන් පත් වෙලා තමන්ගේ ආසනයෙන් ජනතාව ආවාම කියනවා අපි තමුන්නාන්සේලාගේ ඡන්දයෙන් නොවෙයි, වෙනත් ආසනවල ඡන්දයෙන් පත් වුණේ. ඒ නිසා තමුන්නාන්සේලාට විතරක් නොවෙයි, තවත් වැඩ කරන්න මිනිස්සු ඉන්නවා කියලා. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ නිසා සමහර දේශපාලඥයන්ට එන ප්‍රශ්නවලින් කර අරින්න අවකාශයක් බවට මේ වැඩ පිළිවෙළ යොදාගෙන තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම මේ මනාප ක්‍රමයට යන වියදම දිහා බැලුවාම අතිවිශාල මුදල් කන්දරාවක් වියදම් කරනවා. සමහර පත්වන මන්ත්‍රීවරු වියදම් කරන මුදල දිහා බැලුවාම පළාත් සභාවට අපි ගණන් කරලා බැලුවොත් පළාත් සභාවේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙකුට ලැබෙන්නේ ලක්ෂ 35 යි. අපේ අවුරුදු කාලය තුළම මේ period එකට ලැබෙන මුදලට වැඩිය සමහර මන්ත්‍රීවරු ඡන්දයට වියදම් කරලා, මේ ධුරයට

[ගරු පී.ඩී.අබේරත්න]

පත් වෙන්න කටයුතු කරනවා. පාර්ලිමේන්තුවෙත් ඒ වාගේ. සමහර අය කෝටි 50, 60 වියදම් කරලා පාර්ලිමේන්තුවට පත් වෙනවා. නමුත් මම හිතනවා, ඒ අයට ජනතාවට සේවය කරන්න එච්චර ප්‍රතිපාදන ලැබෙන්නේ නැහැ. ඒ නිසා මෙය මුදල් වියදම් කරන ක්‍රමයක් බවට පත් වෙලා තිබෙනවා වාගේම මැර බලය, ධන බලයට යටත් වීමක්, මන්ත්‍රීවරු පත්වීමක්, අවස්ථාවක් වෙලා තිබෙනවා. සමහර මන්ත්‍රීවරු රටේ විශාල ධනපතීන්ගේ ඉත්තන් බවට පත් වෙනවා. ඒ තත්ත්වය අපි දැකලා තිබෙන දෙයක්. ඒ නිසා මන්ත්‍රීවරයා පත් වුණාට පස්සේ තමන්ට උවමනා දේ නොවෙයි. යම් යම් මැරවරයින්ගේ, යම් යම් ධන කුවේරයන්ගේ කථා බහට අවනත වෙලා ඒ කටයුතු කිරීම තුළින් සමාජයේ විශාල අසාධාරණයක් වෙනවා.

ඒ වාගේම පක්ෂය තුළ තිබෙන සමගිය. ඉස්සර, මේ මනාප ක්‍රමය එන්න ඉස්සර වෙලා අපි දන්නවා ආසනයක මන්ත්‍රීවරයෙක් රටින් බැහැරව යනවා නම්, තමුන්ගේ ආසනය අල්ලපු ආසනයේ මන්ත්‍රීවරයාට වැඩ බලන්න දෙනවා . අද එහෙම වැඩ බලන්න දීලා ගියොත් එයාර්පෝට් එකෙන් බහින්න ලැබෙන්නෙත් නැහැ. මිනිහා, ආසනය අල්ලගෙන ඉවරයි. ඒකයි තත්ත්වය. අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද එහෙම තමන්ගේ එකම පක්ෂය තුළ මන්ත්‍රීවරුන්ගේ සමගියක් නැහැ. ඒ මන්ත්‍රීවරු අතර තිබෙන අසමගිය තුළින් ගමේ විශාල බිඳීමකට පත් වෙලා තිබෙනවා. සෑම පක්ෂයක් තුළම, සෑම ගමකම කණ්ඩායම් බවට පත් වෙලා තිබෙනවා. මේක ජාතික සමගිය ගොඩ නැඟීමටත් ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමාගේ අවධානයට යොමු කරනවා. දැන් අපි පළාත් සභා මන්ත්‍රීවරු දිහා බැලුවාම අපි ඉන්නේ විපක්ෂයේ. අපට ලැබෙන්නේ ලක්ෂ 35 යි. ආණ්ඩු පක්ෂයේ අයට ඊට වැඩිය මුදල් හම්බ වෙනවා. අපේ මේ ලක්ෂ 35, මම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් තිබෙනවා. මේ මුදල් සෑම තැනකටම බෙදන්න ගියාම ඉතා පොඩි මුදලක් බෙදනවා. නිවාස ආධාර කියලා අපි බෙදනවා. සිමෙන්ති කොට්ට දෙකක් එක පුද්ගලයෙකුට දෙනවා. ගරු සභාපතිතුමනි, මේ වැඩ පිළිවෙළ තුළින් ක්‍රියාත්මක වන දේ නිසා රජයේ මුදල් විශාල අවභාවිතයක් වෙනවා. සිමෙන්ති කොට්ට දෙකක් කියන්නේ වැඩක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත් මන්ත්‍රීවරුන්ට විශාල ඉල්ලුමක් තිබෙන කොට කරන දෙයක් තමයි, සමහර මන්ත්‍රීවරු සිමෙන්ති කොට්ට දෙක දෙක බෙදාගෙන යනවා. මේ සිමෙන්ති කොට්ට දෙකෙන් කරන්න පුළුවන් දෙයක් නැහැ, ගෙයක් හදන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වැලි දෙන්නේ නැහැ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

වැලි නැහැ. සිමෙන්ති විතරයි. ඉතින් මේ සිමෙන්ති කොට්ට දෙක විකුණ ගන්නවා. විකුණ ගෙන වෙන මොනවාට හරි ගන්නවා. ඉතින් මේ තුළින් රජයේ මුදල් විශාල අවභාවිතාවකට යනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි විශාල ප්‍රදේශයක් තුළ නියෝජනය කරනකොට ලැබෙන ඒ මුදලින් වැඩක් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් ආසනයකට පමණක් සීමා වෙනවා නම්, මීට වඩා ජනතාවට වැඩක් කරන්න පොඩ්ඩක් අවකාශයක් ලැබෙනවා. ඒ ගැනත් මම අවධානය යොමු කරනවා. රටේ සංවර්ධනයට ඒක විශාල පාඩුවක් වෙනවා. ඒ වාගේම තව එකක් තමයි ගරු සභාපතිතුමනි, සමහර ආසනවල - දැන් මට ඉස්සෙල්ලා කථා කරපු ගරු ඇමතිතුමා කිව්වා වාගේ මනාප ක්‍රමය බැලුවාම යම් කෙනෙක් ආසනයෙන් වැඩිම මනාප ගන්නවා. නමුත් ඒ ගත්ත කෙනා නොවෙයි පත් වෙන්නේ. තමුන්ගේ ආසනයෙන් අඩුවෙන් අරගෙන පිට ආසනයෙන් එකතු කරගෙන ඔක්කෝම සල්ලි වියදම් කරලා, බලය යොදලා ගත්තු එක්කෙනා පාර්ලිමේන්තුවට යනවා. පළාත් සභාව එනවා. අනික් අය ගෙදර නවතිනවා. වැඩියෙන් ආසන නැහැයි කියලා. එතකොට ආසනය ගැන අවබෝධයක් තිබෙන, ආසනය ගැන දන්න, ආසනයේ ජනතාව කැමැති පුද්ගලයාට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ජනතා පරමාධිපත්‍ය හරියට ක්‍රියාත්මක වන්නේ නැති අවස්ථාවක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි මම මීට ඉස්සෙල්ලා කිව්වා වාගේ පක්ෂ මාරු කිරීමේ අවස්ථාව. ඉතාම බරපතළ වැරැද්දක් ඒක. අද පක්ෂ මාරු කිරීමට අවස්ථාව දීලා තිබෙනවා. ඒ තුළින් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු පත් වෙලා ශ්‍රී ලංකා

නිදහස් පක්ෂයට යනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පත් වෙලා එක්සත් ජාතික පක්ෂයට එනවා. මේ මාරුව එකම ඡන්ද දායකයෙක්වත් අනුමත කරන්නේ නැහැ. මම අනික් පැත්තට ගියොත් එහෙම මට ඡන්දය දුන්නු කිසිම කෙනෙක් අනුමත කරන්නේ නැහැ. නමුත් මගේ තනි මතයට යන්නේ. ඒක සදාචාර සම්පන්නත් නැහැ. ඒක නීතියට ගරු කිරීමක් වෙන්නෙත් නැහැ. මොකද හේතුව, දහස් ගණනක් ඡන්දය අරගෙන අනික් පැත්තට මාරු වෙනකොට ජනතාව කැමැති නැතිව, ඒක ජනතා පරමාධිපත්‍ය අමු අමුවේ උල්ලංඝණය කිරීමක් වෙනවා. මේ තත්ත්වය තුළ අපේ රටේ ජනතාවට තිබෙන බලය අනිසි විධියට යොදවන්න පුළුවන් අවකාශයක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මේ මනාප ක්‍රමය තුළ මේ රටේ මැර බලය හිස ඔසවලා තිබෙනවා. අද සමහර කුඩු ව්‍යාපාරිකයන් කුඩු ව්‍යාපාරය ගෙනි යන්න සම්පූර්ණ දේශපාලන අතකොළුවක් බවට පත් වෙලා තිබෙනවා. අද සෑම තැනකම කුඩුකාරයෙකුගෙන් ඇහුවොත් කියයි දේශපාලන පසුබිමක් තුළ තමයි ඒ ව්‍යාපාරය කරගෙන යන්නේ කියලා. පසුගිය කාලයේ එතනෝල් ව්‍යාපාරයක් තිබුණා. බාර් වැඩ පිළිවෙළ. මේ රටට ජනතාවට අහිතකර සෑම දෙයක්ම ක්‍රියාත්මක කිරීමේදී දේශපාලඥයන් අත පොවලා මේවා මුදල් ගැනීමේ ව්‍යාපාර බවට පත් වෙලාතිබෙනවා.

විශාල මුදල් කන්දරාවක් වියදම් කරලා ඡන්දයට එන පුද්ගලයන්ගෙන් හුඟදෙනෙක්, 80% ක්ම කරන්න හදන්නේ මේකට එන්නේ සල්ලි හම්බ කරන්න. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පළාත් සභාවට ඇවිල්ලා අයථාකරණයෙන් මුදල් සොයන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ විශාල මුදලක් වියදම් කරන නිසා. මේ ආසන මට්ටමට ආවොත් විශාල මුදලක් වියදම් කරන්න වෙන්නේ නැහැ. ඒ වාගේම තමුන්ගේ ආසනය ගැන හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. මන්ත්‍රීවරයෙකුට ඡන්ද කාලය තුළ පුද්ගලිකව ගෙයින් ගෙට ගිහිල්ලා කථා කරන්න අවකාශය ලැබෙනවා. ජනතාව හඳුනගන්න අවස්ථාවක් ලැබෙනවා. ප්‍රදේශය ගැන අවබෝධයක් ලැබෙනවා. ජනතාවගේ අඩුපාඩු ගැන හොඳ අවබෝධයක් ලබා ගන්න හැකියාව ලැබෙනවා. ඒ තුළින් ගමට වැඩ කරන්න පුළුවන්, ප්‍රදේශයට වැඩ කරන්න පුළුවන් හොඳ මන්ත්‍රීවරයෙක් ඉබේම නිර්මාණය වෙනවා. අද ඒ තත්ත්වය ගිලිහිලා ගිහිල්ලා තිබෙනවා. ප්‍රදේශය ගැන අවබෝධයක් නැහැ. මොකුත් නැහැ. මුදල් ටිකක් වියදම් කරලා යම්කිසි කණ්ඩායමක් අරගෙන මේ පත් වෙලා එන අය ඒ ගැන අවබෝධයක් නැති නිසා ප්‍රදේශයට හරි දෙයක් වෙන්නේ නැහැ. තව එකක් තමයි ආසනවල යම් යම් අය එකතු වෙලා පිටින් පුද්ගලයෙක් ගෙනිහිල්ලා විශාල ජනතාවක් ඒකරාශි කරලා එයා ජයග්‍රහණය කළාට පස්සේ, ඒ ආපු පුද්ගලයින්ට කිසිම වැඩක් කෙරෙන්නේ නැහැ. මොකද වෙන්නේ? ජයග්‍රහණය කළොත් ගෙනාපු පුද්ගලයාට විතරක් වැඩක් කර ගන්නවා. ගමට ප්‍රදේශයට වැඩක් කෙරෙන්නේ නැහැ. ඒ තුළින් ජනතාව නොමඟ යවලා ජනතාව අමාරුවේ දාලා ප්‍රදේශයට වැඩක් කෙරෙන්නේ නැහැ. යම් යම් පුද්ගලයින් මුදල් ගරා ගැනීමේ අවකාශයක් බවට පත් කර ගනිමින් තිබෙනවා.

මේ වාගේ අඩු පාඩු විශාල රැසක් ක්‍රියාත්මක වෙන මේ මනාප ක්‍රමය ඉවත් කරලා ආසන මට්ටමින් ඡන්දය තියලා පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සෑම එකකටම ක්‍රියාත්මක කළ යුතුයි කියන යෝජනාව කරන ගමන්, අපේ නව ජනාධිපතිතුමා දින 100 ක් තුළ මේ මැතිවරණයකට යනවා කියන පොරොන්දුවක් පිට ඇවිල්ලා තිබෙන්නේ. වර්තමාන ජනාධිපතිතුමා පත් කිරීමේ වැඩි කාර්ය භාරයක් කළේ එක්සත් ජාතික පක්ෂය. ඒක කාටවත් නැහැයි කියන්න පුළුවන්කමක් නැහැ. ඒකේ අපි කොටස්කාරයෝ වෙලා තිබෙනවා. අපට බොරු පොරොන්දු දෙන්න බැහැ. අපට බැහැ එතුමා බොරු පොරොන්දුවක් දුන්නා කියන්නවත්. අපි බොරු පොරොන්දුවක් දුන්නා කියන්නවත්. ඒ නිසා අපි එක හෙළාම කියා සිටින්නේ අප්‍රේල් මාසයේ 23 වැනිදා වනකොට දින 100 අවසන් වෙනවා. මේ පාර්ලිමේන්තුව විසිරුවලා පාර්ලිමේන්තු ඡන්දයකට යා යුතුමයි. ඒ තිබෙන ඡන්දය ආසන මට්ටමින් තිබිය යුතුමයි කියලා යෝජනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sumith Lal Mendis M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.26]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙනෙන ලද යෝජනාව මම හිතන්නේ ඉතාමත් වැදගත්, කාලීන යෝජනාවක් හැටියට සලකන්න ඕනෑ යෝජනාවක්. විශේෂයෙන්ම දින 100 වැඩ පිළිවෙළ ගැන ගොඩක් දෙනෙක් කථා කළා. දින 100 ට නොවෙයි මහජනතාව ඡන්දය දුන්නේ. වැඩ පිළිවෙළට. ඒක නිසා මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ පැවතුණු ක්‍රමය වෙනස් කරලා දූෂණයට, වංචාවට, හොරකමට තිත තියන්න ඕනෑය කියන අලුත් දේශපාලන සංස්කෘතියක් බිහි කරන්න. ඒ වැඩ පිළිවෙළ තුළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා හැටියට ඉදිරිපත් වුණාට ජනතාව ඡන්දය පාවිච්චි කළේ, වැඩ පිළිවෙළට. ඒක නිසා අපි මතක් කරලා දෙන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ තුළ මේ ඡන්ද ක්‍රමය ගැන ඉතාමත්ම පැහැදිලිව කියලා තිබෙනවා. මම හිතන්නේ අපි, ඒ වාගේම සෑම මහජන නියෝජිතයෙක්ම වේදිකාවල්වල කිව්වේ මේ තිබෙන දූෂිත ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඕනෑය කියලා. ඒ යෝජනාවට අනුව තමයි බහුතරයක් ජනතාව පුද්ගලයා බලන්නේ නැතිව මේ යෝජනාවලියට ඡන්දය දුන්නේ. ඒක නිසා මම විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඡන්ද ක්‍රමය වෙනස් කළේ නැත්නම් අපි ජනතාව දුන්න වරම කඩ කරනවා කියන එක තමයි මගේ පෞද්ගලික විශ්වාසය. ඒක නිසා අපි මොනවා නොකළත් ජනතාව බලාපොරොත්තු වෙන්නේ මේ වෙනස්කම මේ රට තුළ ඇති කළ යුතුයි කියලා. ඒක නිසා මම හිතන්නේ මේ යෝජනාව ගෙන ඒම ගැන අපේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. අපේ එක්සත් ජාතික පක්ෂයේත් මතය වෙලා තිබුණේ, දැනුත් තිබෙන්නේ මේ ඡන්ද ක්‍රමය වෙනස් කළ යුතුයි කියලා. ඒකට මම හිතන්නේ මේ දින 100 කියන්නේ, දින 100 ඇතුළත කරනවාද නැද්ද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. මේ ක්‍රමය වෙනස් කරනවා කියන එක. ඒක නිසා දින 100 න් තව සුමානයක් වැඩිපුර අරන් හරි මේ ඡන්ද ක්‍රමය වෙනස් කරලා අලුත් ඡන්ද ක්‍රමයකට, ජනතාව බලාපොරොත්තු වුණු අපේක්ෂාව, ජනතාවගේ බලාපොරොත්තුව ඉෂ්ට සිද්ධ කරන්න මම හිතන්නේ අපි කවුරුත් දැන් ආණ්ඩු කරන පක්ෂයත්, ජනාධිපතිවරයාත් බැඳිලා ඉන්නවා කියන එක ඉතාමත්ම පැහැදිලිව මතක් කරලා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොඩක් දෙනෙක් කථා කළා, සල්ලිත් එක්ක, මැර බලයත් එක්ක මේ තිබෙන ක්‍රමය අනුව එක එක අපේක්ෂකයන් පත් කරගන්න අවස්ථාව තිබෙනවා කියලා. මම හිතන්නේ ඊට වැඩිය භයානක වෙන්නේ සල්ලිවලටත් වැඩිය, මැර බලයටත් වැඩිය මාධ්‍ය තුළින් අද මේ තිබෙන ක්‍රමය අනුව මන්ත්‍රීවරු පත් කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. සමහර මාධ්‍ය එක එක අපේක්ෂකයන් තෝරාගෙන, සමහර මාධ්‍ය එක එක පුද්ගලයන් තෝරාගෙන තමන්ට ඕනෑ අය පත් කරගන්න මේ ඡන්ද ක්‍රමය තුළින් අද ඉතාම පැහැදිලිව පාර්ලිමේන්තුවට යවන්නෙත්,ඒ වාගේම පළාත් සභාවට යවන්නෙත්, නගර සභාවට යවන්නෙත් කවුද කියලා අද තීරණය කරන්නේ මාධ්‍ය බවට පත් වෙලා තිබෙනවා. ඒක නිසා මම ඉතාමත් ඕනෑකමින් කියනවා. මේ කොට්ඨාශ ක්‍රමය එනවා කියන්නේ, ඒ බලයත් යම්තාක් දුරට නැති වෙලා යනවා. ඒක නිසා ජනතාව එක එක අංශවලට, එක එක පුද්ගලයන්ට පොළඹවන්නේ නැතිව මහජනතාවට තීරණය කරන්න පුළුවන් තමන්ගේ කොට්ඨාශයේ ඉන්න මන්ත්‍රීවරයා වැඩ කරන හැටියට තමන් කොහොමද හැසිරෙන්නේ, තමන් කොහොමද බලය ඒ කොට්ඨාශවලට පාවිච්චි කරන්නේ කියලා ඒ තීරණය, තීන්දුව අරගෙන ඒ කොට්ඨාශයට මන්ත්‍රී කෙනෙක් පත් කරගන්න, මහජන නියෝජිතයෙක් පත් කරගන්න හැකියාව ලැබෙනවා, මේ කොට්ඨාශ ක්‍රමය නැවත වරක් ස්ථාපිත කිරීමෙන්. ඒක නිසා මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම පවතින වත්මන් රජයෙනුත්, අපි බහුතරයක් එකතු වෙලා පත් කරගත්තු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙනුත් මේ මහජනතාව දුන්න වරම ඒ ආකාරයෙන්ම ඉෂ්ට සිද්ධ කරයි කියලා. මේ දින 100 ඇතුළත නොවෙයි වැදගත් වෙන්නේ. ඒ ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කරන්න වහාම කටයුතු කරන්නය කියලා අපි ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මම හිතන්නේ වඩා දීර්ඝව කථා කරන්න අවශ්‍ය නැහැ. මේක අපි ඉස්සර ක්‍රමයකට යන්න ඕනෑත් නැහැ. අලුත් ක්‍රමයක් ගැන කථා කරන්න ඕනෑත් නැහැ. අපි දැන් කවුරුත් එකඟ වෙලා තිබෙන

ක්‍රමයක් තිබෙනවා. පසුගිය රජය තුළින් ගෙනෙන ලද ඒ කමිටුව තුළින් ගෙනාපු යෝජනාවලියක් තිබෙනවා. ඒකට එක්සත් ජාතික පක්ෂයත් එකඟ වුණා. ඒ සියලුදෙනාම එකඟ වුණු ක්‍රමයක් මේක. සියලුම පක්ෂ එකඟ වුණු ක්‍රමයක් තිබෙනවා. ඉතින් මේ ක්‍රමයේ සුළු සුළු වෙනස්කම් තිබෙනවා නම් වෙනස්කම් කරලා, මේ ක්‍රමය ඉතාමත්ම කඩිනමින් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරගෙන ඊළඟ ඡන්දය මේ අලුත් ක්‍රමය අනුව තියලා මහජනතාවගේ අපේක්ෂාව, බලාපොරොත්තුව ඉෂ්ට සිද්ධ කරලා දෙන්න මේ රජය ක්‍රියා කරයි කියලා මම විශ්වාස කරනවා.

ඒ එක්කම පසුගිය මැතිවරණ ක්‍රමය ගැන නොයෙකුත් චෝදනා තිබෙනවා. නමුත් ඒකෙත් හොඳ පැති තිබුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ ජනවාර්ගික ප්‍රශ්නය මුල් කරගෙන තමයි මේ මනාප ක්‍රමය ගෙනත් තිබුණේ. නමුත් අද වනකොට මේක කාලෝචිත නොවන ක්‍රමයක් හැටියට පත් වෙලා තිබෙනවා. අද අපේ රටේ හැම අතින්ම සාමය ඇති වෙලා තිබෙනවා. ඒක නිසා සෑම කෙනෙක්ටම මේ රට තුළ ජීවත් වෙන්න පුළුවන් එක රටක් හැටියට සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් අද වන විට උදා වෙලා තිබෙනවා. දේශපාලන වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය අද ස්ථාපිත වෙලා තිබෙනවා. ස්වාධීන කොමිෂන් සභා ටික අද පත් වී ගෙන යනවා. ඒ නිසා අද මම හිතන්නේ අලුත් ක්‍රමයකට, අලුත් දේශපාලන සංස්කෘතියකට යන්න අපේ රට සූදානම් කියලා මම ප්‍රකාශ කරමින්, ඔබතුමාට, විශේෂයෙන්ම මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12.32]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා මම හිතන්නේ ඉතාමත්ම හොඳ යෝජනාවක් ගෙනාවා. මොකද මම සාමාන්‍යයෙන් කථා කරන්නේ නැහැ. නමුත් යෝජනාව ගෙනාවට පස්සේ මට හිතුනා ටිකක් මේකට කථා කරන්න ඕනෑය කියලා. මොකද, මේ ටිකේ මහ පොළවේ ක්‍රියාත්මක වේගෙන යන යෝජනාවක්. මොකද, අපි දැකලා තිබෙනවා පළාත් සභාවේ ගොඩාක් යෝජනා ගෙනාවත් ඒ යෝජනා ගොඩාක් වේලාවට කථාවට විතරක් සීමා වෙනවා. මම හිතන්නේ ක්‍රියාත්මක මට්ටමේ නැහැ. ඒ නිසා තමයි මම තීන්දු කළේ, මේ යෝජනාව අද පක්ෂ නායක මට්ටමිනුත්, මුළු රටෙත් මම හිතන්නේ පසුගිය මාසය තුළත්, මේ මාසය තුළත් ඉතාමත් කථා බහට ලක්වෙන යෝජනාවක්. මම හිතන්නේ විවිධ නායකයන්, විවිධ කාලවල විවිධ උත්සාහයන් ගත්තා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳව. මම හිතන්නේ ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා, මේ මැතිවරණයේ තිබෙන දෝෂ ගැන විශාල විධියට කථා කළා. මම ඒ නිසා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත් ගොඩක් කාලයකින් මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙනෙන ලද යෝජනාවට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් ඉතාමත් වැදගත් අදහස් ටිකක් ඉදිරිපත් කළා. නේද? ඉතින් අලුත් අදහස් ඉදිරිපත් කිරීම පිළිබඳවත් අපි සන්තෝෂ වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එතුමා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම කිව්වේ එතුමා වැදගත් අදහස් ටිකක් ඉදිරිපත් කළා කියලා. එතුමාගේ පියා ස්වදේශ කටයුතු ඇමැතිතුමා නිසා මම හිතන්නේ කවුරු හරි දැන් අදහස් ටිකක් ලියලා දෙනවා. මේ සභාවේ යෝජනා කරන්න. ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ප්‍රධාන ගැටලුව තිබෙන්නේ, මෙතැන කවුරුවත් කථා නොකරපු ගැටලුවක් පිළිබඳව මතු කරන්න. මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය තුළ ගත්තාම මුස්ලිම් ඡන්ද මම හිතන්නේ අනූ දාහක්, අසූ දාහක් විතර තිබෙනවා. මම හිතන්නේ, ද්‍රවිඩ ඡන්ද 35,000 ක් විතර තිබෙනවා. 35,000 කට වැඩියි. එතකොට අපේ මේ පරණ ක්‍රමය තුළ මේ තරග වදින පක්ෂ දෙක තුනට අපේක්ෂකයන් ඒ පක්ෂවලින් ඉදිරිපත් වෙනවා. පළාත් සභාව ගත්තාමත්, පාර්ලිමේන්තුව ගත්තාමත් ඉදිරිපත් වෙනවා. හැබැයි, දිනන පරදින එක නොවෙයි මම මේ කථා කරන්නේ. අවස්ථාවක් තිබුණා. නමුත් මේ අලුත් කේවල ක්‍රමය නිසා සමානුපාතික ක්‍රමය තුළ යූ.ඇන්.පී. ය හෝ, එක්සත් ජනතා නිදහස් සන්ධානය හෝ, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන පක්ෂ නියෝජනය කරන ඒ සුළු පක්ෂ

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

නියෝජනය කරන ඒ මුස්ලිම් කෙනෙක් හෝ හින්දු කෙනෙක් හෝ හිටියොත් ඒ ගොල්ලන්ට මේ ක්‍රමය තුළ අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එතකොට අපි ඒ ගොල්ලන්ව ආපහු පොළඹවනවා, ආපහු ඔයා යන්න මුස්ලිම් පක්ෂයක් නියෝජනය කරන්න. ආපහු ඔයා ද්‍රවිඩ පක්ෂයක් නියෝජනය කරන තැනට යන්න. දැන් අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ආසන 13 ගත්තාම මේ ආසනවල තිබෙන සංයුතිය අනුව කවදාවත් මුස්ලිම් කෙනෙක්ට හෝ ද්‍රවිඩ කෙනෙක්ට ආසනයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් විශේෂයෙන් අවධානය යොමු කරනවා. මම දන්නේ නැහැ ඒ පක්ෂයේ ප්‍රධාන ලේකම්ට, ඉස්සර සමහර මැතිවරණවලදී අවස්ථාවක් තිබෙනවා. ඒ දිනන ක්‍රමය තුළඑක්කෙනෙක්, දෙන්නෙක් පත් කරන්න පුළුවන්. නමුත් මේ ක්‍රමය තුළ යෝජනා කරලා තිබෙන්නේ, වඩාත් සාධාරණ ක්‍රමවේදයක් කියන එකත් මම පිළිගන්නවා. ඒ කියන්නේ මේකේ තෝරන්නේ, සමානුපාතික ක්‍රමයට තෝරන්නේ සුළු ජාතීන්ට අවාසියක් නොවන විධියට පරාජිතයන්ගේ ඡන්ද ටික එකතු කරලා ප්‍රතිශතයක් විධියට බෙදනවා. ඒක ඉතාමත්ම හොඳයි. ඒකේ කිසි වරදක් අපි දකින්නේ නැහැ. නමුත් අතන පොඩි අඩුපාඩුවකුත් තිබෙනවා. මේකට මේ රටේ මැතිවරණ ක්‍රමය පිළිබඳව හදාරපු, ඒ පිළිබඳව දැනුමක් තිබෙන අය මම හිතන්නේ, මේ පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ එක්කම මම පැහැදිලිව කියන්න ඕනෑ. ගොඩාක් අය මෙතැන ඉදිරිපත් කළා, මේ අනුපාත ක්‍රමයට ඡන්දය ඉල්ලපුවාම අපට දිනන්න බැහැ. හැබැයි, කොට්ඨාශ ක්‍රමයට ආපුවාම දිනන්න පුළුවන් කියලා. මම ඉතාමත් සන්තෝෂයෙන් කියනවා. මම හැමදාමත්, ඔබතුමන්ලා දන්නවා ගම්පහ දිස්ත්‍රික්කයේ නොවෙයි ලංකාවේ වැඩියෙන්ම පරදින්නේ වත්තල. මම නියෝජනය කරන කොට්ඨාශය. හැබැයි, ඔබතුමන්ලා දන්නවා හැමදාමත් මම මීගමුවෙන් ඉල්ලද්දී හැමදාම දින්නා. වත්තලට ගිහිල්ලා හැමදාම නායකත්වය දෙද්දී වත්තල හැමදාම දින්නා. ඒ නිසා හැමදාම විශාල විධියට පරදින මේ මැතිවරණ ක්‍රමය තුළ, මීගමුව, වත්තල, ජා-ඇළ, කටාන මේ ප්‍රදේශ නියෝජනය කරන පුද්ගලයෙක් විධියට මම ඉතාමත් සතුටු වෙනවා. මේ මැතිවරණ ක්‍රමය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය යටතේ මේ ආණ්ඩුව සහයෝගය දීලා,

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අගමැතිතුමා කියලා කියන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔව්. අගමැතිතුමා. විශේෂයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සහයෝගය නැතිව මේ කිසි දෙයක් කරන්න බැහැ. මොකද පාර්ලිමේන්තුවේ බහුතර සංයුතිය තිබෙන්නේ අපට. මොකද මම ඒක කිව්වේ නැත්තේ අගමැතිතුමා ටිකක් මේ ක්‍රමයට කැමැති නැහැයි කියන එක මම දන්න නිසා. නමුත් අපි තමා කිව්වේ, විධායක ජනාධිපති ධූරයේ බලතල අඩු කරනවා හා සමානව මේ කේවළ ක්‍රමය සහ සමානුපාතික ක්‍රමය ගෙනෙන්න ඕනෑය කියලා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා. තමුන්නාන්සේලාගේ දින 100 වැඩ සටහන තුළ හොඳ දේවල් අපි දකිනවා. අපි පසුගිය ටිකේ දැක්ක ඉතාමත් හොඳ ලක්ෂණයක් තමයි, ඉස්සර විපක්ෂයේ සිටිද්දී සියලු දේට විරුද්ධ වෙනවා. හැබැයි, අද එහෙම නැහැ. අද එක්සත් ජනතා නිදහස් සන්ධානය පාර්ලිමේන්තුව තුළ දින 100 තමුන්නාන්සේලාගේ වැඩ සටහනට සහයෝගය දෙනවා. තමුන්නාන්සේලාගේ දින 100 ගේන ඉතිරි වැඩ එකින් එක මේ මැතිවරණ ක්‍රමය, විධායක බලතල අඩු කිරීම, ඊළඟට කොමිෂන් සභා පත් කිරීම, විගණන පනත මේ සියල්ලට සහයෝගය දෙනවා. හැබැයි, අනික් පැත්තෙන් ආණ්ඩුව කරන වැරැදිවලට විරුද්ධව නැඟී සිටිනවා. මේක කවදාවත් ඉතිහාසයේ තිබුණේ නැහැ. මම කියන්නේ ඒකයි. හොඳ ලක්ෂණයක්. හොඳ එකට හොඳ කියනවා. අපි හැමදාම අපේ අදහස් ප්‍රකාශ කරන්නේ, හොඳ එකට හොඳ කියනවා. මැතිවරණ ක්‍රමය වෙනස් කරන එක හොඳයි. විධායක බලතල අඩු කරන එක හොඳයි. විගණන පනත ගේන එක හොඳයි. ඖෂධ පනත ගේන එක හොඳයි. මේවා මහ පොළවේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේක දැන් ගෙනැල්ලා තිබෙනවා. අපි දන්නේ නැහැ, හෙට අනිද්දා මොනවා වෙයිද කියලා. සමහර අය බලයි තමන්ගේ කෝටා එක මේකෙන් ලැබෙනවාද? මේ තිබුණු විධියට වඩා එකක් හරි අපට ගන්න පුළුවන්ද කියලා සමහර පක්ෂ බලයි. සමහර පුද්ගලයන් බලයි. ඒක නොවෙයි අපි බලන්න ඕනෑ. මේ රටට වඩා වැදගත්, මේ රටට මෙපමණ කල් මම හිතන්නේ - අපි මේ මැතිවරණ ක්‍රමය ගෙනාපු අය ගැන දොස් කියන්නේ නැහැ. මේ මැතිවරණ ක්‍රමයේත්

සාධාරණ ගොඩාක් දේවල් තිබෙනවා. නියෝජනය පිළිබඳව. නමුත් අනික් පැත්තෙන් දූෂණ, ඔය කියන සියලු දේවල් තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් අපි පැහැදිලිව කියනවා. මේ ආණ්ඩුව කරන හොඳ දේවල්වලට අපි සහයෝගය දෙනවා. ඒ වාගේම හොඳ නැති දේවල්වලට අපි විරුද්ධ වෙනවා. පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් විධියට.

ඒ නිසා ගොඩාක් කාලයකින් පස්සේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රටට අලුත් දෙයක් හඳුන්වලා දීලා තිබෙනවා. අලුත් වැඩ පිළිවෙළක් හඳුන්වලා දීලා තිබෙනවා. සමහර වේලාවට මම හිතන්නේ, දේශපාලනය කරන අපටත් යන වැඩ පිළිවෙළ පිළිබඳව හිතාගන්න බැහැ. සුමානයෙන් සුමානයට වෙනස් වෙනවා. මේක අලුත් වැඩ සටහනක්. අලුත් වැඩ පිළිවෙළක්. විපක්ෂ නායකතුමාත් පත් කරලා තිබෙන්නේ එක පැත්තකින්. අගමැතිතුමා පත් කරලා තිබෙන්නෙත් ජනාධිපතිතුමා. අලුත් වැඩ සටහනක්. අපි බලමු. අපි පුළුවන්තරම් සහයෝගය දෙනවා. මොකක් හරි වැඩ සටහනක් සාර්ථක වෙන්න වැඩ සටහන අත්හදා බලන්න ඕනෑ. ඒක හරි හෝ වැරැදි වෙන්න. ඒ නිසා අපි සහයෝගය දෙනවා. මේ මැතිවරණ ක්‍රමය තුළ මම අර මතු කරපු කාරණාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, විශේෂයෙන්ම මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙනෙන ලද යෝජනාව පිළිබඳව එතුමාට විශේෂ ස්තුතියක් අපේ කණ්ඩායමෙනුත් පිරිනමමින්, විශේෂයෙන් අප්‍රේල් මාසයේ 23 වැනිදා නොවෙයි. ටික කාලයක් හරි අරගෙන මේ වැඩ පිළිවෙළට ගිහිල්ලා මැතිවරණයට යන්න කියලා ඉතාමත් ආදරයෙන් මතක් කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම ස්තුතියි.

[අ.භා. 12.40]

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ ගෙනැල්ලා තිබෙන යෝජනාව සම්බන්ධයෙන් අපි සන්තෝෂ වෙනවා. අරගලයක් කරලා මේ කාලය යොදා ගත්තේ මේ මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් අපටත් තිබෙනවා යම් යම් අදහස් යෝජනා ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම තරුණ මන්ත්‍රීවරු විධියට අපි මේක දකින දෘෂ්ටිය, අපි මේකට ගෙනෙන අලුත් අදහස් වැදගත් වෙයි කියලා හිතපු නිසා තමයි යම්කිසි අරගලයක් කරලා හරි මේ අවස්ථාව ලබා ගත්තේ මේ සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කරන්න. විශේෂයෙන්ම අපි මේ මැතිවරණ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑය කියන එක ප්‍රාදේශීය සභා මට්ටමට, පළාත් පාලන මට්ටමට ගෙනෙන්න උත්සාහ කරන වේලාවකදී කටාන ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ බල මණ්ඩලයේ එවකට මම ඒකේ නියෝජිතයෙක් විධියට යම්කිසි අවස්ථාවක මතයක් ප්‍රකාශ කළා, මේක පටන් ගන්න ඕනෑ බිම ඉඳලා නොවෙයි. මේක පටන් ගන්න ඕනෑ ඉහළ ඉඳලා. මේක පටන් ගන්න ඕනෑ පාර්ලිමේන්තුවෙන්. පළාත් සභාවෙන්. ඊට පස්සේ තමයි මේක පළාත් පාලන ආයතනවලට ගෙනෙන්න ඕනෑ කියන එක මම යෝජනා කළා. අද මම සන්තෝෂ වෙනවා. අපි තරුණයන් විධියට ඒ කරපු යෝජනාව අද මල් එල ගෙන තිබෙනවා. මේක පාර්ලිමේන්තු මට්ටමේ සිට පල්ලෙහා මට්ටමට එන්න ක්‍රමයක් දැන් සැකසෙමින් තිබෙනවා.

විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, යම් යම් පක්ෂවලට මේක හදිසියේ ගෙන එන්නට උවමනාවක් තිබෙනවා. මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ඉතාම හොඳයි. මොකද, අපි කවුරුත් පිළිගන්නවා, මේ රටේ ඕනෑම දේශපාලන පක්ෂයක්, ඕනෑම මට්ටමක ඉන්න ඡන්ද දායකයන් විශ්වාස කරනවා, මේ මැතිවරණ ක්‍රමය තුළින් තමයි මේ දූෂිත දේශපාලන සංස්කෘතිය මේ රටේ නිර්මාණය වෙලා තිබෙන්නේ කියලා. කුඩුකාරයෝ, වංචාකාරයෝ, දූෂිතයන් විවිධ තරාතිරම්වල අය දේශපාලනයට ඇවිල්ලා මේ දේශපාලනය දූෂිත වෙලා තිබෙන්නේ මේ ක්‍රමය නිසා කියන එක අපි කවුරුත් පිළිගන්නවා. හැබැයි, එහෙමයි කියලා මේක හදිසියේ, කඩිමුඩියේ මේ ගැන හරි අධ්‍යයනයක් කරන්නේ නැතිව මේක අරගෙන එන එක ඉදිරියේදී මේ ක්‍රමය නැවතත් වෙනස් කරන්න සිද්ධවෙන්න ඉඩ තිබෙනවා. එහෙම වුණොත් මේ අද රටේ නිර්මාණය වෙලා තිබෙන මේ 2/3 ක බලයක් අරගෙන මේක වෙනස් කරන්න තිබෙන හැකියාව තව ඉදිරි කාලයකදී නොලැබෙන්නට පුළුවන්. ඒ නිසා කිසියම් දේශපාලන පක්ෂයකට තමුන්ගේ බලය වැඩි කරගන්න, ඒක පවත්වා ගන්න උවමනාවෙන් මේක කඩිමුඩියේ ගේන්න ඕනෑ කියලා විශ්වාස කරනවා නම් අපි ඒකට විරුද්ධයි. ඒ වාගේම තමයි දැනට තිබෙන මේ අනුපාත ක්‍රමය තුළිනුත් ගොඩාක් වේලාවට අපි

[ගරු රජිත හපුආරච්චිගේ]

දකිනවා, මේ පවුල් දේශපාලනය සනාථ කරන ලක්ෂණ මේක ඇතුළේ තිබෙනවා. උදාහරණයක් විධියට පසුගිය බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ අපේක්ෂකයෙක් විධියට මම තරග කරන්න බලාපොරොත්තුවෙන් සිටියා. හැබැයි, එහෙම තිබෙන කොට තරුණ අපේක්ෂකයන් කියලා පත් වෙන්නේ කවුද? එක්කෝ දේශපාලඥයෙකුගේ පුතෙක්. එහෙම අය මෙතැන ඉන්නවා. තරහා වෙන්න එපා. වෛරයකින් කථා කරනවා නොවෙයි. නමුත් මේ ක්‍රමය තුළින් දේශපාලන පවුලක් නියෝජනය නොකරන තරුණයෙක්ට මේ ක්‍රමයෙන් මතු වෙන්න හැකියාවක් නැහැ. ඒ නිසා මේ ක්‍රමය වෙනස් වෙනවා නම්, මේ ක්‍රමය ඇතුළේදී විශේෂයෙන්ම අනුපාත ක්‍රමය වෙනස් වෙලා කොට්ඨාශ ක්‍රමයට මේක එනකොට නැවත නැවතත් මේක තවත් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා -

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා කොහෙන්ද ආවේ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

පොඩ්ඩක් ඉන්න කෝ කථා කරනකන්. එක්සත් ජාතික පක්ෂයට කිසිම අයිතියක් නැහැ පක්ෂ මාරුව ගැන හරි මොනවා හරි ගැන කථා කරන්න. ඔබතුමාට අයිතියක් නැහැ. ඔබතුමන්ලාට අයිති නැති බලයක් ඔබතුමන්ලා පාවිච්චි කරන්නේ. ඒ නිසා ඔබතුමන්ලා කට වහගෙන ඉන්න. ඔබතුමන්ලා මේ ආණ්ඩුව පිට්පොකට් ගහලා ඉන්නේ. ඉතින් ඒ නිසා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ෆොන්සේකා මහත්මයා -

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මම ඒක ෆොන්සේකා මහත්මයා එක්ක කරගන්නම්. ඔබතුමා කළබල වෙන්න එපා. ඒක මම එතුමාත් එක්ක කරගන්නම්. කථා කරන්න මට අවස්ථාව දෙන්න. ඔබතුමා හැමදාම ඔහොම නේ. මෝඩයෙක් වාගේ හැමදාම කෑ ගහනවා. පොඩ්ඩක් ඉන්න. මේ කියන එක අහගෙන ඉන්න. ඉතින් ඒ නිසා මේ ක්‍රමය ඇතුළත -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කටානේ. පක්ෂ තුනේම සිටියා. යූ.ඇන්.පී. යෙත් සිටියා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

කොහෙද යූ.ඇන්.පී. යේ සිටියේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය අපට බොහොම සීමිතයි.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

බොරු කියන්න එපා. ඔබතුමා දන්නේ නැති දේවල් කථා කරන්න එපා. එකක නොවෙයි. පක්ෂ දහයක සිටියත් කටාන ජනතාව දන්නවා, රජිත හපුආරච්චි කියන්නේ කවුද කියලා. ඒ නිසා ඔබතුමා කට වහගෙන ඉන්න. ඉතින් ඒ නිසා මේ ක්‍රමය ඇතුළේ බොහොම පැහැදිලිව අර පවුල් දේශපාලනයට ඉඩක් ඇති වෙන්න තිබෙන ඉඩකඩ වැඩියි. මොකද, සංවිධායකතුමාගෙන් පස්සේ සංවිධායකතුමාගේ පුතා. එහෙම නැත්නම් සංවිධායකතුමාගේ බිරිඳ. එහෙම නැත්නම් කවුරු හරි කෙනෙක්. ඥාතියෙකුට මේක ඇතුළේ එන්න තිබෙන ඉඩකඩ වැඩියි. ඒ නිසා බොහොම පැහැදිලිව අපි යෝජනා කරනවා, තරුණ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් විධියට. මැතිවරණ ක්‍රමය වෙනස් වෙනවා නම් ඒ වෙනස් වීම තුළ තරුණ නියෝජනයක් පැහැදිලිව ලබලා දෙන්න කියන එක ඔබතුමා මාර්ගයෙන් මේ තීන්දු තීරණ ගන්න කණ්ඩායම්වලට එකතු කරන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා. ඉතින් ඒ නිසා මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට අවශ්‍ය වුණේ මේ අදහස් කිහිපය සම්බන්ධයෙන්

මේ සභාවට දැනුවත් කරන්න. (බාධා කිරීම්) ඒ නිසා විශේෂයෙන්ම මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.46]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙනාපු යෝජනාවේ හොඳ නරක දෙකම පක්ෂයක් විධියටත් පෞද්ගලිකවත් අපි මේ කාරණයේදී දකිනවා. 1977 පාර්ලිමේන්තු මැතිවරණය, 8 වන පාර්ලිමේන්තුව සඳහා 1977 ජූලි මාසේ 21 වැනිදා පැවැත්වූවාට පස්සේ, ඒ පාර්ලිමේන්තුව මැතිවරණය පවත්වන්නේ කේවල ඡන්ද ක්‍රමය මත පදනම් වෙලා. ඒකේදී එක්සත් ජාතික පක්ෂයට අපේක්ෂකයෝ 154 දෙනෙක් තරග කරලා, 140 දෙනෙක් ඒ අවස්ථාවේදී කේවල ක්‍රමයෙන් තේරී පත් වෙනවා. ඒ වාගේම TULF පක්ෂයෙන් අපේක්ෂකයෝ 23 දෙනෙක් තරග කරලා 18 දෙනක් තේරී පත් වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපේක්ෂකයෝ 147 දෙනෙක් තරග කරලා, 1977 තේරී පත් වන මන්ත්‍රී ආසන 08 යි. ඒ 1977 කේවල ඡන්ද ක්‍රමයත්, 2010 අවසාන වශයෙන් දැන් පැවැත්වූ සමානුපාතික මැතිවරණ ක්‍රමයත්, මේ ක්‍රම දෙකේම සංයෝජනයක් විධියට දිනේෂ් ගුණවර්ධන කමිටු වාර්තාව මත පදනම් කර ගෙන දැනට සාකච්ඡා මට්ටමේ පවතින මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව විවිධ ආකාර හොඳ මේ ගරු සභාවේ කථා කරන්න යෙදුණා. හැබැයි, මේ සෑම හොඳ දෙයක් ඇතුළේම නරක දෙයක් වාගේම, සෑම නරක දෙයක් තුළම හොඳ දේවලුත් තිබෙනවාය කියන කාරණය අපට අවිවාදයෙන් පිළිගන්න වෙනවා. දැන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධායකයත්, සමානුපාතික ඡන්ද නියෝජන ක්‍රමයත් හැදිලා එන එකේ මේ දෙකේ අන්‍යෝන්‍ය බැඳීමක් තිබෙනවා. දැන් හුඟක් මේ වෙනසකට භාජනය කරන්නය කියලා කථා කරන උදවියගේ ප්‍රධාන මාතෘකාවක්, කථාවක් බවට පත් වෙලා තිබෙන්නේ මැතිවරණ ක්‍රමය සංශෝධනය වෙන්න ඕනෑ. විධායක ජනාධිපති ක්‍රමය තුළ යම් ආකාරයට බල කප්පාදුවක් වෙනවා නම් හොඳයි කියන පදනමේ ඉඳගෙන තමයි කියන්නේ.

දැන් පැරණි ඡන්ද ක්‍රමයේ තිබෙන, මේ වර්තමාන ඡන්ද ක්‍රමයේ තිබෙන ප්‍රධානම දුර්වලතාවයන් විධියට මේ සභාවේ කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රධාන කාරණා තුනක් පිළිබඳව සඳහන් කරන්න යෙදුණා. ඒ තමයි, නොගැළපෙන උදවිය පාර්ලිමේන්තුව වන උත්තරීතර ආයතනය නියෝජනය කිරීම. ඒ වාගේම දෙවැනි කාරණය විධියට කිච්චා මැර බලයත්, ධන බලයත් ප්‍රධාන කොට ගත්ත මන්ත්‍රීවරු ඒ ආසනවලට පත්වීම, ඒ නියෝජිතයන් බවට පත් වීම. ඒ වාගේම ආසනයට වග කියන මන්ත්‍රීවරයෙක් බිහි නොවීම කියන කාරණයත් මේ පවත්නා ක්‍රමය තුළ තිබෙන කාරණා විධියට සඳහන් කරන්නට යෙදුණා. හැබැයි, මේ ක්‍රමයට, මේ තත්ත්වයට උත්තරයක් ද දිනේෂ් ගුණවර්ධන කමිටු වාර්තාව මගින් ප්‍රකාශයට පත් කරන මැතිවරණ ක්‍රමය කියන එක අපි නැවත වතාවක් විමසන්න ඕනෑය කියන ස්ථාවරයේ මම ඉන්නේ. මේ කිච්ච පුද්ගල වර්ග තුනට අමතරව, නොගැළපෙන අය පත් වීමෙන් පාර්ලිමේන්තුවේම ධන බලය, මැර බලය ඉස්මතු වීම, ඒ වාගේම ආසනයට වග කියන මන්ත්‍රීවරයෙක් බිහි නොවීම කියන කාරණයට අමතරව, මැර බලයටයි, ධන බලයටයි අමතරව මේ ක්‍රමය තුළ ඒ ඒ ආසනවල, ඒ ඒ මැතිවරණ කොට්ඨාශවල පාරම්පරික පවුල් බලයෙන් යුතු, පවුල්වාදයක් ඉස්මතු වෙලා පාර්ලිමේන්තු යන උදවිය බිහි වීමේ හැකියාවකුත් මේ මැතිවරණ ක්‍රමය තුළ තිබෙන්නට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා දැන් දිනේෂ් ගුණවර්ධන කමිටු වාර්තාවට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 140 දෙනෙකු කේවල ක්‍රමයට, 70 දෙනෙකු දිස්ත්‍රික් ක්‍රමය මත පදනම් වෙලා, 15 දෙනෙක් ජාතික ලැයිස්තුව මත පදනම් වෙලා තමයි පාර්ලිමේන්තුවට තෝරා ගන්න යෝජනා වී තිබෙන්නේ. දැන් තිබෙන 160, අඩු කරන්න ඕනෑ 140 ට.

මම නියෝජනය කරන්නේ කළුතර දිස්ත්‍රික්කය. බණ්ඩාරගම ආසනය. දැනට බණ්ඩාරගම ආසනයේ ඡන්ද 138,000 ක් තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ආසනයේ ඡන්ද 138,000 ක් එක්ක දිස්ත්‍රික්කයේ ආසන 08 ක් තිබෙනවා. 160, 140 ට අඩු කරන්න වෙන කොට අවම වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ මේ ආසන අට, හත දක්වා අඩු කරන්න වෙනවා. අවම වශයෙන්. එතකොට බණ්ඩාරගමට එන ඡන්ද ප්‍රමාණය දැනට තිබෙන්නේ 138,000 යි. තවත් 12,000 කින් වත් වැඩි වන කොට බණ්ඩාරගමට 150,000 ක් ඡන්ද එනවා. එතකොට ආසනය විශාල වශයෙන් පුළුල්භාවයට පත් වෙනවා. එතකොට මේ ක්‍රමයට එන කොට, ආසනයක් ලොකු වෙන කොට අර ධන බලය, මැර බලය කියන කාරණා ආසනයේ කේවල

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ඡන්ද ක්‍රමය තුළ නැති වීමට තිබෙන මොකක්ද තිබෙන සහතිකය? මොකක්ද අපට තිබෙන විශ්වාසය? ආසන ක්‍රමය තුළ, කේවල ක්‍රමය තුළ මේ 150,00 ක ඡන්දය ගන්න කොට බැර බලයත්, ධන බලයත්, පවුල් වාදයත් නැති වෙන්නේ කොහොමද කියන ප්‍රශ්නයත් තිබෙනවා.

ඒ වාගේම දැන් මෙහිදී ප්‍රධාන වශයෙන්ම අපට වෙලා තිබෙන ප්‍රශ්නය තමයි දැන් මේ මැතිවරණ ක්‍රම දෙකෙන් කෝක ගත්තත්, මේ පාර්ලිමේන්තු පක්ෂවල නායකයෝ, ඒ උදවිය කල්පනා කරනවා කවුරු හරි පුද්ගලයෙක්ව දාලා ආසනය දිනා ගැනීමට. එහෙම නැත්නම් පාර්ලිමේන්තුවට ගෙන්වා ගැනීමට. තමන්ගේ කණ්ඩායම වැඩි කර ගැනීම තමයි කාරණය කියන එක. එහෙම දාලා, ජනතාවට අනික් පැත්තට හැරිලා කියනවා, සුදුස්සෝ විතරක් පාර්ලිමේන්තු එවන්නය කියලා. සුදුස්සන්ව පාර්ලිමේන්තු එවීමේ වගකීම ජනතාවට භාර දෙනවා. පක්ෂ නායකයෝ නුසුදුස්සන්ට නාම යෝජනා ලබා දෙනවා. එහෙම නම් මේක හදන්න ඕනෑ, නුසුදුස්සන්ට නාම යෝජනා දීම පක්ෂ නායකයා සතු වගකීමයි, පක්ෂ නායකයා සතු කාර්යභාරයයි කියලා හදන්න ඕනෑ. අරහෙම දාලා ගමේ ඉන්න මිනිස්සුන්ට කිව්වාට හරියන්නේ නැහැ, සුදුස්සාව පාර්ලිමේන්තු එවන්නය කියලා. මේ ක්‍රම දෙකෙන් කොයි ක්‍රමය ගත්තත්, ක්‍රියාත්මක භාවයේ, ක්‍රියාත්මක යාන්ත්‍රණයේ තිබෙන වැරැද්දක් මිසක්, ඒ මේ ක්‍රමවල වැරැද්දක් නොවෙයි කියන එකයි කියන්නේ.

1997 ප්‍රාදේශීය සභාවට තේරී පත් වෙනවා. 2002 දී මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙනවා. මම අදත් විශ්වාස කරන දේ තමයි මේ මනාප ක්‍රමය නොතිබුණා නම් අරුණ දීපාල් කෙනෙක් - මගේ තාත්තා කම්කරුවෙක්. මගේ තාත්තාට, මගේ අම්මාට දේශපාලන පසුබිමක් නැහැ. අපට දේශපාලන පසුබිමක් නැහැ. අපි බොහොම යට ඉඳලා ආපු උදවිය. මගේ තිබෙන හැකියාවන් නිසා තමයි අපට මේ දේශපාලනයේ මේ තැනට එන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා මේ කේවල ක්‍රමය ආවොත් එහෙම, කේවල ක්‍රමය මත පදනම් වුණු, මේ සමානුපාතික 70 කියන එක ප්‍රශ්න ගත 70 ක් ලෙස තිබෙන්නේ. මේ අලුත් ක්‍රමය තුළ. අපි වාගේ, තමුන්නාන්සේලා වාගේ දක්ෂයෝ කවදාවත් පක්ෂවලින් බිහි වීමේ ඉඩකඩක් නැති වෙන්න පුළුවන්, මේ යෝජිත ක්‍රමය මත පදනම් වෙලා ඡන්දය තියන්න ගත්තොත්. දක්ෂයාට වඩා පවුල්වාදය මත පදනම් වුණු, පවුල් බලය මත පදනම් වුණු ධනවාදය, මැර බලය කියන කාරණා මේ ක්‍රමයටත් මේ යෝජනා කරන මැතිවරණ ක්‍රමය තුළත් වඩා ඉස්මතු වෙන්න පුළුවන් කාරණයක් බවට පත් වෙන්න පුළුවන්. ඒ නිසා මේ ක්‍රමයට වඩා සුසුදු ක්‍රමවේදයකට අපි යා යුතුව තිබෙනවා.

ප්‍රේමදාස ජනාධිපතිතුමා 1988/1989 භීෂණයෙන් පස්සේ තරුණ අසහනයන් සම්බන්ධයෙන් තරුණ අසහන කොමිසම හදනවා. ඒ කොමිසමේ වාර්තාව මත පදනම් වෙලා, පළාත් පාලන ආයතන නියෝජිතයන්ට 35% ක අනිවාර්ය තරුණ නියෝජනයක් ලබා දෙනවා. ඒ අනිවාර්ය තරුණ නියෝජනය ලබා දෙන්නේ, මේ සමාජයේ සියලු පැතිකඩයන් නියෝජනය කරන උදවිය ප්‍රාදේශීය සභාවට, ප්‍රාදේශීය දේශපාලනයෙන්, පළාත් සභාවෙන් පාර්ලිමේන්තුවට එන්න ඕනෑය කියන තත්ත්වය නිසා. නිමල් ලාන්සා ගරු ඇමතිතුමා සඳහන් කළ විධියට එක ආසනයක ඉන්න විවිධ ජනවර්ග කණ්ඩායම්, විවිධ පුද්ගල කණ්ඩායම් නියෝජනය කරන ක්‍රමයකට මේ කේවල ක්‍රමය මත පදනම් වුණු මැතිවරණය තුළ අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම තරුණ අසහනයට පිළියමක් වෙන්නේ නැහැ. නැවත වතාවක් අපි ආපස්සට යන්නේ. නැවත වතාවක් තරුණයන් කැරැල්ලකට මෙහෙයවන වැඩ පිළිවෙළකට යන්න පුළුවන්. ඒ නිසා මෙය ඉතාමත්ම හදිස්සියේ කළ යුතු දෙයක් නොවෙයි. මැතිවරණ ක්‍රමයක් වෙනස් කරනවාය කියන එක. මැතිවරණ ක්‍රමය බල පවත්වන්නේ තවත් අනාගත සියවසකට වෙන්න පුළුවන්. අඩ සියවසකට වෙන්න පුළුවන්. මැතිවරණ ගණනාවකට වෙන්න පුළුවන්. ඒ නිසා මේවා කඩිමුඩියේ, කලබලයෙන් කරන එක නොවෙයි වැඩේ. සියලු දේශපාලන පක්ෂවල සාකච්ඡාවට භාජනය කරලා, හොඳ නරක තීරණය කරලා, සුළු පක්ෂ වෙනත් ආකාරයකට මේවායෙන් වර්ධනීය තත්ත්වයන් ඉස්මතු වන එක නතර කරන්න පුළුවන් හොඳ පුළුල් කථිකාවතක් ඇතිව ඕනෑ මැතිවරණ ක්‍රමයක් කියන එක වෙනස් කරන්න. මැතිවරණ ක්‍රමයක් කියන එක එහෙම නැතිව ආවාට ගියාට මේ විධියට වෙනස් කිරීම නිසා මීට වඩා භයංකර තත්ත්වයක් සමාජය තුළ උද්ගත වෙලා, සමාජයේ විවිධ විපර්යාසයන්වලට භාජනය වීමේ හැකියාව තිබෙනවා. වත්මන් ක්‍රමය තුළ මනාප තුනක් තිබෙනවා. කැමැති අය තෝරා ගන්නට. සුදුසු අයට, කැමැති අයට දෙන්න පුළුවන්. කැමැති අයට නොදී ඉන්න පුළුවන්.

වත්කම් බැරකම් ප්‍රකාශ මගින් පුද්ගලයා පාලනය කිරීමේ හැකියාව තිබෙනවා. දැන් මේ තිබෙන ක්‍රමය තුළ පක්ෂ මාරු කරලා, අද විකෘති තත්ත්වයක් තිබෙනවා. 2010 මැතිවරණයේ 14 වැනි පාර්ලිමේන්තුවේ සන්ධානයෙන් පාර්ලිමේන්තුවට එනවා 144 දෙනෙක්. යූ.එන්.පී එකෙන් පාර්ලිමේන්තුවට එනවා 60 දෙනෙක්. පෙර මැතිවරණයට වඩා 22 ක් අඩු වෙලා තමයි එක්සත් ජාතික පක්ෂයෙන් පාර්ලිමේන්තුවට එන්නේ 60 ක්. හැබැයි, මේ 60 පාර්ලිමේන්තුවේ ඉන්නේ නැහැ. ඔවුන් සන්ධානයට එකතු වෙනවා විවිධ වරදාන, වරප්‍රසාද නිසා. මෙන්න මේ දේවල් නීති මගින් පාලනය කිරීම මත පවත්නා මැතිවරණ ක්‍රමයම ඉදිරියටත් පවත්වාගෙන යමින් එයට වඩාත් සුදුසු සංශෝධන පමණක් ඉදිරිපත් කරමින් ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය පවතින ක්‍රමය මත පදනම්ව පවත්වලා, ඊළඟ පාර්ලිමේන්තු අවුරුදු පහ ඇතුළේ පුළුල් කථිකාවතකට ගිහිල්ලා සුදුසු මැතිවරණ ක්‍රමයකට කේවල සහ සමානුපාතික නියෝජන දෙකම ලැබෙන මැතිවරණ ක්‍රමයකට යාම සුදුසුයි කියන අදහස ඉදිරිපත් කරමින් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.56]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා විසින් අද දිනයේ ගෙනාපු මේ යෝජනාව ඉතාම කාලීන, ඒ වාගේම වැදගත් යෝජනාවක් විධියට අපි දකිනවා. මම හිතන්නේ, මේ රටේ දේශපාලන ක්‍රමයේ සමස්ත වෙනසක් ඉල්ලා සිටින මොහොතක්. එය විධායක ජනාධිපති ධූරයේ අත්තනෝමතික බලතල ඉවත් කිරීම පමණක් නොවෙයි. මේ රටේ මැතිවරණ ක්‍රමයේ වෙනසක්. ඒ වාගේම මේ රටේ යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ අධිපත්‍ය තහවුරු කරලා මේ රට සීලාචාර රටක් බවට පත් කිරීම සඳහා, ඒ වාගේම ප්‍රශස්ථ, සාධනීය දේශපාලන සංස්කෘතියක් මේ රට තුළ නිර්මාණය කිරීම සඳහා ඒකට අවශ්‍ය කරන අත්තිවාරම දමන්න අපට ලැබිලා තිබෙන ස්වර්ණමය අවස්ථාවක් විධියටයි මෙය අපි දකින්නේ. පසුගිය ජනවාරි 08 වැනිදා ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ජනවරමක් ලැබුණා. ඒ ජනවරමේ ඉතාම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා, විධායක ජනාධිපති ධූරයේ අත්තනෝමතික බලතල ඉවත් කළ යුතු බව. ඒ වාගේම ඒ ධූරය ප්‍රජාතාන්ත්‍රීකරණය කළ යුතු බව. ඒ වාගේම මේ පවතින සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනස් කරලා, මනාප ක්‍රමය වෙනස් කරලා, ජනතාවට වග කියන මහජන නියෝජිතයන් තේරී පත් වන අලුත් මැතිවරණ ක්‍රමයක අවශ්‍යතාවය ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

ඒ වාගේම ස්වාධීන කොමිෂන් සභා. මැතිවරණ කොමිසමත්, අධිකරණ කොමිසමත්, ඒ වාගේම ස්වාධීන දූෂණ විමර්ශන කොමිසමක අවශ්‍යතාවය, ඒ වාගේම රාජ්‍ය සේවය, පොලිස් සේවය වැනි සේවාවන් ස්වාධීන කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවත් සාකච්ඡා කෙරෙමින් තිබෙනවා. එහෙම නම් මේ වැඩ පිළිවෙළ අපි ඉදිරියට ගෙන යා යුතුයි. ඒ සඳහා ජන වරම ලැබිලා තිබෙන්නේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි. ඒ ජනවරම ඉදිරියට ගෙන යාම සඳහා සම්මුතිවාදී දේශපාලනයක් අවශ්‍යයි. සම්මුතියක් අවශ්‍යයි. සහයෝගීතාවයක් අවශ්‍යයි. ඒ සහයෝගීතාවය ඇති කර ගැනීම සඳහා තමයි පාර්ලිමේන්තුව තුළ සුළුතරයක් නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයට එහි අගමැති ධූරය ලබා දීලා ඒ වාගේම කැබිනට් ඇමති ධූර ලබා දීලා ඒ සම්මුතිවාදී දේශපාලනයට අවශ්‍ය කරන පදනම දැම්මේ. දැන් ඒ සඳහා නායකත්වය ගෙන ඉදිරියට යා යුතුව තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට ඒ සම්බන්ධයෙන් විශාල වගකීමක් පැවරිලා තිබෙනවා. නමුත් අවාසනාවට මේ මොහොතේදී විධායක ජනාධිපති ධූරයේ අත්තනෝමතික බලතල ඉවත් කිරීම සහ විධායක ජනාධිපති ධූරය මුළුමනින් අහෝසි කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය දක්වන උනන්දුව, උද්යෝගය මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම සඳහා නොදැක්වීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම අපි කනගාටුවට පත් වෙනවා. එයත් මේ රටේ ජාතික අවශ්‍යතාවයක්. ඒ ජාතික අවශ්‍යතාවය අපි ඉෂ්ට කළ යුතුයි.

ජනතාවගේ අභිලාසය, ජනතාවගේ ප්‍රාර්ථනාව ඉෂ්ට කිරීම සඳහා මේ ජනවරම ලැබිලා තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි. ඒ සඳහා සහයෝගය ලබා දීම, ඒ සඳහා පාර්ලිමේන්තුව තුළ අවශ්‍ය කරන නායකත්වය ලබා දීම එක්සත් ජාතික පක්ෂය විසින් සිදු කළ යුතුයි. එහිදී අපි සියලු දෙනාම සම්මුතියකින්, එකඟතාවයකින් මේ කටයුත්ත සිදු කළ යුතුයි. විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව ඕනෑතරම් අපේ

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

සමාජය තුළ සාකච්ඡා වෙලා තිබෙනවා. මේ පිළිබඳව විවිධ විශේෂඥයින්, ඒ වාගේම මැතිවරණ ක්‍රම පිළිබඳව විශාරදයින් ඕනෑතරම් මේ පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ දිනේෂ් ගුණවර්ධන කොමිටිය තුළ ප්‍රමාණවත් තරම් සාකච්ඡාවක් සිදු වෙලා තිබෙනවා. එහෙම නම් අපි අද බලන්න ඕනෑ, මේ තිබෙන අවලස්සන, අශෝභන කැත, ජරාජීර්ණ වූ මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා, මේ රටට ගැළපෙන, මේ රටට උචිත, සියලු ජන කොටස්, ජනවර්ග නියෝජනය වන, විශේෂයෙන්ම සුළු පක්ෂ ඇතුළු වඩාත් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයක් ලැබෙන ආකාරයේ මැතිවරණ ක්‍රමයක් කොහොමද අපි සකස් කර ගන්නේ කියලා.

මම හිතන්නේ, ඒ සඳහා සුදුසු අත්තිවාරම දැන් වැටිලා තිබෙනවා. ඒකට යෝජනා තුනක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මැතිවරණ කොමසාරිස්තුමා එක යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මහාචාර්ය රොහාන් සමරජීව මහතා, ආචාර්ය සුජාතා ගමගේ මැතිනිය මේ අය ඉතාම වැදගත් යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. දැනට මේ සඳහා යෝජනා තුනක් තිබෙනවා. ඒ යෝජනා තුනෙන් අපට පුළුවන් මේ සඳහා ගැළපෙන යෝජනාවක් අපි සියලු දෙනාගේ එකඟතාවයකින් ඇති කර ගන්න. ඉතින් මම හිතන්නේ අපි මේ සඳහා කාලය කිසිසේත් හරස් කර ගත යුතු නැහැ. සමහරු කියනවා, අපට දින 100 ක් සඳහා තමයි මේ ජනවරම ලැබිලා තිබෙන්නේ කියලා. නැහැ. ජනාධිපතිතුමාට මේ ජනවරම ලැබුණේ අවුරුදු හයකට. ඒ නිසා මේ දින 100 කැලැන්ඩරයට අපි කොටු විය යුතු නැහැ. අපට අවශ්‍ය කරන්නේ, මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයාමයි. එහිදී අපි ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටින්න කැමැතියි. මෙහිදී සමස්තයක් විධියට රටට ලැබෙන වාසිය දෙසයි අපි බැලිය යුත්තේ. තමන්ගේ පක්ෂයේ රාමුව තුළින්, තමන්ගේ පක්ෂයේ කවුළුව තුළින්, එහෙම නැත්නම් පෞද්ගලිකව තමන්ට මෙයින් ලැබෙන්නේ කුමක්ද කියන දෙස නොවෙයි අපි බැලිය යුත්තේ. මෙයින් රටට වාසියක් වෙනවාද? අවාසියක් වෙනවාද? කියන කාරණය. රටට වාසියක් වෙනවා නම් සමස්තයක් වශයෙන්, සුළු වශයෙන් හෝ අනික් අයට යම් අවාසියක් වුණත් මම හිතන්නේ එය අපි නොසලකා හරිමින් රට දෙස බලලා මේ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුයි කියන තැනකයි ඉන්නේ.

ඒ නිසා මෙම මැතිවරණ ක්‍රමයේ වෙනසක් කිරීමෙන් පමණක් අපි බලාපොරොත්තු වන සාධනීය දේශපාලන සංස්කෘතියක් රට තුළ නිර්මාණය කරන්න බැහැ. ඒකට තමයි අපි යෝජනා කරලා තිබෙන්නේ. සියලුම මන්ත්‍රීවරුන් සහ අපේක්ෂකයින් තෝරා පත් කර ගැනීමේදී ආචාර ධර්ම පද්ධතියක් සහ නිර්ණායක ප්‍රමාණයක් අවශ්‍යයි කියලා. එයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම කොටසක් බවට පත් කළ යුතුව තිබෙනවා. එයත් පසුගිය ජනාධිපතිවරණයේදී අපි ඉදිරිපත් කළ වැඩ පිළිවෙළේ එක වැඩක් විධියට පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කියන්න ඕනෑ. මන්ත්‍රීවරුන් වෙන්න පුළුවන්. අපේක්ෂකයින් වෙන්න පුළුවන්. තෝරා පත් කර ගැනීමේදී, නම් කිරීමේදී ඔවුන්ට යම්කිසි නිර්ණායක ප්‍රමාණයක් අපි හඳුන්වා දිය යුතුයි. ඒක දේශපාලන පක්ෂයක් තුළින් පමණක් නොවෙයි, අපේ ව්‍යවස්ථාව ඇතුළේම ඒ සම්බන්ධයෙන් යම්කිසි නිර්ණායක ප්‍රමාණයක් අපි සෑදිය යුතුයි. ඒ තුළින් පමණයි මේ රටේ දේශපාලන ක්‍රමයේ වෙනසක් අපට ඇති කරන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා පසුගිය ජනාධිපතිවරණයේ මේ රටේ ජනතාවගේ ජන විඥානයේ ඉතාම ගැඹුරින් මුල් බැස ගෙන තිබෙන්නේ මැතිවරණ ක්‍රමයේ සංශෝධනයක අවශ්‍යතාවය. විධායක ජනාධිපති ක්‍රමය සංශෝධනය කිරීම වාගේම මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම අපට අත්හල නොහැකි පොරොන්දුවක් බව මේ මොහොතේදී මේ සභාවට අපි කියන්න ඕනෑ. ඒ නිසා අපි සියලු දෙනාම ඒ වෙනුවෙන් කැප විය යුතුයි. ඒ සඳහා තිබෙන ස්වර්ණමය අවස්ථාව අපි මග නොහැරිය යුතුයි. පාර්ලිමේන්තුව ඇතුළේ මේ මොහොතේ තිබෙන මේ සංයුතිය ප්‍රයෝජනයට ගනිමින් ඒ සඳහා අපි සියලු දෙනාම ඊට අනුරූපීව කටයුතු කළ යුතුයි.

කනගාටුවට කාරණය අද මේ සම්මුතිවාදී දේශපාලනයට නොගැළපෙන ආකාරයෙන් අද අපි අතර ඇති වෙමින් තිබෙන යම් යම් විරසක භාවයන්, ඒ වාගේම ගැටුම්, සරදම්, කථාබස් මේවා ඇත්ත වශයෙන්ම ජනතාවගේ බලාපොරොත්තු සුන් කරන තත්ත්වයට අද ගමන් කරමින් තිබෙනවා. ඒ නිසා අපි මේ මොහොතේදී ඉල්ලා සිටිනවා. සියලු දෙනාම මේ ඇති කර ගෙන තිබෙන, මේ මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් ඇති කර ගෙන තිබෙන මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනියන්න අපි සියලු දෙනාම එකමුතුව, එක්සත්ව කටයුතු කරලා මේ ජයග්‍රහණය රටට අපි අරගෙන දෙමු. ඉන් පසු මැතිවරණයකට ගිහිල්ලා ඒ ජයග්‍රහණය,

ගෞරවය අපි වෙන වෙනම බෙදා ගනිමුයි කියා ඉල්ලා සිටිමින්, ඒ සඳහා අපි සියලු දෙනාටම ආරාධනා කරනවා මේ අවස්ථාවේදී පටු, තමන්ගේ පක්ෂයේ කෝණයෙන් බලන්නේ නැතිව තමන්ගේ පුද්ගලිකත්වය තුළින් බලන්නේ නැතිව රට දෙස බලලා, ජනතාව දෙස බලලා රටට මේ ජයග්‍රහණය අරන් දෙන්න අපි සියලු දෙනාම එකමුතු වෙමුයි කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.05]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා. පසුගිය දවසක එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය රැස් වෙලා තීන්දුවක් අරගෙන තිබුණා, දින 104 අවසන් වන අප්‍රේල් 23 වැනිදාට පාර්ලිමේන්තුව විසුරුවා හැර මැතිවරණයකට යන්න ඕනෑය කියලා. නමුත් ඒ යෝජනාවේ කොහේවත් සඳහන් වෙලා තිබුණේ නැහැ, අලුත් මැතිවරණ සංශෝධනයක් ගෙනැල්ලා එය සම්මත කර ගෙන ඒ අනුව අලුත් මැතිවරණය පැවැත්විය යුතුයි කියලා. මම හිතන්නේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ යෝජනාව අපට සන්නිවේදනය වුණු විධිය වැරදිද? එහෙම නැත්නම්, මේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙනාපු යෝජනාව ඊට වඩා වෙනස්ද කියන එක අපි බලන්න ඕනෑ. කොහොම වුණත්, මැතිවරණ සංශෝධනයකට අපේ එකඟතාවයක් තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ අවුරුදු තිහක් විතර කේවල ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක වුණා. ඒ කේවල මැතිවරණ ක්‍රමය තුළ දී සමස්තයක් හැටියට ඒ ඒ පක්ෂ ලබා ගන්නා ඡන්ද ප්‍රමාණය පාර්ලිමේන්තුව ඇතුළේ මනාව නියෝජනය වුණේ නැහැ. උදාහරණයක් හැටියට, 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ 39.5% ක් ඡන්ද ලබා ගෙන, ආසන 51 ක් ගන්න කොට, 28% ක් ගත්ත එක්සත් ජාතික පක්ෂයට හිමි වෙන්නේ ආසන 08 යි. 1977 දී 56% ක් ගන්න එක්සත් ජාතික පක්ෂයට ආසන 140 ක් යන කොට 30% ක් ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට යන්නේ ආසන 08 යි. ඒ කියන්නේ, සමස්තයක් හැටියට ගත්තාට පස්සේ රටේ ජනතාවගේ අභිලාසය ඡන්දවල විහිදීම කේවල ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව තුළ නියෝජනය වෙන්නේ නැහැ. ඒ නිසා තමයි සමානුපාතික නියෝජනය ඊට වඩා ඉදිරි පියවරක් බවට පත් වෙන්නේ. ඒ අනුව තියපු පළමුවැනි ඡන්දය 1989 දී එක්සත් ජාතික පක්ෂය ගන්නේ 50.7% යි. ආසන 225 න් ඔවුන්ට හිමි වෙන්නේ, 125 යි. 32% ක් ගන්නා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 67 ක් ගන්නවා. මොන තරම් අසාධාරණ වුණත්, මොන තරම් පක්ෂපාතී වුණත්, මොන තරම් විධියට රාජ්‍ය බලය පාවිච්චි කළත් 2010 මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානය 60.3% ක් ඡන්ද අරගෙන පාර්ලිමේන්තුවේ ආසන 144 ක් ගන්න කොට, එක්සත් ජාතික පක්ෂය ඡන්ද 30% ක් අරගෙන ආසන 60 ක් ගන්නවා. ඒ කියන්නේ, සමානුපාතික නියෝජනය තුළින් කේවල ක්‍රමයේ තිබුණු අඩුපාඩුව රටේ සමස්තයක් හැටියට ඒ පක්ෂයට ලැබෙන ඡන්ද ප්‍රමාණයට අනුව සමානුපාතිකයෙන් නිවැරදි වුණා. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? දැන් තිබෙන ප්‍රශ්නය තමයි සමානුපාතික නියෝජනය තුළින් පාර්ලිමේන්තුවට හෝ මහජන නියෝජිත ආයතනවලට පත් වන පුද්ගලයන් ඒ ජනතාවගේ අභිලාසය ප්‍රකාශයට පත් නොකිරීමයි. ඒ නිසා තමයි දැන් එතනෝල්කාරයෝ, කුඩුකාරයෝ, බූකීකාරයෝ, අරුන් මුන් ගිහිල්ලා මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය, දේශපාලනය විනාශ කළා කියන්නේ, ඔන්න ඔතැන. ඒ නිසා දැන් හැමෝම පුරුදු වෙලා ඉන්නවා. හේනට ආවාට පස්සේ, හේනට ඌරෝ, මුවෝ ඇවිල්ලා ආලපාලු කරලා ගියාට පස්සේ, ඒ මුවාට, ඒ ඌරාට වෙඩි තියන්නේ නැතිව, ගෙදර ගිහිල්ලා මුව හමට තඩි බාන්නා වාගේ මේ ඡන්ද ක්‍රමය තමයි ප්‍රශ්නය කියලා කියන්නේ.

මේ සමානුපාතික නියෝජනයට තිබෙන ප්‍රධාන චෝදනා දෙක මොකක්ද? පළමුවැනි චෝදනාව තමයි, පළමුවැනි විවේචනය තමයි මේ ඔස්සේ ආසනයට මන්ත්‍රීවරයෙක් නැහැයි කියන එක. තමුන්නාන්සේලා බලන්න. මේ සන්ධානයේ මන්ත්‍රීවරු 162 ක් හිටියා. ඒ 162 ට ආසනයේ මන්ත්‍රීවරයෙක් හිටියේ නැද්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ නියෝජනය කරන කළුතර ආසනය. කළුතර ආසනයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති කවුද? රෝහිත අබේගුණවර්ධන. ඔහුගේ මහජන සම්බන්ධීකරණ කාර්යාලය තිබෙන්නේ කොහේද? කළුතර. ඒ අනුව කළුතර ආසනයේ මන්ත්‍රීවරයා රෝහිත අබේගුණවර්ධන. ඒ වාගේ හැම ආසනයකටම, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වන, මහජන සම්බන්ධීකරණ කාර්යාලයක් තිබෙන, ඔහුගේ ඡන්ද පදනම බහුතරයක් නියෝජනය වන කෙනෙක් හිටියා. ඔහු තමයි ඒ ආසනයේ මන්ත්‍රීවරයා.

[ගරු නලින්ද ජයතිස්ස ]

ඒ විතරක් නොවෙයි. දැන් මේ චෝදනාවක් තිබෙනවා නේ සල්ලි වැඩිපුර තිබෙන අයට, ජාවාරම්කාරයින්ට විතරයි මේ සමානුපාතිකයෙන් දිනන්න පුළුවන් කියලා. නැහැ. ඕක ගැටගැහිලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, දේශපාලනයේ තිබෙන අරමුණත් එක්ක. යම් කෙනෙක් දේශපාලනයට එන්නේ ව්‍යාපාරික අරමුණකින් නම්, ඔහුට තිබෙන්නේ මේ පාර්ලිමේන්තු මන්ත්‍රී ලයිසන් එක අරගෙන තමන්ගේ හොඳ හෝ නරක - ඒක එතනෝල් වෙන්න පුළුවන්. කුඩු වෙන්න පුළුවන්. රටට සීනි ගෙන්වන එක වෙන්න පුළුවන්. තාප බලාගාර හදන එක වෙන්න පුළුවන්. ජල විදුලි බලාගාර පටන් ගන්න එක වෙන්න පුළුවන්. ආණ්ඩුවත් එක්ක බිස්නස් කරන එක වෙන්න පුළුවන්. ඒකට ලයිසන් එක පාර්ලිමේන්තු මන්ත්‍රීකම නම්, ඔවුන් කවර හෝ මිලක් වියදම් කරලා මේ මන්ත්‍රීකමට තරග කරනවා. දිස්ත්‍රික්කය නම් ඒකකය, දිස්ත්‍රික්කයට වියදම් කරනවා. කොට්ඨාශය නම් ඒකකය, කොට්ඨාශයට වියදම් කරනවා. ආසනය නම්, ආසනයට වියදම් කරනවා. පළාත නම්, පළාතට වියදම් කරනවා. පසුගිය ඡන්දයේදී කොළඹ දිස්ත්‍රික්කයේ සන්ධානයේ එක මන්ත්‍රීවරයෙක් ඡන්දයට ලක්ෂ 1700 ක් වියදම් කළා. රුපියල් ලක්ෂ 1700 ක්. කෝටි 17 ක්. කෝටි 17 ක් වියදම් කළා. ඔහුගේ තිබුණු අරමුණ මොකක්ද? සමාජමය අරමුණක්ද? නැහැ. ඔහුට තිබුණේ කොහොම හරි ඇවිල්ලා තමන්ගේ ව්‍යාපාර ටික කර ගැනීමේ බලපත්‍රය ලබා ගැනීමේ බලය. ඒ ආසාව. ඒ උනන්දුව. ඔහුට දුන්නොත් එහෙම මේ ආසන ක්‍රමය. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්නේ නැතිව නාම යෝජනා දුන්නා නම්, ඔහුට ආසනයකට එයින් කොටසක් වියදම් කළත් ඡන්දය දිනන්න පුළුවන්.

ඒ නිසා, දැන් මේ දේශපාලන සංස්කෘතිය ඇවිල්ලා තිබෙන තැන හැටියට, මේ සමානුපාතිකයේ පමණක් නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා 1977 දී සමානුපාතිකය ගෙනෙන කොට මනාප ක්‍රමයක් තිබුණේ නැහැ. 1981 සංවර්ධන සභා ඡන්දය. මනාප තිබුණාද? මනාප තිබුණේ නැහැ. ඒ වෙලාවේ සමානුපාතිකයට ආවා. පක්ෂවලින් ලැයිස්තුවක් ඉදිරිපත් කළා. ඒ අනුව පක්ෂයට හිමි වන ආසන ගණනට මන්ත්‍රීවරු ගියා. හැබැයි, ඒකේ ප්‍රශ්නයක් තිබුණා. මොකක්ද? ලැයිස්තුවේ පල්ලෙහායින් ඉන්න අය ඡන්දයට වැඩ කරන්නේ නැහැ. ඒ නිසයි මනාප ක්‍රමය ගෙනාවේ. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේක. දැන් අපි කවුරුවත් දන්නේ නැහැ මොකක්ද මේ එන ක්‍රමය. හැමෝම කියනවා මිශ්‍ර ක්‍රමයක්. කේවලයේ සමානුපාතික ක්‍රමයක්. නියෝජනය කොපමණද? ඒකේ ආසන බෙදෙන්නේ කොහොමද? අපි හිතුවොත් එහෙම මේ 225 තියාගෙන ආසන 125 ට කැඩෙනවා නම් එහෙම, එතකොට ආසන ගණන අඩු වෙනවා. ආසන අඩු වුණාට පස්සේ - දැනුත් සාමාන්‍යයෙන් ඇමතිධූරයක් ලබා ගත්ත කෙනෙකුටවත් ආසනයක් දුවන්න අමාරුයි. අපේ කළුතර දිස්ත්‍රික්කයේ, ඔබතුමා දන්නවා අගලවත්ත ආසනය කියන්නේ කළුතර දිස්ත්‍රික්කයේ භූමියෙන් 1/3 ක්. අගලවත්ත ආසනය තවදුරටත් කුඩා වෙන්න ඕනෑ. ඒ කියන්නේ ආසන ක්‍රමයට යනවා නම්, තව ආසන කුඩා වෙන්න ඕනෑ. ලොකු වෙන්න නොවෙයි. නමුත් මේ යන්නේ මොකක්ද? දැන් මේක සාකච්ඡාවට ගන්නේ කාලයක් දෙන්නේ නැතිව. විධිමත්ව මේ පිළිබඳව ජනතාවගේ අදහස් ගන්නේ නැතිව හදිස්සියේ ගෙනැල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ, මැතිවරණ ක්‍රමය සංශෝධනය කරමු. මේක අවුරුදු 30 ක් ගියා. හරි පරණයි. අපි අයින් කරමු. හැබැයි, ගේන එක මේ සමානුපාතිකයට වඩා උඩ එකක් වෙන්න ඕනෑ. උසස් එකක්. ඉහළ එකක්. ඒකෙන් හැම ජන කොට්ඨාශයකගේම අභිලාසයන් නියෝජනය වෙන්න ඕනෑ. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ හැම දෙනාගේම අදහස් නියෝජනය වෙන්න ඕනෑ. ජනතාවගේ කැමැත්ත පාර්ලිමේන්තුව තුළ නිරූපනය වෙන්න ඕනෑ. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මෙහෙමයි. සොයලා බලන්න. මම දන්න විධියට මේ සම්මත කර ගන්න එක අනුව ඡන්දය තියනවා කියලා දින 100 වැඩ පිළිවෙළේ කොහේවත් නැහැ. එහෙම දින 100 යේ නැහැ. හැබැයි, පුළුවන් මෙහෙම කරන්න. මේ අලුත් යෝජනාව සම්මත කර ගන්න පුළුවන්. සම්මත කර ගත්තාට පස්සේ මේකට කාලයක් ගත වෙනවා. සීමා නිර්ණය කරන්න. අපි මේ රටේ ජනතාව බලය දුන්නේ, ලක්ෂ 62 ක් ජනතාව ඡන්දය දුන්නේ දින 100 ක්‍රියාත්මක කරන්න. දින 100. වැඩ 100 නොවෙයි. කවුද මේක හැදුවේ? දැන් මේ හදන්න ආපු පාර්ශව කියනවා, මේකට කල් මදී. මේකට මාස තුනක් වැඩිපුර ගන්න ඕනෑය කියලා. මේ මොකක්ද? මේ පාර්ලිමේන්තුව අප්‍රේල් 23 විසුරවන්න ඕනෑ. ඇයි? පළමුවැනි කාරණය. 2010 දී ජනතාව දීපු ජනමතය මේ පාර්ලිමේන්තුවේ නිරූපණය වෙන්නේ

නැහැ නේ? දැන් බලන්න එක්සත් ජාතික පක්ෂය තීන්දුවක් අරගෙන තිබෙනවා, විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්න. හැබැයි, අලියාට කතිරය ගහලා, ඒ අලියාගේ කතිරයෙන් ගම්පහ දිස්ත්‍රික්කයෙන් පත් වුණු උපේක්ෂා ස්වර්ණමාලී නියෝජනය කරන්නේ මොකක්ද? ගාල්ල දිස්ත්‍රික්කයෙන් මනූෂ නානායක්කාර අලියාගේ කතිරයෙන් ආවේ පාර්ලිමේන්තුවට. දැන් ඔහු නියෝජනය කරන්නේ මොකක්ද? විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ මතයද? නැහැ. ඔවුන් ඉන්නේ කොයි පැත්තේද කියලා දැන් සොයන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව 2010 ජනවරම නියෝජනය කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. 2015 ජනවාරි 08 වැනිදා ගත්ත ජනවරමෙන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට පත් වෙන්න ජනවරමක් දුන්නේ. අපි අහන්නේ, එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ ආසන 41 ක් තියා ගෙන, ඒ අයට ආණ්ඩුවක් හදන්න කවුද ජනවරමක් දුන්නේ? එක ජනවරමකින් තවත් ජනවරමක් යටපත් කරන්න හෝ, එක ජනවරමකින් තවත් ජනවරමක් ආදේශ කරන්න හෝ බැහැ. එහෙම ආදේශ කරන්න බැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සන්ධාන මන්ත්‍රීවරුන්ට, කුමාර වෙල්ගම ඇමතිතුමාගේ ප්‍රවාහන ඇමතිකම අයින් කරන්නය කියලා කවුද අවසරයක් දුන්නේ. මොන ජනතාවද අනුමැතියක් දුන්නේ. ඒගොල්ලෝ විහින් අතඇරියා. මේගොල්ලෝ භාර ගත්තා. ඒ නිසා මේක විකෘතියක්. මේක විපරීතයක්. හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා සැප්තැම්බර් මාසයේ, ඊට මාස හතරකට පහකට කලින් තිබුණු ඡන්දයේදී ඔහු පරාදයි. හැබැයි, ඔහුට ඌව පළාත් සභාවේ මහ ඇමති වෙන්නය කියලා කවුද ජනවරමක් දුන්නේ? දුන්නේ නැහැ. එක ජනවරමකින් තවත් ජනවරමක් ආදේශ කරන්න බැහැ. ඒ නිසා මේ යන විපරීත සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ. මේකට තිත තියන්න නම්, මේක අනික් පැත්ත හරවන්න 2015 ජනවාරියේ ගත් ජනවරමට අනුකූල විධියේ පාර්ලිමේන්තුවක් හදා ගැනීම සඳහා වුණු අයිතියක් ජනතාවට දෙන්න ඕනෑ. ඒ නිසා අපි කියන්නේ, අප්‍රේල් 23 වැනිදා මේක විසුරුවන්න ඕනෑය කියන එකයි.

ඒ විතරක් නොවෙයි. දැන් දින 100 ක් දාලා තිබෙනවා නේ? දින 100 හදන්න ජනතා විමුක්ති පෙරමුණේ අපි හවුල් වුණේ නැහැ. දින 100 හදන්න අපි හවුල් වුණේ නැහැ. හැබැයි, හවුල් වුණු පාර්ශව මේක මහින්ද චින්තනය වාගේ නොවෙයි. මේ සඳහා දින 100 දින පොතකුත් හැදුවා. දින 100 යේ දින දැම්මා. හරි. කමක් නැහැ. ඒ දිනයට ඒ වැඩේ කර ගන්න බැරි වුණාට අපේ ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, දින 100 කර ගන්න පුළුවන් වැඩ ටික අපි කර ගනිමු. ඒකේ අවසානයේ සඳහන් වෙනවා නේ අප්‍රේල් 23 වැනිදා ඡන්දයකට යන්න ඕනෑය කියලා. ඒ අනුව යා යුතුයි. හැබැයි, අපට පේනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඇතුළේ වෙන වෙන දේශපාලන ගේම් ගහනවා. මේ උප්පරවැට්ටි පාවිච්චි කරන්න හදනවා.

දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාව දැන් ඒගොල්ලන්ගේ සභාපතිවරයා බවට පත් කර ගත්තා. ඒගොල්ලන්ට පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙනවා. ඒ දෙක පාවිච්චි කරලා මොකක්ද කරන්න හදන්නේ. මේ විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්න උදව් කරන්නේ නැතිව කල් ගන්න වැඩක් යන්නේ. ජනතාව වරම දුන්නේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. තොඳොල් කරන්න නොවෙයි. අත්තනෝමතික බලතල අයින් කරන්න නොවෙයි. අහෝසි කරන්නයි අනුමැතිය දුන්නේ. දැන් මොකක්ද කරන්නේ? දැන් ඒක තියාගෙන තව කාලයක් අදින්න හදනවා. ඒ උප්පරවැට්ටියට අහුවෙන්න එපාය කියලා අපි කියන්නේ. ඒ විතරක් නොවෙයි. දැන් ඔබතුමා දන්නවා, මේ වෙලාවේ දේශපාලනයේ එක එක ගේම් යනවා. දැන් තමුන්නාන්සේ අහලා ඇති සමහර තැන්වල ස්වාමි පුරුෂයා රට ගියාට පස්සේ එහෙම නැත්නම් දුර බැහැර සේවයට ගිහිල්ලා ඉන්න කොට එහෙම, ඔය වටේ ඉන්න සමහර පිරිමි අර ගෙදර තනියම ඉන්න කාන්තාවට ඇහැලුම් පාන්න පටන් ගන්නවා. කඩේ ගිහිල්ලා එළවළු මල්ල ගෙනැල්ලා දෙනවා. වතුර ටික ඇදලා දෙනවා. ඔය වාගේ උදව් උපකාර ස්වේච්ඡාවෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, අයුතු වාසි ප්‍රයෝජන ගන්න ඔලුවේ තියා ගෙන. ඒ වගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය මේ වෙලාවේ පොඩ්ඩක් වැඩිපුර පේන්නේ නැති කොට, නායකත්වය පිළිබඳ නිකම් දුර්මත ඇති වෙමින් තිබෙන වෙලාවේ නායකත්වය තවම ස්ථාවර නැති වෙලාවේ, අර වටේ ඉන්න පිරිමි වාගේ සමහර අය අයුතු ප්‍රයෝජන ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩිපුර කඩේ යන්න - එළවළු මල්ල ගෙනැල්ලා දෙන්නම්, වතුර ඇදලා දෙන්නම්, දර පලලා දෙන්නම් කියලා එහෙම යන එකකුත් තිබෙනවා. ඒ නිසා ඒවායෙන් බේරෙන්නත් ඕනෑ.

ජනවරම ලැබුණේ, විධායකයේ අත්තනෝමතික බලතල අහෝසි කරන්න නොවෙයි. විධායකය අහෝසි කරන්න.

[ගරු නලින්ද ජයතිස්ස ]

අපි අහන්නේ, දැන් රටේ ජනතාවත් එක්ක සාකච්ඡාව තිබ්බේ මොකක්ද? රාජ්‍යයේ ප්‍රධානියා ජනාධිපති. විධායකයේ ප්‍රධානියා ජනාධිපති. සන්නද්ධ අංශයේ සේනාධිනායකයා ජනාධිපති. කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ජනාධිපති. මේක තමයි විධායකයේ එක බලයක්. මේක අහෝසි කරන්න. දැන් මොකද කරලා තිබෙන්නේ? දැන් කරලා තිබෙනවා. රාජ්‍ය නායකයා ජනාධිපති. කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියාත් ජනාධිපති. මේකට අවසරයක් දුන්නේ කවුද? මේ යන්නේ වෙන ගමනක්. ජනතා පරමාධිපත්‍යයට පිටුපාලා පයින් ගහලා යන ගමනක්. මේකට ඉඩ දෙන්න බැහැ. මේ යන්නේ වෙන ගේමක්. මේ දේශපාලන ගේම්වලට ඉඩ දෙන්න බැහැ. තම තමන්ගේ පක්ෂවල නායකයන්ට රාජයෝග තිබෙනවා කියලා කේන්ද්‍රකාරයෝ කියන්න පුළුවන්. හැබැයි, ඒ අනුව ව්‍යවස්ථාවට අඩ තියන්න දෙන්න බැහැ. ජනතාව වරමක් දුන්නා නම් ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා අපි මැතිවරණ ක්‍රමය සංශෝධනය කරමු. නමුත් මැතිවරණ ක්‍රමය සංශෝධනය කරලා, ඒකට යම් කාලයක් ඕනෑ නම් ඒ සඳහා කොමිසමක් හදලා යන්න. හැබැයි, අප්‍රේල් 23 වැනිදා පාර්ලිමේන්තුව විසුරවලා. (බාධා කිරීම්) අප්‍රේල් 23 වැනිදා පාර්ලිමේන්තුව විසුරවලා ජනතාවට තමන් කැමැති ආකාරයේ පාර්ලිමේන්තුවක් පත් කර ගැනීම සඳහා බලය දෙන්න ඕනෑය කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්. මේ සභාවේ කාලය පිළිබඳ රීති අත්හිටුවලා තිබෙන්නේ. ඒ පිළිබඳව මම ගරු ඔබතුමාට සිහිපත් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීවරුන් කාලය ප්‍රවේසම් කර ගෙන කථා කරන්න. තව කථා හතරක් තිබෙනවා.

[අ.භා. 01.16]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. අපි දන්නවා, විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක පාර්ලිමේන්තුවේ නියෝජන තිබුණු රටක් හැටියට, විශේෂයෙන්ම අපේ රටේ මුල ඉඳන්ම ආසන ක්‍රමය තියලා 1978 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ අද තිබෙන ක්‍රමය අපට හඳුන්වලා දුන්නා. ඒ ක්‍රමය තුළ අඩුපාඩු තිබෙන්න පුළුවන්. ඒ ක්‍රමය තුළ යම් යම් දේවල් පිළිබඳව ගැටළු තිබෙන්න පුළුවන්. නමුත් ඒ ක්‍රමය තුළ විශේෂ දෙයක් තිබුණා. ඒ තමයි මේ රට තුළ ඉන්න සියලුම ජන කොටස්, ඒ වාගේම සුළු පක්ෂ ඒවාට නියෝජනය කරන්න අවස්ථාවක් මේ ක්‍රමය තුළ ලබා දීලා තිබුණා. ඒ නිසා මේ ක්‍රමය දීර්ඝ කාලයක් මේ රටේ පැවති ක්‍රමයක්. ඒ ක්‍රමය තුළ විශේෂයෙන්ම ප්‍රේමදාස මැතිතුමා එදා 12% ක්ව තිබුණු පාර්ලිමේන්තුවට ඇතුළත් වීමේ, ඒ තිබුණු ප්‍රතිශතය 5% දක්වා එතුමා අඩු කරලා, මේ රටේ නියෝජනය කරන අනෙකුත් සුළු පක්ෂ, ඒ වාගේම සුළු කණ්ඩායම් ඒ මතවාද සියලු දෙනාටම පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන් විධියට, මේ අද තිබෙන ක්‍රමය නැවත සංශෝධනය කරලා, 1989 පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුවා.

ඊට පස්සේ අද මේ තිබෙන ක්‍රමය ගැන තිබෙන ලොකුම චෝදනාව තමයි ගරු සභාපතිතුමනි, මේ මුදල්, මැර බලය හා දූෂණය කියන එක. මම හිතනවා, ඡන්ද ක්‍රමය වෙනස් වුණාය කියලා ඒ මැර බලය, දූෂණය, මුදල් යෙදවීම ඒ වාගේ දේවල් එහෙම වෙනස් වෙන්නේ නැහැ. ඒවා වෙනස් වෙනවා නම්, පවතින දේශපාලන පක්ෂ ඒ පිළිබඳ නීති රීති සකස් කළ යුතුයි. ඒ දේශපාලන පක්ෂයත් ඒ වාගේ නීතිරීති සකස් කරලා, ඒ පිළිබඳව ඒ වාගේ ක්‍රියාමාර්ග ගත යුතුයි. ඒ වාගේම මැතිවරණ නීති වෙනස් විය යුතුයි. යම් පුද්ගලයෙකුට මුදල් වියදම් කිරීම පිළිබඳව මැතිවරණ නීති අලුතින් ගෙන ආ යුතුයි. එහෙම නැතිව මේ ක්‍රමය වෙනස් වුණාය කියලා, අපි ආසන ක්‍රමයට ගියාය කියලා මුදල් වියදම් කිරීමේ ප්‍රමාණය, එහෙම නැත්නම් මැර බලය ඒ සියලු දේවල් වෙනස් වෙන්නේ නැහැ. ඒවාට අලුතෙන් නීති සංශෝධනය කරලා තමයි මේවා අපට හදා ගන්න වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අද අපි

දන්නවා. ඊළඟට තිබුණු දේ තමයි විශේෂයෙන්ම අර කේවල ආසන මට්ටමේ තිබුණු ක්‍රමය, බහු ආසන කියලා ක්‍රමයක් තිබුණා. ඒ බහු ආසන ක්‍රමය ආවේම විශේෂයෙන්ම යම් ආසනවල ජන සංයුතියේ වෙනස්වීම් තිබුණා. යම් යම් ජනවර්ග කිහිපයක් නියෝජනය කරපු ආසන මේ රටේ තිබුණා. මැද කොළඹ ආසනය. නුවර එළිය, මස්කෙළිය. ඒ වාගේම බේරුවල ආසනය. ඊළඟට මඩකලපුව ආසනය වාගේ ආසන තිබුණා. විශේෂයෙන්ම ඒ ආසනවල තිබෙන ජන සංයුතිය අනුව මන්ත්‍රීවරුන් දෙදෙනෙක්, මන්ත්‍රීවරුන් තුන් දෙනෙක් කියලා ඒ වාගේ බහු ආසන තිබුණා. අපි ඒවාට කිව්වා, බහු ආසන කියලා. නමුත් අපට මේ අලුතෙන් හඳුන්වා දෙන ක්‍රමය තුළ බහු ආසන ක්‍රමය නැවත නැති වෙලා තිබෙනවා. ඒකේදී බහු ආසන ක්‍රමයක් නැහැ. මම දන්නා තරමින් ලක්ෂයකට එක ආසනයක් කියලා තමයි මේගොල්ලෝ අද අපට කියන්නේ මේ එන අලුත් ක්‍රමය තුළ. ඒ නිසා ඒ බහු ආසන ක්‍රමය නැති වීම තුළ ඒ තමන්ගේ දිස්ත්‍රික්කයේ ආසනය නියෝජනය කරන විවිධ ජන කොටස්වලට පාර්ලිමේන්තුව නියෝජනය කිරීම වරම අහිමි වෙන්න පුළුවන්. ඒක නැති වෙන්න පුළුවන්. ඒක තවදුරටත් වෙන වෙන දේවල්වලට මේ රට නැවත ඇද ගෙන යාමේ තත්ත්වයක් නැවත නිර්මාණය වෙන්න පුළුවන්. ඒ නිසා අද පාර්ලිමේන්තුව නියෝජනය කරනවාය කියලා කියන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ අපි බහුතර මතය විතරක් නොවෙයි. ඒ බහුතර මතය තුළ සුළුතරයන්ගේ අදහසුත් නියෝජනය කරන්න ඉඩ ප්‍රමාණය තිබෙන්න ඕනෑ. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ. එහෙම නැත්නම් අපි ප්‍රජාතන්ත්‍රවාදය කියලා මේකේ තිබෙන බහුතරයගේ අදහස් ප්‍රමාණය විතරක් ගත්තොත් ඒක ප්‍රජාතන්ත්‍රවාදය වෙන්නේ නැහැ. ඒ තුළ නැවත නැවත අනෙකුත් දේවල් නොයෙකුත් නිර්මාණය වෙන්න පුළුවන්.

ඒ නිසා අද මේ අපි ආසන ක්‍රමය ගැන කථා කළත්, ඒ වාගේම අද තිබෙන තත්ත්වය ගැන කථා කළත්, අද තිබෙන මේ ක්‍රමය තුළත් අඩුපාඩුකම් - මීට කලින් කථා කරපු සියලු මන්ත්‍රීවරු කිව්වා, මුදල් අවශ්‍යයි. ජනප්‍රියතාවය අවශ්‍යයි. ඒ සියලු දේවල් මේ තිබෙන ක්‍රමය තුළ දිනා ගන්න අවශ්‍යයි. ඒක ඇත්ත. ඒක අපට නැහැයි කියන්න බැහැ. අලුතෙන් නළුවෙක් ආවොත් අනිවාර්යයෙන්ම විශාල මනාප ප්‍රමාණයක් අරන් ජයග්‍රහණය කරනවා. ඒ වාගේම විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න පුළුවන් චරිතයක් ආවොත් විශාල ඡන්ද ප්‍රමාණය අරගෙන ජයග්‍රහණය කරනවා. නමුත් ඒවා කේවල ආසන ක්‍රමය තුළත් කරන්න පුළුවන්. අපි කියමු එක ආසනයකට මේ රටේ ජනප්‍රිය නළුවෙක් තරග කළොත් අනිවාර්යයෙන්ම අද මේ තිබෙන ජනමතය අනුව ජනතාව හිතන විධියට මේ කේවල ක්‍රමය තුළත් අනිවාර්යයෙන්ම ඔහු මන්ත්‍රීවරයෙක් වන එක වළක්වන්න බැහැ. එහෙම නම් මේ පවතින දේශපාලන පක්ෂ මේ පිළිබඳව යම් තීන්දු තීරණ ගත යුතුයි. දේශපාලන පක්ෂ මේවාවල වගකීම දැරිය යුතුයි. ඒ වාගේම මුදල් ප්‍රමාණය ගැන අපේක්ෂකයෙක් කොයි තරම් මුදලක් වියදම් කළ යුතුද? ඒක කේවල මනාප ක්‍රමය කියලා නැහැ. මැතිවරණ නීති ගෙනැල්ලා එක අපේක්ෂකයකුට වියදම් කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය අපි නීතිගත කළ යුතුයි. ඒ තුළ තමයි මොන මැතිවරණ ක්‍රමය ආවත් සියලු දෙනාටම සාධාරණ මැතිවරණ ක්‍රමයක් වෙන්න ඕනෑ. ඒක දුප්පත් අපේක්ෂකයකු වුණත්, පොහොසත් අපේක්ෂකයකු වුණත් මොන අපේක්ෂකයා වුණත් සියලු දෙනාටම ඒ මැතිවරණ නීති එක හා සමානව තිබිය යුතුයි.

ඊළඟට තිබෙන දේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දින 100 වැඩ සටහන. මේ දින 100 වැඩ සටහනේ තිබෙන්නේ අපි පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න නීති සම්පාදනය කරනවා. ඒවා සම්මත කරනවාය කියලා විතරයි. එහෙම නැතිව මේ ක්‍රමය වෙනස් කරලා මැතිවරණයකට යනවා කියලා මේ දින 100 වැඩ සටහනේ නැහැ. නමුත් අපි දන්නවා අද තිබෙන විපක්ෂය. ඒ විපක්ෂ නායකතුමා යම්යම් කොන්දේසි දානවා මේ දින 100 ගෙනියන්න. මම කියනවා, අද මේ තිබෙන්නේ විකෘති පාර්ලිමේන්තුවක්. ඒ විතරක් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ජනවරමට විරුද්ධ ජන මතයක් තිබෙන, විරුද්ධ ජන වරමක් තිබෙන, විකෘති පාර්ලිමේන්තුවක අපි මේ වැඩ කරන්නේ. මගේ පෞද්ගලික අදහස නම් දින 100 නොවෙයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජයග්‍රහණයත් එක්කම මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරලා අපි පාර්ලිමේන්තු ඡන්දයකටම යන්න තිබුණේ. ඒක කර ගන්න අපට බැරි වුණා. මේ දින 100 උඩ අපි හිර වෙලා හිටියා. එහෙම නැත්නම් අද මේ පාර්ලිමේන්තුවත් එක්ක ගනුදෙනු කරන්න අපට සදාචාරමය අයිතියකුත් නැහැ. මොකක්ද මේ පාර්ලිමේන්තුව? මහින්ද රාජපක්ෂ මැතිතුමාට මහින්ද චින්තනය යටතේ ලැබුණු ජනවරමක් තිබෙන පාර්ලිමේන්තුවක්. යහපාලනය වෙනුවෙන් ඡන්දය දීපු

[ගරු මෙහොමඩ් මුජිබුර් රහුමාන් ]

පාර්ලිමේන්තුවක් නොවෙයි මේ තිබෙන්නේ. මේකේ කුඩුකාරයෝ ඉන්නවා. එතනෝල් කාරයෝ ඉන්නවා. මේකේ ස්ත්‍රී දූෂකයෝ ඉන්නවා. එක එක අය ඉන්න පාර්ලිමේන්තුවක්. මේ පාර්ලිමේන්තුවත් එක්ක අපි කොහොමද යහපාලනය වෙනුවෙන් තීන්දු තීරණ ගන්නේ. යහපාලනයට කොහොමද අපි සහයෝගය ගන්නේ. අපට මේ පාර්ලිමේන්තුවෙන් සහයෝගය ගන්න බැහැ. මේ පාර්ලිමේන්තුවෙන් අපට සහයෝගය බලාපොරොත්තු වෙන්න බැහැ. මොකද, මේ පාර්ලිමේන්තුව මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පසුගිය කාලයේ සුදු වැන් සංස්කෘතියට, ඒකාධිපති බලයට, එයාගේ පවුල් බලයට, දූෂණය කරන්න 18 වැනි සංශෝධනය ගෙනැල්ලා ඒවා සියලු දේ කරන්න අනුමැතිය දීපු පාර්ලිමේන්තුවත් එක්ක තමයි අපි මේ ගනුදෙනු කරන්න යන්නේ. ඒ නිසා මේ තිබෙන යහපාලනයට සහයෝගය ගන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම කියන්නේ මේ තිබෙන නීතිරීති එක එක ඩිමාන්ඩ්වලට එක එක ඉල්ලීම්වලට මේ දින 100 අපට යට කරන්න බැහැ. අපි අප්‍රේල් 23 වැනිදාට මේ දින 100 අපට ක්‍රියාත්මක කරන්න බැරි නම්, ඒක කරන්න මේ පාර්ලිමේන්තුව අනුමැතිය දෙන්නේ නැත්නම් ඒකට නොයෙකුත් ඉල්ලීම් දාලා, ඒක යටපත් කරන්න හදනවා නම්, ඒකට නොයෙකුත් ඉල්ලීම් දාලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ජනවරම යටපත් කරන්න හදනවා නම්, වහාම අපි පාර්ලිමේන්තුව විසුරුවා හැරලා නැවත පාර්ලිමේන්තු මැතිවරණයකට යා යුතුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

විනාඩි 05 කින් නම් සෑහීමකට පත් වෙන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විනාඩි 05 යි ඔබතුමාට වෙන් කරලා තිබෙන්නේ. විනාඩි 06 ක් විතර යනවා සාමාන්‍යයෙන්.

[අ.භා. 01.24]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මොකද, හේතුව මම ඔබතුමාට සිහිපත් කළා රීති අත්හිටුවලා තිබෙන්නේ කියලා. මේකේ 1.30 වුණාට මේ විවාදයට ඒක වලංගු නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා මංජු ශ්‍රී අරංගල විපක්ෂ නායකතුමාට. මෙම යෝජනාව මෙම ගරු සභාවට යොමු කිරීම සම්බන්ධයෙන්. ගරු සභාපතිතුමනි, අපේ රාජ්‍ය පාලන ඉතිහාසයේ 1815 මාර්තු මාසේ 02 වැනිදා මේ රටේ සෙංකඩගල රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් වුණු දිනයේ සිට මේ මාසේ, මාර්තු මාසේ 02 වැනිදාට පුරා වසර 200 ක් ගත වී හමාරයි. මේ වන විට එදා ලෝකයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි කුඩා රාජ්‍යයන් ආක්‍රමණය කිරීමේ ප්‍රතිපත්තියට පටහැනි, ලෝක සංවිධාන නිර්මාණය වුණාට පස්සේ සෘජුව යම් යම් රාජ්‍යයන් ආක්‍රමණය කිරීමට බලගතු රටවල්වලට තිබුණු අවස්ථාවන් මග හැරී ගියත්, ලෝකයේ යන්තම් පුංචි රාජ්‍යයන් බලවත් රටවල් විසින් ආක්‍රමණය කිරීමේ ක්‍රමවේදයන් නවීන විද්‍යාත්මක ස්වරූපයකින් අලුතින් නිර්මාණය වෙමින් පවතිනවා. ශ්‍රී ලංකාව කියන්නේ, ඉතාමත් සශ්‍රීක භූමියක් හෙබි ඉතාමත් රණකාමී ඉතිහාසයක් ඇති රාජ්‍යයක්. මේ රාජ්‍ය තුළ එදා ඉංග්‍රීසීන්ට යටත් වීමත් සමඟ 1948 අපි නිදහස ලැබුවත් සුද්දාගෙන් ගැලවෙන්න ලැබුණේ 1972 ජනරජ ව්‍යවස්ථාව අනුව. එහෙත් අද වනතුරුත් අපට සිද්ධ වෙලා තිබෙන්නේ මේ විදේශීය ආක්‍රමණශීලී ස්වභාවයන්ට යටත් වෙලා අපේ ජාතියේ ඉදිරි ගමන පිළිබඳ තීන්දු තීරණ ගැනීමටයි. මේක අතිශයින්ම ඛේදනීය තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිසිම දේශපාලන පක්ෂයකට සෘජුව ඇඟිල්ල දික් කරලා කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මේ අලුත් මැතිවරණ ක්‍රමය නිර්මාණය කරපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ඒ තුළින් ඇති වුණු විවිධ රාජ්‍ය තුළ ඇති වුණු, ගැටීම් නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා පැහැදිලිව කිව්වා. මේ මැතිවරණ ක්‍රමය තුළ කේවල ක්‍රමය වෙන්න පුළුවන්. සමානුපාතික ක්‍රමය වෙන්න පුළුවන්. දිනේෂ් ගුණවර්ධන ගරු අමාත්‍යතුමා නිර්මාණය කරන්න උත්සාහ කරපු ජර්මන් ෆෙඩරල් ක්‍රමවේදය වෙන්න පුළුවන්. මේ මොන මැතිවරණ ක්‍රමය

ගෙනාවත් මේ මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයෝ ඒ පක්ෂවලින් නම් කරන අපේක්ෂකයෝ ඔවුන්ගේ හැසිරීම් සහ ඔවුන්ගේ කල්ක්‍රියාව අනුව තමයි මොන මැතිවරණ ක්‍රමයකට වුණත් වටිනාකම නිර්මාණය වෙන්නේ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද අපට වෙලා තිබෙන දේ බැලුවාම අපට පැහැදිලිව පෙනෙනවා. සමහර තැන්වල ඒ උත්තරීතර පක්ෂවල තිබෙන ගරුත්වය කෙළසලා ඒ පක්ෂ ඉතිහාසයේ පක්ෂ නිර්මාණය කරන්න ලෙයින්, කඳුලින් තමන්ගේ ජීවිත පූජා කරපු මිනිස්සුන්ගේ ගෞරවය කෙළසලා අද පෞද්ගලික බූදල් බවට පක්ෂ පත් කර ගෙන තිබෙන මිනිස්සු අද ඉන්නේ. ඒ නිසා අපි පසුගිය දවස්වල බොහොම සන්තෝෂ වුණා. විපක්ෂය කියන කොට හොරු අල්ලනවා. හිරේ අරිනවා. එල්ලුම් ගස් අරිනවා. කටු ඉපලේ අරිනවා කියන කොට අපි බොහොම සන්තෝෂ වුණා. අනිච්චං දෙයියනේ අද වන තුරු ඉපලේ නොවෙයි ඉලපතු පාරක් ගහ ගන්න කාටවත් බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි සත්‍ය කතන්දරය. ඒ නිසා අද අපි සන්තෝෂ වෙනවා. හෙට දවසේ හරි මේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා නම්. මේ රටේ අහිංසක දුක් විඳින ජනතාවට යුක්තිය සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන් තත්ත්වයක් මේ රට තුළ නිර්මාණය වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමා. පුලතිසි පුරවරයේ ඉතාමත් දරිද්‍රතාවයෙන් පෙළෙන ගම්මානයක බිහි වුණු ග්‍රාමීය නායකයෙක් හැටියට සිරිමාවෝ ඩයස් බණ්ඩාරනායක මැතිනියගේ රත්වත්තේ මැතිනියගේ, ඒ වාගේම සොලමන් ඩයස් බණ්ඩාරනායක මැතිතුමාගේ මේ දෙන්නාගේ අතේ එල්ලිලා කොළඹට ඇවිල්ලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රුධිරයෙන් පෝෂණය වෙලා අද දවස තුළ ඔය ගමන ආවේ. ඉපදුනු ගමන් ආපු ගමනක් නොවෙයි. වසර ගණනාවක් තිස්සේ, වසර 40 කට වැඩි කාලයක් මේ පක්ෂය තුළ දේශපාලන පෝෂණය ලබලා ඒ ශක්තිය, ජවය, පන්නරය ලබලා අද එතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වෙලා තිබෙනවා. අපි සන්තෝෂ වෙනවා. නමුත්, දැන් අපේ ගරු මන්ත්‍රීතුමා චෝදනාවක් ඉදිරිපත් කළා. මේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තු කණ්ඩායමත් එක්ක යහපාලනය කරන්න බැහැයි කියලා. මම ඒ වාගේම චෝදනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අතිගරු ජනාධිපතිතුමාට මේ යහපාලනයේ ප්‍රතිපත්ති, එතුමාගේ හිතේ තිබෙන සොඳුරු ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්න බැහැ. එක්සත් ජාතික පක්ෂයේ කැබිනට් මණ්ඩලයක් එක්ක. මේ දෙපැත්තටම අපට කථා කරන්න පුළුවන්. බොහොම සාධාරණ විධියට කියන්න පුළුවන්. එතුමාගේ ශරීරය තුළ දුවන්නේ නීල රුධිරය. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ. උපතේ අම්මාගේ තාත්තාගේ ඉඳලා මෙතැනට වෙන කල් ආවේ ඒ ගමන. ඒක කාටවත් වෙනස් කරන්න බැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා හෙට මේ පැත්තට ආවාය කියලා එතුමාගේ ඒක වෙනස් වෙන්නේ නැහැ. ඒක වෙනස් කරන්න බැහැ. උත්පත්තිය වෙනස් කරන්න බැහැ. මිනිහෙකුට තමන්ගේ ප්‍රතිපත්ති වෙනස් කරන්න පුළුවන්. උප්පැන්න සහතිකය වෙනස් කරන්න බැහැ. තමන්ගේ අම්මාගේ, තාත්තාගේ නම් දෙක උප්පැන්න සහතිකයේ ලිව්වාට පස්සේ අවුරුදු 20 ක් විතර ගියාට පස්සේ මේ මගේ අම්මයි තාත්තයි කියන්න ඕනෑ නැහැයි කියලා මට වෙන අම්මා කෙනෙකුගේ තාත්තා කෙනෙකුගේ නම උප්පැන්න සහතිකයට දාගන්න බැහැ. එහෙම ලෝකයක් නැහැ. බොරුවට කෑ ගහන්න, බුරන්න පුළුවන්. නමුත් සත්‍ය ඒක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මේ කියන මැතිවරණ ක්‍රම සංශෝධනය. දැන් අපි කියනවා, මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්නේ ඇයි? මොකටද සංශෝධනය කරන්නේ? සංශෝධනය කරන්නේ - අර කියන්නේ සල්ලි තිබෙන මිනිස්සු සල්ලි පාවිච්චි කරලා ඡන්දය ගන්නවා. මැරවරකම් කරන්න පුළුවන් මිනිස්සු මැරවර බලය පාවිච්චි කරලා ඡන්දය ගන්නවා. එහෙමත් නැත්නම් තවත් එක එක මගෝඩි කරලා කරන්න පුළුවන් මිනිස්සු ඒවා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සල්ලි නැති කෙනාට සල්ලි හම්බ කර ගන්න අවශ්‍ය මානසික තත්ත්වය, ජන විඥානය වෙනස් කළේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. කොටින්ම කියනවා නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර මිනිස්සු ඇවිල්ලා අපට කියනවා, තමුන්නාන්සේට කවදාවත් ඉස්සරහාට යන්න ලැබෙන්නේ නැහැ ඔය විධියට. කරුණාකරලා සල්ලි ටිකක් සොයා ගන්න ඡන්දය කරන්න කියලා. ඒ තරමට ජන විඥානයට හානියක් කළා. මේක තමයි සත්‍ය. මේ පගා ගහලා, හොරකම් කරලා, මගෝඩි කරලා සල්ලි හම්බ කරපු ඒ දේශපාලඥයන්ට සමහර අය සාප කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මිනිස්සු කියන්නේ ඒක සාධාරණයි කියලයි. තව ටිකක් සොයා ගනින්. නැත්නම් ඡන්දය කරන්න බැහැ දිස්ත්‍රික්කයක් වටේ දුවලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[ගරු ජගත් අංගගේ ]

කළුතර දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙක් හැටියට ඔබතුමා දන්නවා කළුතර දිස්ත්‍රික්කය කියන්නේ මොරටුවේ දිගරොල්ල පාලමෙන් පටන් ගත්තාම අත්වැල්තොට වෙනකම් ඡන්දය ඉල්ලන්න යන්න ඕනෑ. අර නෙළුවේ කෙළවරට වෙනකම් යන්න ඕනෑ. දැන් මේ කොළඹ දිස්ත්‍රික්කයේ මහත්වරු පානදුරේ පාලම ළඟින් පටන් ගත්තාම කැලණි පාලම ළඟට වෙනකල් යන්න ඕනෑ. මෙහෙන් යන්න ඕනෑ අවිස්සාවේල්ලට යනකල්. ඡන්දය ඉල්ලන්න. ඊට පස්සේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහත්වරු. කැලණි පාලම ළඟින් පටන් ගත්තාම තෝප්පුවේ පහළගමට යන්න ඕනෑ එහා පැත්තෙන්. මේ පැත්තෙන් අත්තනගල්ල කෙළවරට යන්න ඕනෑ. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මේක කරන්න බැහැ. පෝස්ටරයක් ගැහුවොත් එහෙම විශාල මුදලක් ඕනෑ. ඒක ඇත්ත. කටවුට් එකක් ගහන්න බැහැ. ඒක කරන්න බැහැ. ගහන්න බැහැයි කිව්වාට මිනිස්සු අඳුරගන්නත් එපැයි ඡන්දය ඉල්ලන්න. ජනතාවට මේ තත්ත්වය තුළ මුහුණ දෙන්න මහජන නියෝජිතයෝ හැටියට පුළුවන්කමක් නැහැ. ඒක තමයි මේ ප්‍රශ්නය. ඉතින් මේ කියන කාරණාව හරි. දැන් අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මෙතැනින් ගියා. එතුමාත් හිටියා නම් හරි වාසනාවක්. දැන් මේ පවතින ක්‍රමවේදයන් තුළ කොහොමද සර්ව සාධාරණ මනුෂ්‍යයෙක් තමන්ගේ උගත්කම කොපමණ තිබුණත්, තමන්ගේ ශක්තීන් කොපමණ තිබුණත් මේ කියන අනෙකුත් වරප්‍රසාද නැත්නම්, සල්ලි නැත්නම් අර කිව්වා වාගේ මොනවා හරි අර මීඩියා කම්පැනි දෙකක් තුනක් නැත්නම්, එහෙම නැත්නම් තමන්ගේ බාප්පා හරි තාත්තා හරි ඇමතිවරයෙක් වෙලා හිටියේ නැත්නම් ඒ ශක්තීන්, වරප්‍රසාද ජනතාව හඳුනන්නේ නැති වුණොත් එහෙම කොපමණ සාධාරණ මිනිහෙකුටවත් මේ මැතිවරණ ක්‍රමය තුළ ඉස්මතු වෙන්න බැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න. මම මූලාසනයට ගරු කරනවා. නමුත් මම ඊට වැඩිය රීතිවලට ගරු කරනවා. මේ රීති අනුව ඔබතුමාට මට එහෙම නියෝගයක් කරන්න අවස්ථාවක් නැහැ. සමාවෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලිවම ප්‍රකාශ කර සිටින්නේ, සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ යම් විධියක කුඩා පක්ෂවලට, දේශපාලන අධිකාරිය තුළ හැසිරෙන කුඩා පක්ෂවලට - ඔවුන්ගේ හොඳ අදහස් තිබෙනවා. යෝජනා තිබෙනවා. ඔවුන්ට ජන සමාජයක් තිබෙනවා නියෝජනය කරන්න. ලංකා සම සමාජ පක්ෂය. කොමියුනිස්ට් පක්ෂය. සමහර පක්ෂ තිබෙනවා ලොකු පක්ෂ කියලා හිතාගෙන. ඒගොල්ලන්ගේ පක්ෂවල නම් කිව්වොත් එහෙම මගෙත් එක්ක අමනාප වෙයි. නමුත් පොඩි පක්ෂ. මේ හැම පක්ෂයකින්ම නියෝජනයක් පාර්ලිමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල තිබෙනවා නම් ඒක අතිශයින්ම වැදගත් කාරණාවක්. මොකද, මේ රටේ කිසිම පුද්ගලයෙක් නොවැදගත් පුද්ගලයෙක් හැටියට අපි නොසලකන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ කේවල ඡන්ද ක්‍රමය තුළ, 1948 න් පස්සේ විවිධ අවස්ථාවලදී ඇති වුණු සිද්ධි අපි දැක්කා. ඩඩ්ලි සේනානායක මැතිතුමා මොනතරම් අවිහිංසාවාදී දේශපාලඥයෙක්ද කියන එක අපි දැක්කා. ඩී.එස්. සේනානායක මැතිතුමා, එතැනින් එහාට බණ්ඩාරනායක මැතිතුමා දේශපාලන කරළියට ආවාට පස්සේ එතුමා අලුතින් පක්ෂයක් හදාගෙන 1956 වන කොට මොන තරම් නිහතමානීව දේශපාලනය කළාද? ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තමන්ගේ සන්තකයේ තිබුණු සියලු දේවල් මේ රට වෙනුවෙන් දෙමින්, තමන්ගේ ඉඩකඩම් පරිත්‍යාග කරමින් - මේ රටේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නිර්මාණය කරන්න අනුමැතිය දීලා කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමන්ලා එක්ක මේ ඉතිහාසය තුළ මොන තරම් ප්‍රගතිශීලී ව්‍යාපාර ක්‍රියාත්මක කළාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලා රදළයෝ තමයි දේශපාලනය කළේ. මේ රටේ පාර්ලිමේන්තුවේ රදළයින්ගෙන් භාගයක් හිටියේ. රදළයින් කිව්වේ කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1815 දී සුද්දා අපව යටත් කර ගත්තාට පස්සේ, සුද්දාත් එක්ක සමීපව ඇසුරු කරපු, සුද්දාගෙන් වරප්‍රසාද ලත් පන්තියට තමයි මේ රටේ දේශපාලන අයිතිවාසිකම් තිබුණේ. ඒවා මම නම්වලින් කියන්න ඕනෑ නැහැ. ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා ඒවා ඉතා පැහැදිලිව දන්නා කාරණා.

නින්දගම් තිබුණේ ඒගොල්ලන්ට. ඒගොල්ලන්ට තමයි මේ රටේ ඉඩම්වලින් භාගයකට අයිතිවාසිකම් තිබුණේ. ඉතින් ඒගොල්ලන්ට ඕනෑ තරම් සල්ලි තිබුණා. ඒගොල්ලෝ නම්බුවට දේශපාලනය කළා. අද නම්බුවට දේශපාලනය කරන අයට වැඩිය ඉන්නේ - සමහර අය ඉන්නේ කිව්වා, මහජන සේවකයෝ කියලා. මහජන සේවකයෝ වුණාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන සේවකයෝ කලක් යන කොට මහජනයාගෙන් යැපෙන්නෝ බවට පත් වුණා. දැන් අපේ මැම්බර් මහත්තයාට ඉස්සර පඩි ගෙව්වේ නැහැ. හැබැයි, මැම්බර් මහත්තයා මැම්බර්කම දාලා පැනලා ගියෙත් නැහැ. නමුත් මම කියන්නේ නැහැ වේතනයක් නැතිව මේකට කැප වෙලා වැඩ කරනවා නම් ඒ කෙනෙකුට ඒ සේවය කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. වෙන රැකියාවක් කරන්නේ නැත්නම්, ව්‍යාපාරිකයෙක් නොවෙනවා නම්, රැකියාවෙන් ඉල්ලා අස්වෙන්න ඕනෑ නම් දේශපාලනය කරන්න. මේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඒ අයට ජීවත් වෙන්න ඒ මැතිවරණ රාජකාරීවල යෙදෙන්න තමන්ට අවශ්‍ය පහසුකම් සැපයීම සාධාරණයි. ඒක මම නැහැයි කියලා කියන්නේ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, ඉස්සර දේශපාලනය කළේ මීට වඩා ගැඹුරු ක්‍රමයකට. දැන් අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, අර කරුණු මතක් කරන කොට මට මතක් වුණේ, ඉස්සර මැම්බර් ක්‍රමය තියෙන කොට මොකද හේතුව, මට මතකයි අපි පුංචි කාලයේ වාද්දුවේ සුළු නගර සභා ඡන්දය තිබුණා. සුළු නගර සභා ඡන්දය ඉවර වෙලා එතකොට සභාපතිවරයා තෝරන්නේ අර මැම්බර් මහත්වරුන්ගේ ඡන්දයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු මැම්බර් මහත්වරු හිටපු ගමන් අතුරුදහන් වෙනවා. උස්සන් යනවා. උස්සගෙන ගිහිල්ලා ඡන්දයෙන් පස්සේ මැම්බර් මහත්වරු සොයා ගන්න පුළුවන් වෙනවා. තමන්ගේ පිලට අවාසි නම් අර පැත්තේ හතර දෙනයි, මේ පැත්තේ පස් දෙනයි නම් පස් දෙනාගේ පැත්තෙන් දෙන්නෙක් උස්සනවා. එතකොට පරාද වුණු පැත්තේ අය තමයි දිනන්නේ. අර අය එන්නේ ඡන්දය තිබුණාට පස්සේ. දැන් එහෙන් මෙහෙන් කෑ ගහනවා. අර මිනිස්සුත් ඇවිල්ලා කියනවා මොනවා කරන්නද? මම අසනීප වෙලා හිටියා. අරෙහෙ ගිහිල්ලා හිටියා. මෙහේ ගිහිල්ලා හිටියා. ඉස්සුවා කියලා කියන්නෙත් නැහැ. එතකොට කරන්න දෙයකුත් නැහැ. මේවායේ හොඳ නරක දෙපැත්තම තිබෙනවා. ගම්සභා ක්‍රමය තුළ සුළු නගර සභා තුළ ඒ විධියට තමයි ඒ පැතිවල ක්‍රියාත්මක වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම දෙයක්ම ක්‍රියාත්මක කිරීමේදී සද්භාවය, හෘද සාක්ෂිය තුළ තමන් කරන්නේ කුමක්ද යන කාරණාවට පිළිතුරක් සපයා ගනිමින් ක්‍රියාත්මක වීම අතිශයින් වැදගත්. දැන් බලන්නකෝ එක එක පක්ෂවල. ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්. විපක්ෂය වෙන්න පුළුවන්. ඇමතිකම් ප්‍රදානය කිරීම. කවුද ඇමතිකම් ප්‍රදානය කරන්නේ? ඇමතිකම් ප්‍රදානය කරන්නේ ඒ පක්ෂයේ නායකතුමා, ජනාධිපතිතුමා, එහෙම නැත්නම් අගමැතිතුමා. ඒ අය. දැන් මේ අගමැතිතුමා, ජනාධිපතිතුමා කියන්නේ සාමාන්‍ය බුදුවරුද? එහෙම නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දරුවෝද? එහෙම නැත්නම් නබිනායකතුමාගේ කවුරු හරිද? නැහැ. පෘථග්ජන මිනිස්සු. ඉතින් මේකට වැඩියෙන් ප්‍රශස්ති ගීත ගායනා කරන්න ඕනෑ. අනේ නායකතුමනි, ඔබතුමා නිසා තමයි ඉරහඳ පායන්නේ. මේ රටේ ජනතාව ඔබතුමා ගැන බොහොම ශ්‍රද්ධාවෙන්, ගරුත්වයෙන් ඉන්නේ. ඔබතුමා නැත්නම් අපට ආත්මයක් නැහැ. ජීවිතයක් නැහැ. එහෙම කියන්න ඕනෑ. එහෙම කිව්වාම තමයි මූ මගේ සුවච කීකරු ගෝලයෙක්, දෙන්න ඕනෑ ලොකුම එක කියලා දෙන්නේ. ඔය ආවාට ගියාට පූජා කරලා නැහැ ඕවා. එහෙම තමයි දෙන්නේ. ඒ නිසා අපි ප්‍රතිපත්ති මත පිහිටලා කටයුතු කරන්න ඕනෑ. නැති වෙනවා ඇති වෙනවා වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමාට මේ රාජකාරිය කරන්න මම හිතන්නේ ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සහයෝගය තිබෙනවා. නමුත් ආණ්ඩු පක්ෂය විපක්ෂයේ සහයෝගය ප්‍රතික්ෂේප කරනවා. දැන් ඒක මෙතුමාගේ කථාවේදී පැහැදිලි වුණා. දැන් අපි හිතාගෙන ඉන්නේ මේකේ අනික් පැත්ත. දැන් පසුගිය දවස්වල අපි දැක්කා පාර්ලිමේන්තුවේ ලොකු සටනක්. මේ දරුවෝ ටික රණ්ඩු කරනවා. ඉතින් නායකතුමාට වෙන විවේකයක් නැහැ. ඒ ගැටළු විසඳනවා මිසක්. ඒ ගැටළු විසඳන්න යන්න ඕනෑ. රණ්ඩු කරන කොට රණ්ඩු බේරන්න එපැයි. ඒවාටත් කාලය ගත වෙනවා නේ. එතකොට රණ්ඩු වුණාට පස්සේ දන්නවා නේ එක එක්කෙනාගේ ඔළුවලට පොඩි පොඩි විෂ බීජ ඇතුළු වෙලා කියලා. ඉතින් මේ අර්බුද. මේ අර්බුද මැද්දෙන් ගිහිල්ලා ජනාධිපතිතුමාට සිද්ධ වෙනවා, තමන් ජනතාවට දීපු පොරොන්දු ඉෂ්ට කරන්න. මේ ජනතාවට දීපු පොරොන්දු අතිගරු ජනාධිපතිතුමාට ඉෂ්ට කර ගන්න බැරි වුණොත් එහෙම, එතුමා අප්‍රසාදයට ලක් වෙනවා. එතුමා අප්‍රසාදයට ලක් වීම නිසා අද කටයුතු කරන්නේ විපක්ෂය නොවෙයි.

[ගරු ජගත් අංගගේ ]

ආණ්ඩු පක්ෂය කියන එක මම ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කරනවා. විපක්ෂයේ එහෙම ක්‍රියාවලියක් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම දැන් මේ හැමෝම කථා කළා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා මේ මැතිවරණ ක්‍රම සංශෝධනය. ජනාධිපති ක්‍රමයේ බලතල අහෝසි කිරීම හෝ බලතල අඩු කිරීම පිළිබඳව මම විශේෂයෙන් කථා කරන්නේ නැහැ. අපේ ගෞරවනීය හාමුදුරුවෝ බලාපොරොත්තු වෙනවා ඒක කරන්න. ඒක උන්වහන්සේගේ නායකත්වය යටතේ නේ කරන්නේ. සෝභිත නායක ස්වාමීන් වහන්සේ ඒවා බලා ගනියි. මොකද, අපි දඟලන්න හොඳ නැහැ ඒවාට. මොකද හේතුව, ස්වාමීන් වහන්සේ කෙනෙක් නායකත්වයක් අරන් කරන වැඩකට අපි වාගේ පොඩි පොඩි මිනිස්සු ඇඟිලි ගහන්න යන්න ඕනෑ නැහැ. උන්වහන්සේ ඒක කරයි. අපට තිබෙන්නේ, දැන් මේ ඊළඟ ක්‍රමය පිළිබඳව බලන්න. මොකද, මැතිවරණ ක්‍රමය අපට තදින්ම බලපානවා. ඔබතුමන්ලාටත් යටි මඩි ගහපු සල්ලි නැහැ. මටත් මඩි ගහපු සල්ලි නැහැ. අපි මේ බහුතරයකට ඒ විධියට සල්ලි නැහැ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය තුළ ඇති වන කේවල ක්‍රමය සහ සමානුපාතික ක්‍රමය තුළ පාර්ලිමේන්තුවට ඇතුළු වෙන්න, පළාත් සභාවට ඇතුළු වෙන්න මේක පාර්ලිමේන්තුවට විතරක් නොවෙයි. පළාත් සභාවටත් බලපාන්න ඕනෑ. මොකද හේතුව, දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමවේදයන් දෙකටම තිබෙන්නේ. එතකොට අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව හරි වැදගත්. බණ්ඩාරගම ආසනයේ ඡන්ද 138,000 ක් තිබෙනවා. නගර සභාවක් කළේ නැහැ. තනිකර ප්‍රාදේශීය සභාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා. මේ ප්‍රාදේශීය සභාව පාලනය කරන්නේ කොහොමද? මැතිවරණ ක්‍රමය ආවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද 60,000 කට එක ආසනයක් වෙන් වෙන්න ඕනෑය කියලයි. දැන් කොහොමද කරන්නේ. දැන් පුළුවන්ද එක මහජන නියෝජිතයෙක් වෙන් කරලා දුන්නොත් මේ ජනතාවගේ දුක සැප බලන්න. මේ පවතින ක්‍රමය තුළ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙපමණ විශාල ඡන්දදායකයින් සංඛ්‍යාවකට තමන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව සලකා බලා උදව් කරන්න මේ මහජන නියෝජිතයන්ට ශක්තිය නැහැ. හැකියාව නැහැ. ඒ නිසා මේ පිළිබඳව ලොකු කථිකාවතක් ඇති වෙන්න අවශ්‍යයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, දැන් කාලය ඉක්ම ගිහිල්ලා තිබෙනවා. ඔබතුමාගේ කථාව කෙටි කරලා - තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. ඔබතුමාගේ කථාව බොහොම හොඳයි. බොහොම පැහැදිලියි. ඉතිහාසය තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථික ලේඛනයේ හතර වැනියාට හිටියේ. මම දන්නේ නැහැ. මේ යහපාලනය හරි, වෙන පාලනය හරි, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාලනය හරි මොන පාලනය හරි විකෘතියට සිද්ධ වෙනවා. විකෘති වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම නොවෙයි ලැයිස්තුව හදලා තිබෙන්නේ. ඒ විධියට තමයි -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට චෝදනා කරනවා නොවෙයි. මම කියන්නේ මේවා මේ ලෝකයේ වෙනවා. එහෙම කාලයක් මේක. අබුද්දස්ස කාලයට වෙන දේවලුත් වෙනවා නේ. ඒ නිසා මම ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ. මම ඔබතුමාට අවනත වෙනවා. ඔබතුමා මූලාසනය (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇමතිවරයෙක් වෙලා හිටපු කාලයේ කථා කළේ නැහැ නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඇමතිකමක් දීලා තිබුණා ඉස්සෙල්ලා. මම ඇමතිකම කළා. මට, ඒ ඇමතිකමට අද කාටවත් අභියෝග කරන්න බැහැ. අද දවසේ මම කරපු දේකට. හරිද? හැබැයි, මම තවමත් කියනවා. මේ සමානුපාතික ඡන්ද ක්‍රමයට අනේ දෙවියනේ

මේක වෙන්න. මොකද හේතුව, දැන් මේ දවස්වල මේ සභාව තුළ සම්පත් බෙදෙන විධිය බැලුවත් මේ ගැන මට ගහන්න හිතෙනවා කුණු වෙන්න. නමුත් උඩ බලාගෙන කෙළ ගහන්න බැරි නිසා කට වහගෙන ඉන්නවා. මොකද, ඒක එහෙම වෙන්න බැහැ. මොකද, ගත්ත දවසේ ඉඳලා ඡන්දයට කෙළින්න අනික් උන් ටික සේරම යට කර ගෙන ගහලා, ෆ්ලැට් කරලා දාලා මම විතරක් දෙන්නම් ගේම කියලා හිතාගෙන ගේම් දෙනවා. ඉතින් අපටත් හිතෙනවා, අනික් පැත්තට කැරකිලා දෙන්න. මොකද, අපිත් පෘතග්ජන මිනිස්සු නේ? මේ කෙළින්නේ අපට කියලා අපට තේරෙනවා නේ? ඒ නිසා මම ඒ දත්ත සියල්ල එක්කාසු කර ගෙන ඉන්නේ. එක දවසක එක මොහොතකදී මේ ආසනයේ ඉඳලා මම ගහනවා කුණු වෙනකල්. ඒක මම හිතාගෙන ඉන්නේ. මට යන්න තැනකුත් නැහැ. වැටෙන්න තැනකුත් නැහැ. මම කාටවත් යටත් වෙලත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට මගේ ගරුත්වය සහ ප්‍රසාදය පිළිගන්වනවා. මොකද, හේතුව, මේ පිළිබඳව කථිකාවතක් ඇති වෙන්න ඕනෑ. මෙහි අඩුපාඩුකම් ගොඩක් තිබෙනවා. මේක හෙට වෙනස් කරපන් කිව්වාට, වෙනස් කළාට මේකේ ප්‍රතිඵල ලබන්න පුළුවන්කමක් නැහැ. මේ කාගේත් ජනමතයට සවන් දෙන්න ඕනෑ. මේවායේ ගත යුතු පුංචි පුංචි කාරණා තිබෙනවා. ඒ සියල්ලම ඒකරාශී කරලා, මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේදී අපි එය ඉතාමත් නිවැරදිව, ජනතාවාදීව සහ මේ මැතිවරණ ක්‍රමයට දායක වෙලා ඡන්දය අපේක්ෂා කරන අපේක්ෂකයන්ටත් සාධාරණයක් ඉෂ්ට වෙන්න, ජනතාවටත් සාධාරණයක් ඉෂ්ට වෙන්න කියන ක්‍රියාවලියකට අපි සියලු දෙනා එකට එක්වෙලා කටයුතු කරමු කියලා යෝජනා කරමින්, නැවත වතාවක් මගේ ස්තුතිය, ප්‍රසාදය පිරිනමමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.44]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ කථාවලින් පේන්නේ කැමැතියි, අකමැතියි වගේ එකක්. සමහරු කැමැතියි. සමහරු අකමැතියි. මම හිතන්නේ මේ යෝජනාව ගෙන ඒම ගැන විශේෂයෙන්ම අපේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. එතුමා ආසනයේ පරදිනවා. නමුත් එතුමා දන්නවා මේකේ තිබෙන වැදගත්කම. ඒ නිසා ඒ ගැන මගේ ප්‍රණාමය පුද කරනවා. මම ගොඩක් දිගට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් කාරණා කිහිපයක් මතු කරන්න බලාපොරොත්තු වෙනවා. වසර ගණනාවක් තිස්සේ මේ රටේ දේශපාලනය ඇතුළේ විශාල වශයෙන් මන්ත්‍රීවරු, ඇමතිවරු, පක්ෂ නායකයෝ, දේශපාලන විශ්ලේෂකයෝ, විවිධ මට්ටම්වල අය අතර තිබුණු උවමනාවක්, සාකච්ඡාවක් මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කළ යුතුයි කියන එක. මම විශ්වාස කරන්නේ, මේ රටේ තිබෙන ව්‍යවස්ථාව සංශෝධනය වෙනවා නම්, ඒකට අර්ථයක් එක් කළ හැක්කේ මේ මැතිවරණ ක්‍රමයේත් යම් යම් සංශෝධනයක් සිදු කළොත් කියන එකයි. කේවල ක්‍රමයක් ගේන්නේ ඇයි? මේකේ ඉතිහාසය දිහා හැරිලා බැලුවොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත් ඒකේ කාරණා කිහිපයක් ගෙනහැර පෙන්නුවා. සමහර වෙලාවට ලැබෙන ආසන ප්‍රමාණය හා ලැබෙන ඡන්ද ප්‍රමාණය අතර අසාමාන්‍ය විෂමතාවයක් පේන්න තිබුණා. ඉතිහාසයේ. ඒ නිසා තමයි මේ ක්‍රමය ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හඳුන්වලා දෙන්නේ. එදා ඒ හේතුව නිසා ඒ මතු වුණු අඩුපාඩුව මකාගන්න පුළුවන් වුණත්, මේ ක්‍රමයේ විශාල අඩුපාඩු පසුගිය කාලයේ අපට දකින්නට ලැබුණා. ඒ තමයි ජනප්‍රිය චෝදනාව, මුදල් බලය තිබෙන අය පාර්ලිමේන්තුවට එනවාය කියන එක. මුදල් බලය තිබෙන අය බලය පැහැර ගන්නවාය කියන එක. හැබැයි, අපි වෙනත් ක්‍රමයක් යෝජනා කළත්, අපි කියන්නේ, කේවල ක්‍රමය යෝජනා කළත් මුදල් බලය තිබෙන අයට ඒ වාගේම පවුල් බලය, දේශපාලන බලය තිබෙන අයට අනිවාර්යයෙන්ම ඒකෙන් වාසියක් ගන්න පුළුවන් වන බව අපි ඉතිහාසය දිහා හැරිලා බැලුවාම දන්නවා. ඒ නිසා ඒ තර්කය එතරම් ශක්තිමත් තර්කයක් විධියට මම නම් පිළිගන්නේ නැහැ. මොකද, මුදල් තිබෙන මිනිහා අනිවාර්යයෙන් තමන්ගේ මුදල් බලය යොදලා, ඒ ඒ ආසනවල බලය පැහැර ගන්න ඉඩ තිබෙනවා.

අපි දන්නවා. විපක්ෂය මේ දවස්වල විශාල අරගලයක ඉන්නවා. අනිවාර්යයෙන් මැතිවරණ ක්‍රමය සංශෝධනය කළ යුතුයි කියලා. අපි දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ආණ්ඩුව නැති වුණත් ඒගොල්ලෝ පසුගිය කාලයේ එක්රැස් කරපු පිල්ලි ගහපු, මඩි ගහපු මුදල් කෝටි, ප්‍රකෝටි ගණනින් තමන් ළඟ

[ගරු සුසිල් කිඳෙල්පිටිය ]

තියාගෙන ඉන්නවා. ඒ දෙගොල්ලන්ට මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ යම් වාසියක් තිබෙනවාය කියලා මම බරපතළ ලෙස විශ්වාස කරනවා. ඔවුන්ගේ මුදල් බලය යොදලා යළිත් වරක් අනිවාර්යයෙන් මේ ආසන ජයග්‍රහණය කිරීම සඳහා කටයුතු කරන එක වළක්වන්න බැහැ. කෙසේ වෙතත් රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න නම්, ඒක අලුතෙන් හදන්න නම්, අලුතෙන් ලියන්න නම් අනිවාර්යයෙන් මෙහි සංශෝධනයක් අවශ්‍යයි. ඒ වාගේම එහෙම සංශෝධනයක් කරනවා නම් මේ රටේ සුළු, කුඩා දේශපාලන පක්ෂවල, සුළු ජන කණ්ඩායම්වල අපේක්ෂාවන්, බලාපොරොත්තු ඉෂ්ට වන, ඔවුන්ට සාධාරණය ඉටු වන ක්‍රමයක් මේ තුළ අඩංගු වෙන්න ඕනෑය කියන එක මම බරපතළ ලෙස විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි ආපහු බැලුවොත් අවසන් වරට කේවල ක්‍රමය යටතේ ඡන්දය පැවැත්වූ ආකාරයත්, අලුතින් කේවල ක්‍රමයකට යනවා නම් එය කෙසේ විය යුතු ද යන්න පිළිබඳවත් බරපතළ අධ්‍යයනයකට යා යුතුයි. විශේෂයෙන්ම සීමා නිර්ණය, ඒ ඒ පළාත්වල ජන සංයුතිය, විවිධ ජන වර්ගවල සංයුතිය පිළිබඳව බරපතළ ඇගයීමකට, විශ්ලේෂණයකට යන්නේ නැතිව ක්‍රමයක් යෝජනා කිරීම, ඉතාම අසාධාරණ ලෙස ඡන්ද හිමියන්ගේ අයිතිවාසිකම් කඩ කිරීමක් විය හැකියි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මේකට යම් කාලයක් ගත වීම වළක්වන්න බැහැ. ඇත්ත වශයෙන්ම ප්‍රධාන දේශපාලන පක්ෂ මේ පිළිබඳව එක මතයකට එන්න පුළුවන්. හැබැයි, සුළු දේශපාලන පක්ෂවල, කුඩා දේශපාලන පක්ෂවල මතය ඊට වැඩිය වෙනස්. ඔවුන්ගේ නියෝජනය තහවුරු වන සාධාරණ ක්‍රමයක් සකස් කිරීම අනිවාර්යයෙන්ම අත්‍යවශ්‍යයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා අර්ථාන්විත නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීම අනිවාර්යයි. ඒ අනුව මා විශ්වාස කරනවා කේවල ක්‍රමයත්, සමානුපාතික ක්‍රමයත් මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් පිළිබඳව පොදු අපේක්ෂාවක්, පොදු එකඟතාවයක් ඇති කර ගත යුතුයි කියලා. ඒකට අවස්ථාව උදා වෙලා තිබෙනවා. සමහර අය කියන්නේ 2/3 බලය රැක ගන්න නම් ඒ ක්‍රමයට යන්න ඕනෑ කියලා. එහි යම් සත්‍යයක් තිබෙනවා. කෙසේ වෙතත් මේ පිළිබඳව පුළුල් සාකච්ඡාවකින් තොරව තීරණ ගැනීම ඉතාමත් භයානකයි කියලා මම බරපතළ ලෙස විශ්වාස කරනවා. සමහර දේශපාලන පක්ෂ තමන්ගේ ගොඩ ආරක්ෂා කර ගැනීම සඳහා යම් යම් යෝජනා, යම් යම් විරෝධතා, යම් යම් පක්ෂපාතීකම් දක්වන්න ඉඩ තිබෙනවා. කෙසේ වෙතත් කිසිදු පක්ෂයක් බලය තහවුරු කර ගැනීම සඳහා මැතිවරණ ක්‍රමයක් ඉල්ලනවා නම්, ඒකට එකඟ වෙන්න බැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනතාව වෙනස් ක්‍රමයක් ඉල්ලනවා. ජනතාව වෙනසක් ඉල්ලනවා. ජනතාව ඉල්ලන්නේ මැතිවරණ ක්‍රමය කේවලද මනාපද කියන එක නොවෙයි. ජනතාව ඉල්ලන්නේ වංචාකාරයෝ, හොරු, දූෂකයෝ පාර්ලිමේන්තුවට එන එක, ජනතා නියෝජිතයෝ හැටියට පත්වන එක වළක්වන්න කියලා. ඒ නිසා මම විශ්වාස කරනවා මේක කේවල ක්‍රමයද, මේක මනාප ක්‍රමයද, මේක සමානුපාතික ක්‍රමයක්ද කියන එක නොවෙයි වැදගත්. හරි පුද්ගලයෝ, සාධාරණ පුද්ගලයෝ ඒ වාගේම උගත් පුද්ගලයෝ මේ තැන්වලට පත් කිරීම සඳහා දේශපාලන පක්ෂ පියවර ගන්නවා නම්, මෙම ප්‍රශ්නයෙන් 90% ක් අපට වළක්වා ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා දේශපාලන පක්ෂයක් හැටියට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විශ්වාස කරනවා, මේ වෙලාවේදී ලැබී තිබෙන කාලයත් එක්ක පුළුල් සංශෝධනයකට යා නොහැකියි. අපි කියනවා, මනාප ක්‍රමය පැහැදිලිවම වෙනස් කරන්නට ඕනෑ. මනාප ක්‍රමය වෙනස් කළ යුතුයි. කේවල ක්‍රමයකට යනවා නම් ඒක සාධාරණ සමානුපාතික මිශ්‍රණයක් හරහා යා යුතුයි. හැබැයි, කේවල ක්‍රමයක් සම්පූර්ණයෙන් පැහැදිලි අධ්‍යයනයකින් ක්‍රියාත්මක කරන්න නම්, යම් කාලයක් ගත වන නිසා ගැළපෙන සමානුපාතික ක්‍රමයක් යෝජනා කර, ඒ අනුව එවැනි සම්මිශ්‍රණයක් ගෙන එන තෙක් ගැළපෙන සමානුපාතික ක්‍රමයක් හරහා ඉදිරි ඡන්දය පැවැත්වීම සුදුසුයි කියලා දේශපාලන පක්ෂයක් හැටියට අපි විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.54]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාම ස්තුතිවන්ත වෙනවා. මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා කාලීන වශයෙන් ඉතාම වැදගත් වුණු යෝජනාවක් අද ඉදිරිපත් කරලා තිබෙනවා කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඡන්ද ක්‍රමය පිළිබඳව වෙනසක් ඇති වෙන්න ඕනෑය කියන කාරණාව අපේ සමාජය තුළ දීර්ඝ කාලයක් සාකච්ඡාවට බඳුන් වුණු කාරණාවක් කියන එකයි අපට දකින්න

තිබෙන්නේ. මේ පිළිබඳව පසුගිය රජය කාලයේදී දිනේෂ් ගුණවර්ධන ගරු ඇමැතිතුමාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරලා, දීර්ඝ කාලයක් මේ පිළිබඳව සාකච්ඡා ඇති වුණා. සාකච්ඡාවලින් පස්සෙත් ඒ සාකච්ඡාවලට සම්බන්ධ වුණු සියලු පක්ෂවලට අවසාන වාර්තාවට එකඟතාවයකට එන්න පුළුවන්කමක් ඇති වුණේ නැහැ. මම දන්න තරමට එක්සත් ජාතික පක්ෂයවත් ඒ අවසාන වාර්තාවට අත්සන් තැබුවේ නැහැ. ඒ නිසා මේ ඡන්ද ක්‍රමය පිළිබඳව අපි කොයි ආකාරයට ක්‍රියා කරන්න ඕනෑද කියන කාරණාව තවත් දීර්ඝ කාලයකට මේක ඉදිරියට ගෙන යන්න වඩාත් සුදුසු වෙන්නේ නැහැයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. අද ඉතාම කෙටි කාලයක් තුළදී මේ පිළිබඳව පැහැදිලි තීන්දුවකට පැමිණීම අවශ්‍ය වෙලා තිබෙනවා. මීට කාලයකට පෙර සීමා නිර්ණය කිරීමේ වැනි කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගත වුණත්, අද නවීන තාක්ෂණය සහ නවීන පහසුකම් උපයෝගී කරගෙන මේ කටයුතු වඩාත් ඉක්මණින් කරන්න තිබෙන ඉඩකඩ වැඩියි. ඒක නිසා ඒ පහසුකම් පාවිච්චි කරලා මේ කාර්යය වඩාත් ඉක්මණින් අවසන් කරන්න යොමු වෙන්න ඕනෑය කියන කාරණාවයි අපි විශේෂයෙන්ම සඳහන් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය පැවතුණු මනාප ක්‍රමය තුළ මේ රටේ පාර්ලිමේන්තුව වගකීමක් නැති ආයතනයක් බවට පත් වන තත්ත්වයකට පත් වෙලා තිබුණා. වංචාකාරයින්, දූෂකයින්, කුඩුකාරයින් වැනි විවිධ අපරාධකාරයින්ට පාර්ලිමේන්තුව මුදලේ බලය පාවිච්චි කරලා පත් වෙන්න පුළුවන් තැනක් බවට පත් වෙලා තිබුණා. කේවල ඡන්ද ක්‍රමය තුළ, කොට්ඨාශ ක්‍රමය තුළත් මේ ආකාරයට මුදල් පාවිච්චි කරලා බලයට එන්න පුළුවන්ය කියලා විශ්වාස කළත්, මුල් කාලය තුළදී එවැනි දේකට උත්සාහ කළත් ඒක දීර්ඝ කාලීනව ඒ විධියටම පවතින්න ඉඩකඩක් ඇති වෙන්නේ නැහැ. මේ පවතින ක්‍රමයට පුරුදු වුණු මහජන නියෝජිතයෝ විතරක් නොවෙයි. ජනතාවත් ඇත් කර ගන්න අවශ්‍ය වෙනවා. අද ජනතාවත් පුරුදු වෙලා තිබෙන්නේ, යමක් ලැබුණොත් ඒ දේ වෙනුවෙන් තමන්ගේ ඡන්දය පාවිච්චි කරනවා කියන තැනට පත් වෙලා තිබීමයි. ඒ නිසා මේ පුරුද්දෙන්, මේ සිරිතෙන් ජනතාවත් ඇත් කර ගනිමින් කටයුතු කරන කොට ටික කාලයක් තුළදී මේක යථා තත්ත්වයකට පත් කරන්න පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා. එක එක පක්ෂවලට කොපමණ සල්ලි තිබෙනවාද? ඒ අය හම්බ කරගත්තු සල්ලි කොපමණ තිබෙනවාද? ඒවා කොපමණ දුරට වියදම් කරන්න පුළුවන්ද? කියන කාරණය උඩ පමණක් ඒවා විතරක් සැලකිල්ලට අරගනිමින් අපේ රටේ නීතිරීති, ව්‍යවස්ථා වෙනස් කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒක වඩාත් රටට ගැළපෙන විධියට, වඩාත් යෝග්‍ය වන විධියට, වඩාත් ප්‍රජාතන්ත්‍ර වාදය තහවුරු වන විධියට සිද්ධ විය යුතුයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. පසුගිය කාලයේ මේ මනාප ඡන්ද ක්‍රමය තුළ මේ රටේ බුද්ධිමතුන්, උගතුන් දේශපාලනයෙන් ඈත් වුණා. මම විශ්වාස කරනවා, නැවත වතාවක් ඒ තත්ත්වය වෙනස් කරලා එවැනි උගතුන්ට, බුද්ධිමතුන්ට නැවත පාර්ලිමේන්තුවේ ඉඩකඩ සැලසෙන ක්‍රමයක් මේ මනාප ඡන්ද ක්‍රමය අවසන් කිරීම තුළ ආරම්භ කරන්න ඉඩක් ඇති වේවිය කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම මේ ඡන්ද ක්‍රමය වෙනස් වෙනවා වාගේම වෙනස් විය යුතු තවත් කාරණා රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම මූලික වශයෙන්ම පක්ෂ වෙනස් වෙන්න ඕනෑ. පක්ෂ ක්‍රියා කරන අන්දම පිළිබඳව. තම තමන්ගේ පක්ෂ, තමන්ගේ අපේක්ෂකයින් තෝරා ගැනීමේදී ඒ පක්ෂ ස්වාධීනව සහ නිදහස්ව කල්පනා කරලා වඩාත් හොඳ පුද්ගලයින්ව තමන්ගේ අපේක්ෂකයින් හැටියට තෝරා පත් කර ගැනීමේ වගකීම පක්ෂ භාර ගන්නවා නම් මම හිතනවා, මේ අර්බුදයෙන් අපට ගොඩ එන්න ඉඩකඩ ලැබේවිය කියලා. ඒ නිසා ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා නායකයින්ට වඩාත් ප්‍රශස්ති කියන අයට මේ තුළ ඉඩක් ඇති වෙන්න පුළුවන්ය කියලා. නමුත් නායකයින්ට ප්‍රශස්ති කියන අය නොවෙයි, ඊට වඩා බුද්ධිමත් විධියට කල්පනා කරලා, රටට අවශ්‍ය කවුද කියලා කල්පනා කරලා පක්ෂ තමන්ගේ අපේක්ෂකයින් තෝර ගන්නවා නම්, ඒ සඳහා තිබෙන ඉඩකඩ වඩාත් වැඩි වේවිය කියලා අපි විශ්වාස කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් වෙලා තිබෙන තැන්වල බටහිර රටක වේවා, ඉන්දියාව වැනි රටක වේවා, අතිවිශාල රටක් වුණු ඉන්දියාව වැනි රටකත් මේ කේවල ඡන්ද ක්‍රමය තුළම වඩාත් හොඳ පාර්ලිමේන්තු සම්ප්‍රදායක් පවත්වාගෙන යමින්, වඩාත් හොඳ ප්‍රජාතන්ත්‍රවාදයකට තිබෙන ඉඩකඩ ඇතිව කටයුතු කරනවාය කියන එක අපට ආදර්ශයකට ගන්න පුළුවන් වේවිය කියන එක අපි විශ්වාස කරනවා. ඒ නිසා අපි මේ ඡන්ද ක්‍රමය තුළ සෑම දෙනාටම සමාන තත්ත්වයක් ඇති වන විධියට කටයුතු කරන්න, මේ ඡන්ද ක්‍රමය වෙනසකට ඇති කරන්න මේ අවස්ථාව උදා වෙලා තිබෙනවා කියන එකයි අපි විශ්වාස කරන්නේ.

[ගරු කීර්ති කාරියවසම් ]

විශේෂයෙන්ම දින 100 ක් තුළ වැඩ පිළිවෙළකුත් එක්ක බලයට පැමිණි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ දින 100 වැඩ සටහන තුළ සඳහන් කරලා තිබෙනවා, විධායක ජනාධිපති ක්‍රමය අත්හරින්න කටයුතු කරනවා කියලා. අද විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කරන්න සිද්ධ වෙලා නැතත්, යම් යම් වෙනස්කම්වලට ඒක භාජනය කරන්න, වඩාත් ප්‍රජාතන්ත්‍රීකරණය කරන්න කටයුතු කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා. විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි වන විධියට නීති සකස් වෙන්න ඕනෑ කියන තැන අපි පැහැදිලිව ඉන්නවා කියන කාරණාව සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න යෝජනා ඉදිරිපත් කරනවා කියලා සඳහන් කරලා තිබෙනවා. දින 100 ක් අවසානයේදී මේ අලුත් මැතිවරණ ක්‍රමයක්ම පදනම් කර ගෙන ඡන්දය තියනවා නොවෙයි. නමුත් වඩාත් වැදගත් වෙන්නේ ඒ දින 100 තුළ ඉෂ්ට කරන්න පොරොන්දු වුණු කාරණාවලට වඩාත් මුල් තැන දීලා කටයුතු කිරීමයි. විශේෂයෙන්ම මේ අවස්ථාව අපට හොඳ අවස්ථාවක්. පක්ෂ විපක්ෂ දෙගොල්ලෝම එකට එකතු වෙලා අද පොදුවේ කල්පනා කරලා තීන්දු ගන්න පුළුවන් අවස්ථාවක්. ඒ සඳහා 2/3 බලය පාර්ලිමේන්තුව තුළ තිබෙනවා. මෙවැනි අවස්ථාවන් නැවත ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මේ තිබෙන අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින්, පාවිච්චියට ගනිමින් කටයුතු කරන්න පක්ෂ විපක්ෂ දෙගොල්ලෝම එකට එකතු වෙලා කටයුතු කරමුය කියමින් මේ ඡන්ද ක්‍රමය වෙනස් කිරීමේ කටයුත්තට වඩාත් මුල් තැනක් දෙන්නය කියන ඉල්ලීම කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 02.02]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ගෙන එන මේ යෝජනාවේ පළමුවැනි කොටසේ තිබෙන්නේ, මේ මනාප ක්‍රමය ඇතුළේ පත් වෙලා තිබෙන අර්බුදකාරී තත්ත්වය. දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි මේ මනාප ක්‍රමය අපේ අර්බුදයක් බවට අපි පත් කරගෙන නැහැ. ඒ නිසා ඇත්තටම පක්ෂයක් හැටියට කල්පනා කරලා බැලුවාම මේ කොටස අපට අදාළම නැති දෙයක්. ඒ වාගේම තමයි සමානුපාතික ඡන්ද ක්‍රමයක් හෝ මොනවා හරි ඡන්ද ක්‍රමයක් අපට කිසි ගැටළුවක් නැහැ. මේ සංශෝධනය වන ඕනෑම ඡන්ද ක්‍රමයකට අපි ලැහැස්තියි. මේ පිච් එක හදන්නේ අපි නොවෙයි. හැබැයි මේ පිච් එකේ ඕනෑ විධියකට bat කරන්න අපි සූදානම්. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා 1978 ව්‍යවස්ථාව තුළ - මේ සමානුපාතික ක්‍රමය හැදුවේ අපි ගැන හිතලා නොවෙයි. හැබැයි 1982 වන කොට ජේ.ආර්. ජයවර්ධන මහත්මයා තේරුම් ගත්තා මේ ක්‍රමය ඇතුළේ ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුවට එනවා කියලා. මේ කියන්නේ මගේ වචනවලින් නොවෙයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විශ්‍රාම ගිහිල්ලා විශ්‍රාම සුවයෙන් ඉන්න මොහොතක මට මතක හැටියට ඉරිදා ලංකාදීප පත්තරේක මාධ්‍යවේදියෙක් ඔහු සමග සම්මුඛ සාකච්ඡාවක් තිබ්බා. ඒ සම්මුඛ සාකච්ඡාවේදී ඔහුගෙන් අහනවා, ඔබ ඇයි? ජනතා විමුක්ති පෙරමුණ තහනම් කළේ කියලා. ඒ වෙලාවේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා බොහොම අවංකවම ඒවාට උත්තර දෙන මොහොතක ඉන්නේ. මම ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ තහනම් කළේ නැත්නම් නැක්සලයිට් කාරයෝ පාර්ලමේන්තුවට එනවයි කියලා කිව්වා. අපි දන්නේ නැහැ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මොන අදහසකින් අපව නැක්සලයිට් කාරයෝ කියලා හැඳින්නුවාද කියලා. ඒ සම්මුඛ සාකච්ඡාවේ දිගුවක් හැටියට ඔහු තවදුරටත් කියනවා මම නියෝජනය කළේ මගේ පන්තිය. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා හරි අවංකව කථා කරනවා. රෝහණ විජේවීර නියෝජනය කළේ එයාගේ පන්තිය. මගේ පන්තියේ ආරක්ෂාව වෙනුවෙන් මට රොහාන් විජේවීර - රොහාන් විජේවීර කියලා තමයි කියන්නේ. රෙහාන් විජේවීරව තහනම් කරන්න සිද්ධ වුණා. ඉතින් ඒකේ පැහැදිලියි. ඒ හදපු ව්‍යවස්ථා ඇතුළේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයලා බලාපොරොත්තු වුණේ නැහැ, මේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය ඇතුළේ, ඔය සමානුපාතික ක්‍රමය ඇතුළේ එය හදන වෙලාවේ මෙහෙම තත්ත්වයක් ඇති වෙයි කියලා.

ඒ වාගේම තමයි මේ මනාප ක්‍රමය ආවේත් ජේ.ආර්. ජයවර්ධන මහත්මයා හදපු ව්‍යවස්ථාවේ - 1978 මුල් ව්‍යවස්ථාවේ මනාප ක්‍රමයක් තිබුණේ නැහැ. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මේක යම් ප්‍රමාණයකින් කිව්වා. ඒකේ තිබුණේ කොළඹ දිස්ත්‍රික්කයේ නම් අපි කොළඹ දිස්ත්‍රික්කයේ 22 ක් දාන්න ඕනෑ. එක පක්ෂයකින්.

එතකොට අපි හිතමු ඒ පක්ෂයෙන් තේරෙන්නේ 10 යි. ලිස්ට් එකේ අංක 01 ඉඳලා 10 දෙනාට පුළුවන් පාර්ලිමේන්තුවට යන්න. එතකොට මේකේ 11 ඉඳලා ඉන්න කට්ටිය දන්නවා අපට පාර්ලිමේන්තු යන්න වෙන්නේ නැහැ. අපි ලිස්ට් එකේ අග ඉන්නේ. ඒ නිසා ඒ අය ඡන්ද ව්‍යාපාරයට වැඩ කරන්නේ නැහැ. ඒ නිසා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කල්පනා කළා මේ 22 දෙනාම ඡන්දයට දාගන්නේ කොහොමද කියලා. ඒ නිසා තමයි ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මනාප ක්‍රමය ගෙන ආවේ. පොර කාලා ඡන්ද ටික එකතු කරහල්ලාය කියලා. මෙන්න මේ ක්‍රමයත් එක්ක තමයි මනාප ක්‍රමය එන්නේ.

ඒ නිසා එහෙම හදපු මනාප ක්‍රමය තමයි අද අර්බුදයට ගිහිල්ලා තිබෙන්නේ. අපි විශ්වාස කරන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමය තිබුණු කේවල ක්‍රමයට වඩා හොඳයි. මොකද, ඒකට හේතුව වෙන්නේ, මම උදාහරණයක් කිව්වොත් එහෙම මට මතකයි 1977 ට ඉස්සෙල්ලා කැස්බෑව ආසනයේ කේවල ක්‍රමය යටතේ තිබුණු අතුරු මැතිවරණය. ඒ දවස්වල අපි ඉස්කෝලේ යන ළමයින්. නමුත් මට අද වාගේ මතකයි ඒකේ ඡන්ද ප්‍රතිඵලය. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු ධර්මසේන ආටිගල මහත්මයා ඡන්ද 22,000 ක් ගත්තා. ස්වාධීනව තරග කරපු සෝමවීර චන්ද්‍රසිරි මහත්මයාගේ පුතා සුභාෂ් චන්ද්‍රසිරි මහත්මයා ගත්තා ඡන්ද 19,000 ක්. මට කැඩුණු කැලි මතක නැහැ. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරපු ඩික්සන් ජේ. පෙරේරා මහත්මයා ගත්තා ඡන්ද 14,000 ක්. එතකොට කැස්බෑව ආසනයේ ජනතාව නියෝජනය කරමින් කවුද පාර්ලිමේන්තු යන්නේ? කැස්බෑව ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට යනවා 22,000 ක් ගත්තු ධර්මසේන ආටිගල මහත්මයා. හැබැයි 33,000 ක්ම ධර්මසේන ආටිගල මහත්මයාට කැමැති නැහැ. ඒක හරිද? ඒක පාර්ලිමේන්තුවේ මහජන කැමැත්ත නියෝජනය වෙනවාද? නැහැ. ඒ නිසා ඒ අතින් බැලුවාම සමානුපාතික ඡන්ද ක්‍රමය කියලා කියන්නේ, තිබුණු කේවල ක්‍රමයටත් වඩා ඉදිරිගාමී පියවරක්. ඒ නිසා තමයි අපි කියන්නේ මනාප ක්‍රමය නොවෙයි, මේ ඡන්ද ක්‍රමය නොවෙයි මොන දේ වුණත් සංශෝධනය වෙන්න ඕනෑ ඉස්සරහාට යන විධියට මිසක් ආපස්සට යන්න නොවෙයි. ඒකයි අපට තිබෙන්නේ. ඒ නිසා මොන ක්‍රමය ආවත් ඕනෑම ක්‍රමයකට අපි නම් ඔට්ටුයි. හැබැයි, ඒවා සංශෝධනය වෙන්න ඕනෑ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් හොඳින් පිළිබිඹු වන ආකාරයට. ඒ කියන්නේ කුමන හරි පක්ෂයකට ඡන්දදායකයෝ දෙනවා ඡන්දවලින් 50% ක්. 50% ක් ලැබුණු පක්ෂයේ පාර්ලිමේන්තුවේ පිළිබිඹු වෙනවා නම් 80% ක් ඒක වැරැදියි. 50% ක් ඡන්දය දුන්නාට පසේස් 45% ත් 55% ත් අතර නම් ඒකේ කිසි ගැටළුවක් නැහැ. 10% ක් නම් එක පක්ෂයකට ඡන්දය දෙන්නේ ඒක 5% ක් 15% ක් පාර්ලිමේන්තුවේ පිළිබිඹු වෙනවා නම් ඒකේ කිසි ගැටළුවක් නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ සමානුපාතික ක්‍රමය ඊට වඩා ඉදිරිගාමී පියවරක්. ඒ නිසා දැන් ඡන්ද ක්‍රමය වෙනස් වෙනවා නම් වෙනස් වෙන්න ඕනෑ ඒ සමානුපාතික ක්‍රමයටත් වඩා සාධාරණ වූ පිළිබිඹුවක් පාර්ලිමේන්තුවේ ඇති වෙනවා නම්. ඒක තමයි අපි ඉදිරිපත් කරන කාරණය. අනෙක් එක තමයි දැන් කේවල ක්‍රමය යටතේ ආසන ක්‍රමය තමයි හොඳ. දැන් එහෙම තර්කයක් එනවා.

ඒ නිසා දැන් දිස්ත්‍රික්කයකට ඇතුළත් වුණාම අපේක්ෂකයින් දිස්ත්‍රික්කයටම වියදම් කරනවා. එක්කෙනෙක් දානවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිස්ත්‍රික්කයකට ලිස්ට් එකක් දැම්මාට පස්සේ ඕනෑම කෙනෙකුට අවස්ථාවක් එනවා අපේක්ෂකයෝ 22 ක් නම් 22 න් එකක් තෝරන්න. 22 ක් ගැන හිතලාම එක්කෙනෙක් තෝරන්න පුළුවන්. හැබැයි ආසන ක්‍රමයට හම්බ වෙන්නේ කවුරු හරි පක්ෂයකින් දෙන එක්කෙනයි. ඒකෙන් එකක් තෝරන්න තිබෙන්නේ. වෙන විකල්ප නැහැ. හම්බ වන කෙනාව තමයි තෝරන්න තිබෙන්නේ. එතකොට අනෙක් එක තමයි කොළඹ දිස්ත්‍රික්කයේ ආසන 15 ක් තිබෙනවා නම්, ඒ පක්ෂයට පුළුවන් මේ කොළඹ දිස්ත්‍රික්කය දිනන්න, මේ ආසන 15 ට මුදලාලිවරු 15 ක් දාන්න. එහෙම දාලා ඒ ආසනයට තිබෙන සල්ලි ටික ඔක්කෝම වියදම් කරනවා. මුළු ආසනයේම බඩු බෙදනවා. සමහර විට මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා හිතනවා ඇති හෝමාගම මට දිනන්න පුළුවන් කියලා. ඔව් අද තිබෙන තත්ත්වය අනුව, ඒ කේවල ක්‍රමය අනුව එහෙම හිතන්න පුළුවන්. හැබැයි, අර හෝමාගමට ඕක වෙන්නේ නැහැ. අර ක්‍රමයට ආවොත් හෝමාගමට හොඳ මුදලාලි කෙනෙක් දානවා මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා යට කර ගෙන යන්න. එතකොට ඇත්ත ප්‍රජාතන්ත්‍රවාදය එතැන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක පාර්ලිමේන්තුවේ පිළිබිඹු වෙන්නේ නැහැ. මම හිතන්නේ, එතකොට ඒකට කියන්න පුළුවන්. තර්කයක් කරන්න පුළුවන්. නැහැ, ඒක සම්බන්ධයෙන් වියදම් කරන සීමාවක් හදනවා. අපි කියන්නේ දැනුත්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

ඒ සීමාව තිබෙනවා. දැනුත් දන්සල් දෙන්න බැහැ. දැනුත් කන්න දෙන්න බැහැ. දැනුත් බඩු බෙදන්න බැහැ. දැනුත් ඒක තියෙනවා. අමුතුවෙන් මේකට නීතියක් අලුතෙන් ඇතුළත් කරන්න දෙයක් නැහැ. දැනුත් ඒ නීතිය තිබෙනවා. හැබැයි, ඒ නීතිය ක්‍රියාත්මක වෙනවාද? ඒ නීතියෙන් කොහොමද අල්ලන්නේ? කොහොමද බඩු දෙන එක නතර කරන්නේ? ඒ නිසා ඒවා බොරු කතන්දර. ඒක නිසයි අපි කියන්නේ, ඒ තත්ත්වය අනුව මේ සමානුපාතික ක්‍රමය වෙනස් වෙලා මැතිවරණ ක්‍රමය එනවා නම් අපි විශ්වාස කරන්නේ අර විධියට වෙනස් වෙන්න ඕනෑය කියලා.

ඒක නිසා අපි මේ මොහොතේ විශ්වාස කරන්නේ මේ ඡන්දය ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. අනන් මනන් කථා කරන්නේ ඇත්ත උවමනාව නොවෙයි. ඇත්තම කියනවා නම්, මේකට කෑගහන, සමහර විට මට පාඩු වුණත් කමක් නැහැ මේක වෙනස් වෙන්න ඕනෑ කියලා බොරුවට ඔය කියන්නේ. ඔය යෝජනා ගෙන එන මිනිස්සුම දන්නවා මේක මට පාඩුයි. හැබැයි, ඒගොල්ලෝ කියන්නේ ඔන්න අපි මෙහෙම වෙනස් කරන්න හැදුවා. මම මං ගැන නොසිතා මේක කරන්න හැදුවා. හැබැයි, කර ගන්න බැරි වුණා. ඒ නිසා මේවා සිද්ධ වන දේවල් නොවෙයි. ඒ නිසා පළාත් පාලන මැතිවරණය පවත්වන්න දැන් ඒ ක්‍රමය වෙනස් කරලා දැන් පාර්ලිමේන්තුවේ පනත සම්මත කරලා සෑහෙන කාලයක්. හැබැයි, තවමත් ඒකට සූදානම් නැහැ, ඒ ක්‍රමයට මැතිවරණය පවත්වන්න. ඒ නිසා තවමත් ගණන් හද හදා බලනවා මේක අපට කොහොමද වාසි වෙන්නේ කියලා. ඒ නිසා අපි දන්නවා. එක්සත් ජාතික පක්ෂය මේ මොහොත වන කොට මම දන්නේ නැහැ මංජු ශ්‍රී අරංගල මැතිතුමා මොන එකකින් මේ යෝජනාව ගේනවාද කියලා. අපි දන්න එක්සත් ජාතික පක්ෂය මේ යෝජනාවට කැමැති නැහැ. මේවා මෙහෙම වෙනස් වෙන්න කැමැති නැහැ. උදාහරණයක් ගත්තොත් එහෙම ඇත්තටම මේවා වෙන දේවල් නොවෙයි. මේවා මේ දින 100 තුළ සමාජයට හප හපා ඉන්න හදන මාතෘකා. ඒකයි මේ ඇත්ත කතන්දරය. ජෝන් අමරතුංග ඇමතිතුමාට පාර්ලිමේන්තුවේ විශ්වාසභංගයක් ගෙනාවේ. පුළුවන් නම් ඒ විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ගන්න කියලා මම අභියෝග කරනවා. විශ්වාසභංගය ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දින 100 න් පස්සේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. මේ විශ්වාසභංගය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය භාර දෙන්නේ නැහැ. නිමල් සිරිපාල මහත්මයලා චමල් රාජපක්ෂ මහත්තයා කථා නායක තනතුරේ හිටියේ නැත්නම් දෙන්නේ නැහැ. දෙන කොටම දන්නවා මේක ගන්නේ නැහැයි කියලා. දෙන කොටම දන්නවා මේක දින නියමයක් නොමැති න්‍යාය පුස්තකයට තමයි මේක යන්නේ කියලා. ඉතින් ඒ නිසා ඇත්තටම මේ රටේ ජනතාවට පෙන්වන මැජික් බවට මේවා පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි පක්ෂයක් හැටියට, අපේ තිබෙන මතය තමයි මේක ඇතුළේ, විශේෂයෙන් ජගත් අංගගේ හිටපු අමාත්‍යතුමා ප්‍රකාශ කළා, කෝ? දූෂිතයන්ට මොකද කළේ? මොනවාද කරලා තිබෙන්නේ? කියන කාරණය. ඉතින් ඒක අමුතු එකක් නොවෙයි. මේක තමයි රටේ වෙලා තිබෙන්නේ.

මට මතකයි, ගාමිණී ෆොන්සේකා මහත්මයා හැදුවා චිත්‍රපටයක්. සාගරයක් මැද කියලා. 1977 වන තෙක් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්තයලා මේ රටට කරපු විනාශය තමයි සාගරයක් මැද චිත්‍රපටයේ තිබෙන්නේ. ඒ චිත්‍රපටය බැලුවාට පස්සේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්තයාව මරාගෙන කන්න හිතට වේදනාවක් එනවා. තරහක් එනවා. ඒ කාලයේ මම හිතන්නේ හිතන්න ඇති, ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්තයලා පෝරකයට යවයි කියලා. එහෙම වුණේ නැහැ. කිසි දෙයක් වුණේ නැහැ. ඊට පස්සේ ගාමිණී ෆොන්සේකා මහත්තයාම හැදුවා, ඊළඟ චිත්‍රපටය කොටි වලිගය කියලා. අනික් කට්ටියගේ හැටි. එතකොටත් මම හිතන්නේ හිතාගෙන ඉන්න ඇති - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නම් ප්‍රජා අයිතිය අහෝසි කළා. ඒක ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ අවශ්‍යතාවය. ඒකාධිපති ගමන යන්න. හැබැයි, කිසි දෙයක් වුණේ නැහැ. මේක තමයි ඇත්ත. ඉතින් ඒ නිසා ඒක ජනතාව බලාගත යුතු කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. මේ දේවල් සම්බන්ධව. මම හිතනවා, අලුත් දැන් ඉන්න පරම්පරාව විශේෂයෙන්ම අන්තර්ජාලයත් එක්ක කටයුතු කරන අලුත් පරම්පරාව නම් ඔය තියෙන මැජික්වලට අහු වෙන එකක් නැහැ. ඒ අය උපතින් තමන්ගේ අම්මා තාත්තා මොන පක්ෂයේද කියලා තීන්දු තීරණ ගන්නා වූ පරම්පරාවක් නොවෙයි. ඉතින් ඒක හොඳයි. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ දේවල් ඇත්ත රටේ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් වෙනස් කර ගැනීමේ අයිතිය තිබෙන්නේ

අනාගතයේ ඡන්ද දායකයාටමය කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 02.14]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ මනාප දේශපාලන ක්‍රමය ගැන කැමැත්ත, අකමැත්ත දෙකම තිබෙන පුද්ගලයෙක් වශයෙන් තමයි මම මේ කථා කරන්නේ. විශේෂයෙන් මේ අපේ ව්‍යවස්ථා සංශෝධනය ගේන කොට මට තිබෙන අපැහැදිලිකම තමයි මේ අපි හැම කෙනාම කථා කළාට, පාර්ලිමේන්තුවේ ක්‍රමය ගැන කථා කළාට, පළාත් සභාවට මොකද වෙන්නේ කියලා කවුරුවත් අදහසක් නොදැක්වීම. ඒ ගැන අපට අවබෝධයක් ලැබිලත් නැහැ. මේ පළාත් සභා ක්‍රමය කොහොමද යන්නේ? ප්‍රාදේශීය දේශපාලන ක්‍රමය මේ විධියට වෙනස් වෙන්න ඕනෑය. ඒකට කොට්ඨාශ ක්‍රමය ඇවිල්ලා ගම්සභා ක්‍රමයක් හදන්න ඕනෑය කියලා කිව්වාට, පළාත් සභාව නියෝජනය කරන අපි අනාගතයේ මොන ක්‍රමයකටද මුහුණ දෙන්නේ කියන එක තවම මෙතැන කථා වුණෙත් නැහැ. ඒකට අදහස් ප්‍රකාශ වුණෙත් නැහැ. නමුත් මම පුද්ගලයෙක් විධියට කැමැතියි, පාර්ලිමේන්තුවට වගකියන මන්ත්‍රීවරයෙක්, කොට්ඨාශයට වගකියන මන්ත්‍රීවරයෙක් ආසනයට පත් කරනවා නම්, ඔහුට ඒ ආසනයේ නායකත්වය ලබා දෙයි. ඊට පල්ලෙහායින් තිබෙන ප්‍රාදේශීය සහ පළාත් සභාවලට මේ මනාප ක්‍රමය තිබුණාය කියලා වරදක් මම දකින්නේ නැත්තේ, එහෙම තිබුණා නම්, ලේන්සුව කරෙන් අරගෙන හාමුදුරුවනේ කියලා කාණුවට බහින යුගයක් අපි හමාර කරලා ඇවිල්ලා තිබෙන්නේ. අපි දන්නවා දේශපාලන ක්ෂේත්‍රය තුළ මේ මනාප දේශපාලන ක්‍රමය එන්නට පෙර අපි වාගේ පොඩි මිනිස්සුන්ට දේශපාලනයේ තැනක් තිබුණේ නැහැ. පුංචි පවුලකින් පැවත එන පුද්ගලයකු වශයෙන් මම දෙපාරක් ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය දරලා, අද පළාත් සභාව නියෝජනය කරනවා. එතකොට මුදල් තිබෙනවාය, මැරයෝ ඉන්නවාය, චණ්ඩි ඉන්නවාය කියලා කවුරු කිව්වත් මම හිතන්නේ, ඒවා අපට වැදගත් වුණේ නැහැ. ඔය දේශපාලන ක්ෂේත්‍රය තුළම අපි ඉල්ලන මැතිවරණවලත් මැරයෝ හිටියා. මුදල් විශාල වශයෙන් වියදම් කරන පුද්ගලයෝ හිටියා. හැබැයි, ඒ සියල්ල අභිබවා මෝටර් සයිකලයෙන් ගිහිල්ලා, ප්‍රාදේශීය සභා මැතිවරණයේදී විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා ගෙන අපට ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණේ මා තෝරා ගත්ත දේශපාලනය මම හිතුවේ, අපි අවංක වෙන්නට ඕනෑ කියන එකයි. මහජනතාවට අවංක සේවයක් ලබා දෙන්නට ඕනෑ. අපි ඔවුන්ට ගෞරවය ලබා දෙන්නට ඕනෑ. තමන්ගේ ප්‍රදේශයේ මහජන නියෝජිතයා වශයෙන් අපි මහජනතාවට ගෞරවය ලබා දෙනවා නම්, ඔවුන්ට විනෝදය, ඔවුන්ට සතුට ලබා දෙන්න පුළුවන් නම්, අවශ්‍යතාවයන් පිරිමහන්න පුළුවන් නම් කවදාවත් ජනතාව නොමග යන්නේ නැහැ. අපි අවංක මහජන නියෝජිතයෝ වශයෙන් පෙනී සිටියොත් ඔය චණ්ඩින්ටවත්, මැරයින්ටවත්, සල්ලිකාරයින්ටවත් ජනතාව බිලී බා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි නිවැරදිව කටයුතු කළොත්, ඒ අනුව මේ මැතිවරණවල මොන ක්‍රම තිබුණත් ජනතාව නිවැරදි තීන්දු ගනීවි කියන විශ්වාසය තිබෙනවා.

හැබැයි, මේ මනාප දේශපාලන ක්‍රමය තුළ අපි හොඳටම දන්නවා, මෙතැන ඉන්න ඕනෑම කෙනෙක් ආච්චි අම්මා කෙනෙක් දැක්කාම ආච්චි අම්මේ කොහොමද කියලා අහනවා. ඒ වාගේම හොඳ පිරිමි කෙනෙක් හම්බ වුණොත් මහත්තයා කියලා කථා කරනවා. දරුවෙක් හමුවුණත් ඔලුව අත ගාලා යනවා. ඔහුට අනාගතයේ ඡන්දය තිබෙන නිසා. මනාප දේශපාලන ක්‍රමය තුළ ජනතාවට අතිශය ගෞරවයක් ලැබුණා. අහිංසක දුප්පත් මිනිහාටත්, ජන සමාජයේ ඉන්න හිඟන්නාගේ ඉඳලා මහා මන්දිරයේ ඉන්න පුද්ගලයා දක්වා ගෞරවය ලැබුණේ මෙන්න මේ මනාප දේශපාලන ක්‍රමය නිසා. හැම කෙනාම හිතුවා, මේ මනාපයට, පුද්ගලයාගේ විශේෂත්වය වැදගත් වෙන්නේ නැහැයි කියලා. අපේ ජයග්‍රහණයට පුද්ගලයාගේ කතිරය වැදගත් වෙනවා. ඒ නිසා ජන සමාජයේ සාමාන්‍ය පුද්ගලයන් දේශපාලඥයාගේ අතිශය ගෞරවයට පාත්‍ර වෙනවා මෙන්න මේ මනාප දේශපාලන ක්‍රමය තුළ. ඒ නිසා මේ ගෞරවය ලබා ගැනීම නිසා ජනතාව තමන්ගේ දේශපාලන කාලයේ තමන්ට වඩා ළං වන පුද්ගලයා කවුද කියලා බැලුවා. ඒ නිසා මම හිතනවා, මේ මනාප දේශපාලනය නොතිබුණොත් - පොඩි තැනින් එන මිනිහාට එන්න ඉඩක් තිබුණේ නැහැ කොයි වෙලේකවත්. එහෙම නම් මේ දේශපාලන ක්‍රමය තුළ අපි දන්නවා, දැන් අපව කෙනෙක් හම්බ වෙන්න ආවාම අපි නිදියාගෙන හිටියත් අපට ගෙදරින් කථා කරපු සැනින් අපි එනවා. මොකද, පුද්ගලයා ආපහු යන්න පුළුවන්. හැබැයි, අපි දන්නවා මේ කොට්ඨාශ දේශපාලන ක්‍රමය තුළ ඒ කාලයේ ඒ කෙනෙක් හම්බ වෙන්න තිබෙන අපහසුකම කොයි

වගේද කියලා. ඔහුට හාමුදුරුවනේ කියලා කථා කරන්නට ඕනෑ. අනිවාර්යයෙන් ගරු කරන්නට ඕනෑ. ඔහුට පුළුවන් වෙලාවට විතරයි හම්බ වෙන්න පුළුවන්. එහෙම දේශපාලන සංස්කෘතියක් වෙනස් වුණේ, මෙන්න මේ මනාප දේශපාලන ක්‍රමය තුළින්. හැමතිස්සේම මන්ත්‍රීවරයා දන්නවා තමන්ට අභියෝගයක් තිබෙනවා. තමන් හරියට හැසිරෙන්නට ඕනෑ. ක්‍රියා කරන්නට ඕනෑ. තමන්ගේ ක්‍රියාකලාපය හරියට නොකළොත් අපි දන්නවා කවුරු හරි වැඩක් දුන්නොත් අද අපි අරගෙන ඇවිල්ලා, ඒ වැඩේ කරලා ටෙලිෆෝන් කරලා කියන්නේ, ඔයාගේ වැඩේ කරලා තිබෙන්නේ. අරන් යන්න එන්න කියලා. අපි බලන්නේ මහජනතාව වඩා ප්‍රශංසනීය තත්ත්වයට ගේන්නට.

ඒ නිසා අපි මේ මනාප දේශපාලන ක්‍රමය තුළ මේ මහජන සබඳතා හොඳින් ගොඩ නැඟිලා. නමුත් මේවායේ වැරදි පැති ඕනෑ තරම් තිබෙනවා, අද සභාව ගත්තොත් දැන් ප.ව. 2.00 ත් පසු වී තිබෙනවා. නමුත් මෙහෙම මාතෘකාවක් අර ගෙන තිබෙනවා රටේ දේශපාලන තත්ත්වය ගැන කථා කරන්න. එතකොට මේ ගහගෙන, මරාගෙන එහෙම නැත්නම් සල්ලි වියදම් කරලා ආපු මන්ත්‍රීවරු මේ සභාවේ ඉන්න ඕනෑ. සැබෑ මහජන නියෝජිතයෝ නම් මේ සභා ගැබ අවසන් වන තෙක් ඉන්නට ඕනෑ. කොයි වෙලාවක බැලුවත් සභාවේ නැහැ. ගියවර අපි සභාව කල් තිබ්බා. අපි රුපියල් දෙදාහක්, තුන් දාහක් මුදල් වියදම් කර ගෙන මේ සභාවට එන්නේ. අපි තෙල් වියදම් කර ගෙන ඇවිල්ලා ගිය සරේ අපි සභාව කල් තියලා පොඩි වෙලාවකින් ගියා. අද සභාව බලන කොට අපි මේ රැඳිලා ඉන්නේ, අපව මහජනතාව ඡන්දය දීලා පත් කරලා, පුංචි පවුල්වලින් අපව මෙතැනට ගෙනාවේ මහජනතාව වෙනුවෙන් හඬක් නඟයි කියලයි. තමන්ගේ බල ප්‍රදේශයේ, තමන්ට ගැළපෙන ප්‍රශ්නයක් ගැන කථා කරයි කියලා. අවසානයේ කථා කරන්න ආවාම අපට වෙලාවවත් නැහැ. අද ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා වෙලාව බෙදුවේ කොහොමද කියලා අපි දන්නේ නැහැ. අපෙන් ඇහුවෙත් නැහැ කොහොමද? මේකට කාලය ඕනෑ ද කියලා. මම සභාපතිතුමාට කියලා මේ වෙලාව ඉල්ලා ගත්තේ. එහෙම නම් මේ සැබෑ මහජන නියෝජිතයෝ පත් කිරීමේ වගකීම මහජනතාව තේරුම් ගන්නට ඕනෑ. තේරුම් අරගෙන ඒ අය වඩා සමීප, මහජන වගකීම් ඉටු කරන අය පත් කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි අද මේ මනාප දේශපාලන ක්‍රමය අද නැති කරන කොට කොට්ඨාශ ක්‍රමයට වග කියන මන්ත්‍රීවරයෙක් එන කොට සමහර විට බහු ජාතික, බහු ආගමික ප්‍රදේශයක කෙනෙකුට පත් වෙන්න තිබෙන අපහසුකමක් ඇති වෙන්න පුළුවන්. එතකොට වඩා ජනප්‍රිය පුද්ගලයෙක් වෙන්න පුළුවන්. ඔහු ජනතාවට සංවේදී පුද්ගලයෙක් වෙන්න පුළුවන්. දැන උගත් පුද්ගලයෙක් වෙන්න පුළුවන්. ඒ වාගේ පුද්ගලයෙක් ජන සමාජයේ පරාජයට පත් වුණොත් ඔහුට එන්න ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ඔහුගේ ජනප්‍රියතාවය, ඔහුගේ බුද්ධි මට්ටම, ඔහුගේ උගත්කම පාවිච්චි කරලා ඔහුට මේ නියෝජනයක් ලබා ගන්න තිබෙන ඉඩ ප්‍රස්ථාව මොනවාද කියලා අපි වඩා හොඳින් කල්පනා කරලා බලන්නට ඕනෑ. ඒ නිසා මම වැඩිදුරට කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපි හැම කෙනාගේම වගකීම තමයි වඩා හොඳ මහජන නියෝජිතයෝ පත් කරන මෙම කේවල ක්‍රමය වාගේම සමානුපාතික ක්‍රමයත් මිශ්‍ර කර ගත්ත ක්‍රමයකට අපි අනුගත වෙන්නට ඕනෑ කියන එක. ඒ වාගේම පළාත් පාලන ක්‍රමය වාගේ එකකදීත් පාර්ලිමේන්තුව වාගේ දෙයකදීත් ඒ ආකාරයෙන් කටයුතු කරන්නේ කොහොමද කියන එක අපි හොඳින් තේරුම් අර ගෙන කටයුතු කළොත් හොඳයි කියන විශ්වාසය තහවුරු කරනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම ගැහැණු දරුවන් තුන්දෙනෙකුගේ පියෙක්. මට පුංචි ගැටලුවක් තිබෙනවා, මේ යහපාලන කාලය තුළ මට ඊයේ දවසේ ප්‍රවෘත්ති බලන කොට මාධ්‍ය ප්‍රකාශකතුමා කිව්ව ප්‍රකාශය නිසා. තාත්තා කෙනෙක් වශයෙන් මට යම්කිසි හැඟීමක් ඇති වුණු නිසා මම මේ ප්‍රකාශය කරන්නේ. අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙක් පිරිමි ළමයෙක් එක්ක ගියාම අපි පොලිසියට එහෙම කථා කරනවා. පොලිසියට කථා කළාම ලොකු මහත්මයා කියනවා. මන්ත්‍රීතුමා, ඕක හරි අමාරුයි, ඕක ලොකු ගැටලුවක්, ඒ ළමයා ගියාම කියලා. අද එතකොට මේ රජයේ මාධ්‍ය ප්‍රකාශකවරයා ප්‍රසිද්ධියේම කියනවා, ගැහැණු දරුවෙක් අවුරුදු 16 ට වැඩි නම් ඇය පිරිමි ළමයෙක් එක්ක හෝ කෙනෙක් ළඟට ගියාට එතැනින් එහාට කිසිම රාජකාරියක් කරන්න අමාරුයි. එතකොට අපි දන්නවා, එහෙම නීතියක් රටේ තියෙන්න පුළුවන්. නමුත් මම හිතනවා, සදාචාර මට්ටමින් මේක ජනමතයේ ප්‍රසිද්ධ කළොත් සමාජය ඉතා වැරැදි තැනකට යන්න පුළුවන්. ඒක

අපි මොන තැන හිටියත්, ගැහැණු දරුවන් තුන්දෙනෙක් ඉන්න තාත්තා කෙනෙක් වශයෙන් මම- අපේ දරුවන් අවුරුදු 16 දී සමාජ අරගලයකට පත් වුණොත්, අපේ දරුවන් සමාජයේ යම්කිසි හිංසනයකට ලක් වුණොත් මෙතැනදී අපට කියන්න කෙනෙක් නැති වෙනවා. නීතිය හරස් වෙලා තිබෙනවා. අවුරුදු 16 දී මේ දරුවාට ඕනෑ කෙනෙක් එක්ක යන්න පුළුවන්. විවාහ කර දෙන්න අවුරුදු 18 දක්වා යන්නට ඕනෑ. නමුත් මම හිතනවා, මාධ්‍ය ප්‍රකාශක මීට වඩා වගකීමෙන් උත්තරයක් කිව්වා නම් මේ රටේ කාන්තාන්ට සහ දරුවන්ටත්, ආදරය කරමින් දරුවන් හදන දෙමව්පියන්ටත් හොඳ ප්‍රකාශයක් වෙයි කියන විශ්වාසය මට තිබුණා. ඒ නිසා මේවා ඉදිරියේදී එක්කෝ වෙනස් වන්නට ඕනෑ. එක්කෝ මේවා අපි යෝජනා කරලා යවන්නට ඕනෑ. මොකද, සමාජයේ දරුවන් අනාගතයේ මේ වාගේ ව්‍යසනයන්ට ලක් වෙන්න පුළුවන්. ඒ යහපාලන ආණ්ඩුවේ ප්‍රධාන ඇමැතිවරයෙක් සම්බන්ධ වුණු ගැටලුවක් නිසා තමයි මේ මාධ්‍ය ප්‍රකාශක ඒ සිද්ධිය මතු කළේ. ඒකත් මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගෞරවයත් පුද කරමින් නිහඬ වෙනවා.

[අ.භා. 02.24]

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම හිතන්නේ, මම අදහස් ප්‍රකාශ නොකළත් දීර්ඝ කාලයක් මැතිවරණ ක්‍රමය සංශෝධනය අපේක්ෂා කළ පිරිසක් තමයි අද සභාවේදී අදහස් ප්‍රකාශ කරන්නට බෙහෙවින් කැමැත්ත පළ කළේ. ඔවුන් බෙදා ගත්ත වේලාව ඊටත් වැඩිපුර භාවිතා කරමින් මම හිතන්නේ, දීර්ඝ වේලාවක් මේ සභාවේ බොහොම සාරගර්භ කරුණු රාශියක් මෙයට එකතු කළා, මංජු ශ්‍රී අරංගල අපේ ගරු විපක්ෂ නායකතුමාගේ මේ යහපත් යෝජනාව පිළිබඳව. මේ යෝජනාවට අපේ එකඟතාවය තිබෙනවා. මේ එතුමාගේ යෝජනාවට අපි පොඩි සංශෝධනයක් - සභාවට සංශෝධනයක් ගේනවා නොවෙයි. අපේ අදහස්වල සංශෝධනය තමයි තිබෙන්නේ. මොකද අපි සියලුදෙනාම පිළිගන්නවා, මේ මැතිවරණ ක්‍රමය සංශෝධනයකට යා යුතුයි කියලා. මම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට අහගෙන සිටියා. බොහොම දක්ෂ තරුණ මන්ත්‍රීවරයෙක්. හැබැයි, මේ ගෙවී ගිය ඉතිහාසය තුළ එතුමා ප්‍රායෝගික අත්දැකීම් කොපමණ දුරට ලැබුවාද නැද්ද කියන එක මට දැනුනා. මට ඒක දිගටම දැණුනා. මොකද හේතුව, මේකේ අම්හිරි, බොහොම දුක් ගැහැට, ජීවිතවලින් වන්දි ගෙවපු, බොහෝ අසාධාරණකම්වලට මුහුණ දීපු මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය විය යුතුයි කියලාම අපි පිළිගත යුතුමයි. ඒ නිසාවෙන් අවුරුදු 10 ක් වෙනවා, දිනේෂ් ගුණවර්ධන මැතිවරණ සංශෝධිත වැඩ පිළිවෙළට. නේද අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා? එතුමාගේ කණ්ඩායමේ. ඒ නිසාවෙන් මෙය දරාගන්න බැරිව, ඉවසන්න බැරිව ප්‍රාදේශීය සභාවල්වල, නගර සභාවල්වල, පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ පවා මේක නිරන්තරයෙන් කථා කරලා තිබෙනවා. මම හිතන්නේ, අපිම සභාවේ මෙය ගෙනැල්ලා තිබෙනවා. මේ වාගේ බරපතළ විධියට නොවුණත්. මේ පූර්ව විධායක බලැති ජනාධිපති ක්‍රමය හරහා ගොඩ නැඟුණු සමානුපාතික මැතිවරණ ක්‍රමය නිසාවෙන් නිවැරැදි සාධාරණ නියෝජනයක් වෙන්නේ නැහැයි කියලා. ඒ නිසාවෙන් අද මේකට කාලය ඇවිල්ලා. මේ අදහස් ප්‍රකාශ කරපු ඒවාට අපි හොඳින් අහගෙන සිටියා. අපි අවුරුදු 20 ක් තිස්සේ විතර ඕක අහගෙන ඉන්නවා. අවුරුදු 10 ක් විතර මේ කාරණාවට බෙහෙවින් ලෙංගතුව ඇහුම්කන් දීලා තිබෙනවා. දිනේෂ් ගුණවර්ධන ගරු ඇමැතිතුමා එක්කත් අපි සාකච්ඡාවලට සහභාගි වෙලා තිබෙනවා. මේ සඳහා අදහස් එකතු කළ විශ්ව විද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරුන්ගේ නම් කිහිපයක් අපි දන්නවා. විවිධ දේශපාලන නායකකාරකාදීන්ගේ අදහස් එකතු කළයි කියලා හොඳින් දන්නවා.

ඒ වාගේම දේශපාලනය කෙරෙහි උනන්දුවක්, ඕනෑකමක් දක්වන මේ සමාජ පරිසරය තුළ ඉන්න දේශපාලනය කෙරෙහි කැපවීමක් තිබෙන, උනන්දුවක් තිබෙන විද්වතුන්ගේ අදහස් මේ කාරණාව සඳහා දිගින් දිගටම එකතු වුණයි කියන කාරණාවත් දන්නවා. ඒ සමස්ත අදහස්වල එකතුවීමක් හැටියට තමයි සමානුපාතික හා කේවල මිශ්‍ර මැතිවරණ ක්‍රමය මේ ගෙනාවේ. ප්‍රාදේශීය සභාවේ පළාත් පාලන ආයතනයෙන් කියපු දේවල් ගෙනාපු යෝජනාවලුත්, දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාගේ මේසය මත තිබුණා. පළාත් සභාවල්වලින් ගෙනාපු යෝජනා අදහසුත් ඒ මේසය තුළ තිබුණා. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහ දේශපාලන විද්වතුන්ගේ අදහසුත් ඒ මේසය මත තිබුණා. ලෝකයේ විවිධ රටවල ආණ්ඩුක්‍රම තුළ පැවැත්වෙන මැතිවරණ ක්‍රමවලත් ඒ තිබුණු වගකීම් සහිත, ව්‍යවස්ථාපිත තත්ත්වයන්

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

ඒ මේසය මත තිබුණා. ඉතින් ඒ තියාගෙන එතුමා අවුරුදු 10 ක් දේශපාලන පක්ෂයක කණ්ඩායම් එක්ක, දේශපාලන විද්වතුන් එක්ක සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කරලා තමයි මේ තැනට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, දැනුත් පුළුවන් යම් අදහස් ටිකක් එතුමාට ඉදිරිපත් කරන්න. ඒ බව මම දන්නේ එක්සත් ජනතා නිදහස් විධායක කාරක සභාවේදී මීට දින කිහිපයකට පෙර මේ සඳහා ඉස්මතු වීමක් වුණා. එයට හොඳ ඇහුම්කන් දීමක් දුන්නා, වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතුමා කිව්වා, මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න, මේ විධායක බලය වෙනස් කරන්න, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන්න සහ තවත් අල්ලස් හා අනිකුත් දූෂණ කටයුතු සම්බන්ධව අණපනත් සම්මත කරන්න තමයි මගේ ඒකායන පරමාර්ථය කියලා. මැතිවරණ කාලයේ ජනතාව හමුවේ තබපු බරපතළ ජනතා හිතකාමී ප්‍රතිපත්ති. ඒ නිසාවෙන් අද මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන දේ තමයි අපි ඉෂ්ට කරන්න ඕනෑ. මේක අද තිබෙන බලාපොරොත්තුවක් නොවෙයි. මම කිව්ව විදියට දීර්ඝකාලීන බලාපොරොත්තුවක්.

මම හිතන්නේ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, 1982 දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ටිකක් විවේකිව ඉන්න කොට මේකේ ලුණු ඇඹුල් රස දැණුනා කියලා. ඊටත් කලින් දැණුනු වේලාවල් අපට තිබුණා. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට ලක් කළේ 1972, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ඇමැතිතුමා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සභාපතිවරයා හැටියට. එතුමා ඒ කාලයේ අපේ දේශපාලන නායකයා. ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව 1972. ඉතින් මට මතකයි මම ඉස්කොලේ යන කාලයේ මේ පොතපත කියවන කාලයේ ඩබ්ලිව්.ඒ. අබේසිංහ කියලා විශ්ව විද්‍යාල කථිකාචාර්යතුමෙක් හොඳ පොතක් ලියලා තිබුණා. ඉතින් අපි දිගින් දිගටම මේවා කියව කියවා බලනවා. ඉතින් මට දැණුනු දේ තමයි 1977 බලයට පත්වුණාම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා තමන්ට ඕනෑකම තිබුණු පූර්ව විධායක බලැති ජනාධිපති ධූරය ව්‍යවස්ථාගත ලියවිල්ලක් හැටියට ගෙන ආපු වැඩ පිළිවෙළ තුළ තමයි මේ මැතිවරණ ක්‍රමය ආවේ. ඒ නිසා මට දැනෙනවා, මේ දවස්වල එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයන් මම හිතන්නේ දැන් පළමුදා එකතු වුණා. ඊයේ පෙරෙයිදාත් එකතු වුණා. අදත් ජාතික සභාව තිබෙනවා. දැන් මේවා ගැන තමයි කථා කරන්නේ. දැන් මේ වැඩ ටික කරන්න දැඩි උවමනාවක් තිබෙනවා. ඉතින් දැන් අපි බලන්නේ, මේ රටේ අගැමැති වෙන්නේ කවුද? ඇමැති වෙන්නේ කවුද? කියන එක නොවෙයි. ජනතාවගේ යහපතට සිදුවන මේ කාරණා කොහොමද ඉෂ්ට කරන්නේ කියන එකයි මංජු ශ්‍රී අරංගල මැතිතුමනි අපි බලන්නේ. මේකයි බලන්නේ. ඒ නිසා ඔබතුමා ගෙනෙන ලද මේ යෝජනාවට මම හදවතින්ම සුභ පතනවා. ආශිර්වාද කරනවා. හැබැයි, එකක් තිබෙනවා. මේ අප්‍රේල් 23 වැනිදාට පෙර මේක කරන්න පුළුවන්ද? බැරිද? කියන කාරණාව පිළිබඳව පුංචි සැකයක්, විචිකිච්ඡාවක් අපි ළඟ තිබෙනවා. කරන්න පුළුවන් නම් හොඳයි. නමුත් අපි දන්නවා, හදිසි අණපනතක් ගෙනාවාම ඒ පිළිබඳව අධ්‍යනය කරන්න කිදෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කාලයක් ඕනෑ. ඒ නිසා ඔය අදහස පොඩ්ඩක් අපි නැඹුරු කරලා, ඔබතුමාගේ අදහස අපි ටිකක් ඉස්සරහාට ගෙනි යමු. ඉස්සරහාට ගෙනි යමු. ඉස්සරහාට ගෙනිහිල්ලා, දින 100 පොඩ්ඩක් එහා මෙහා වුණාම මොකෝ. මාස නවයෙනුත් බබා හම්බ වෙනවා. දහයෙනුත් හම්බ වෙනවා. දහයට වැඩි වෙලාත් හම්බ වෙනවා. මාව හම්බ වෙලා තිබෙන්නෙත් මාස දහයත් පහු වෙලා. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා හම්බ වෙලා තිබෙන්නේ මාස හතෙන්. එහෙම තිබෙනවා. හැබැයි, බබා හම්බ වෙන්නයි ඕනෑ. නීරෝගී බබෙක්. මතක තියාගන්න.

ඒ නිසා මේ පුංචි ප්‍රශ්න ටිකක් තිබෙන්න පුළුවන්. අපි හෘද සාක්ෂියට එකඟව යමු. ඒ නිසාවෙන් පොඩ්ඩක් එහාට තල්ලු වෙලා, මිනිස්සුන්ට උවමනාවක් නැහැ, දින 100 න් මේක කරන්න කියලා. එහෙම එකක් නැහැ. මේ රටේ ජනතාවට උවමනාව, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් කාරණා ටික ඉෂ්ට කරගන්න මේ වේලාවේ. බලය තිබෙන වේලාවේ. සෝභිත නායක හාමුදුරුවන් කිව්වා වාගේ තැටිය රත් වෙලා තිබෙන්නේ. රොටිය පුච්ච ගන්න. ඉතින් ඒකට රනිල් වික්‍රමසිංහ මහත්මයාත් රොටියක් හදනවා. ඒ රොටිය රනිල් වික්‍රමසිංහ මහත්මයා අතේ තියාගෙන ඉන්නවා. අපිත් හදනවා. එස්.එෆ්. මැතිතුමාගේ කණ්ඩායමෙනුත් හදනවා. හෙළ උරුමෙනුත් හදනවා. ඉතින් අපි කියන්නේ, ජනතාවට හොඳට ලුණු ඇඹුල් දැනෙන රොටියක්, දෙකක්, තුනක්, හතරක්, පහක් දාන්න ඕනෑ. පහක් දාන්න ඕනෑ හොඳම හෝරාව තෝරාගමු. ඒ සඳහා පොඩ්ඩක් එහාට මෙහාට කල් ගත යුතුයි. ඒ සඳහා අපි එකඟ වෙමුයි කියන එකයි මම කියන්නේ.

ඒ නිසාවෙන් මම රටේ ජනතාවට එකක් කියන්න ඕනෑ. දැන් අවශ්‍යා මේ පූර්ව විධායක බලැති ජනාධිපති ධුරය වෙනස් කරගෙන ඒ බලය පාර්ලිමේන්තුවට ගෙනි යන්න. මැතිවරණ ක්‍රමය වෙනස් කරලා රටට යහපත් නිවැරදි ජනතා නියෝජනයක් ඇති වන මැතිවරණ ක්‍රමයක් ගෙනෙන්න. ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන්න. අල්ලස් දූෂණ කොමිෂන් සභා අණපනත් ගෙනෙන්න. ඒවා මිසක දැන් මේ කවුද නායකයා කියලා සොයාගෙන යන්න ඕනෑ වේලාවක් නොවෙයි. කාලෝ අයං තේ. නායකයෙක් ඉන්නවා. ඒ පහළ වුණු මේ මෛත්‍රීපාල සිරිසේන නායකතුමා තමයි අද සක්‍රියව මේ වැඩ පිළිවෙළ ගෙනියන්න ඕනෑ කියලා කොන්ද කෙළින් තියාගෙන තීන්දුවක් ගත්තේ කියලා මම බොහොම අවංකව කියනවා. අපි එතුමාට මේ වේලාවේ ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම සන්ධාන නායකකාරකාදීන්ට ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම දිනේෂ් ගුණවර්ධන අපේ මහජන එක්සත් පෙරමුණේ නායකතුමා. හිටපු ඇමැති. දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට අපි ස්තූතිවන්ත වෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාත් එතුමාගේ පක්ෂයේ. එතුමාත් මේ සඳහා මැදිහත් වුණා. අපි සියලුදෙනාම හෙට දවසේ වඩාත් යහපත් දවසක් කරන්නට මේ රටට අපි මේ අපේ දායකත්වය අද එකතු කළා. ඒ නිසාවෙන් විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම හැටියට අපේ සුභ පැතුම් ඔබතුමාට පිරිනමනවා. රට ඉතිහාසයට එකතු වෙනවා. මෛත්‍රී යුගයේදී මේ කාරණා ටික මේ වේලාවේ සම්මත කරලා, මේ අණපනත් ටික ජනතා යහපතට ගෙන ඒම. ඒ බව මතක් කරමින් සියලු දෙනාටම බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. නිහඬ වෙනවා.

[අ.භා. 02.35]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඡන්ද ක්‍රමයේ ප්‍රතිසංවිධානයක් පිළිබඳව මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු තමන්ගේ හදවතේ තිබෙන කාරණා ටික ඉදිරිපත් කළා. ඒ සංශෝධනයන් පිළිබඳව අපි ඉතාම කාරුණිකව සවන් දෙනවා වාගේම, මතක් කරන්න ඕනෑ. මේක දින 100 වැඩ පිළිවෙළේ තිබුණු කාරණයක් නොවෙයි. දින 100 වැඩ පිළිවෙළේ තිබුණේ, අලුත් මැතිවරණ ක්‍රමයකට යන්න නීති රීති හදලා, එය ක්‍රියාත්මක කරන්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. වැඩිමනක් විධියට දීර්ඝ කාලයක් තිස්සේ මගේ හිතේ තිබුණු යෝජනාවක් තමයි මම මේ ඉදිරිපත් කළේ. හේතුව මම දේශපාලන පවුලක චරිතයකුත් නොවෙයි. මම සල්ලිකාර පවුලක චරිතයකුත් නොවෙයි. අපි බොහොම මහන්සියෙන් සමූපකාර සමිතියේ අවුරුදු 07 ක් පත් වෙලා, දෙපාරක් ඒකේ සභාපති ධුරයට පත් වෙලා, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට අවුරුදු 09 ක් ඉඳලා මම දෙපාරක් ජයග්‍රහණය කළා. ලංකාවේ ඓතිහාසික මනාප ප්‍රමාණයක් අරගෙන. ඊට පස්සේ පක්ෂයේ තීන්දුවකට අනුව තමයි මම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා අද විපක්ෂ නායක ධුරයට පත් වෙලා තිබෙන්නේ. අපි මේ මැතිවරණය කරද්දී සල්ලි වියදම් කරන්න අපට නැතිකම නිසාම, පවුල් බලය නැති නිසාම අපට දැණුනා, මේ තිබෙන මනාප ඡන්ද ක්‍රමයේදී අපට ඉස්සරහාට එන්න ලෙහෙසි ක්‍රමයක් නැහැයි කියලා. හේතුව ගිය සැරේත් කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු හත් දෙනයි තේරුණේ. ඡන්ද 3100 ක් මදි වෙලා මම අටවැනියාට පත් වුණා. ඉතින් පාර්ලිමේන්තුව ඇතුළට යන්න බැරි වුණා. මම පාර්ලිමේන්තුවේ දොර ළඟ නැවතුණා. පාර්ලිමේන්තුවේ දොර ඇරෙන හැම වේලාවකදීම මම පාර්ලිමේන්තුවේ ඇතුළ බලනවා. ඇතුළේ ඉන්න එකෙක්වත් සෙත්ත පෝච්චි වෙයිද කියලා. මට ඇතුළට යන්න. එහෙම නැතිව මේ මැතිවරණ ක්‍රමයේ ලෙහෙසි පහසුකමක් නැහැ, අපට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙන්න.

අද බැලුවාම එක පැත්තකින් මාධ්‍ය චරිත වෙනවා නම් හුඟක් පාර්ලිමේන්තුවට යන්න පුළුවන්කම තිබෙනවා. අපි මාධ්‍ය චරිත නොවෙයි. අපි මිනිස්සු අතරේ ඉන්න චරිත. නමුත් මම දන්නවා, ආසනයේ හැම මැතිවරණයකදීම පාර්ලිමේන්තු මැතිවරණයට ගිය එක්සත් ජාතික පක්ෂයේ අලියා ලකුණට ඡන්ද 25,000 යි පාවිච්චි වුණේ. මට මනාප ඡන්ද විසි හතර දහස් දෙසිය ගණනක් ලැබුණා. හැබැයි, මගේ අනික් පැත්තේ හිටපු බන්දුල ගුණවර්ධන මහත්මයා ඇමැති. බුලත් කොළේට ඡන්ද 58,000 ක් පාවිච්චි වෙද්දී එතුමාට මනාප ලැබුණේ 25,000 යි. අපේ පක්ෂයට 25,000 ක් ලැබෙන කොට මට මනාප 24,000 යි. එතුමාගේ පක්ෂයට ඡන්ද 58,000 ක් ලැබෙන කොට එතුමාට මනාප 25,000 යි. ඒ නිසා දීර්ඝ කාලයක් තිස්සේ අපි වාගේ පොඩි පවුල්වලින් ඉස්සරහාට එන මිනිස්සුන්ට මේ මැතිවරණ ක්‍රමය තුළ ඉදිරියට ඒ මේ අවකාශයක්, අවස්ථාවක් නැහැයි

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

කියලා දැණුනු නිසා තමයි හෘද සාක්ෂියට එකඟවම මේ වාගේ යෝජනාවක් පළාත් සභාවට ගෙනෙන්න ඕනැයි කියලා මම තීන්දු කළේ. මම ඒකේදී මුලින්ම කිව්වා, මේ ප්‍රධාන පක්ෂ ඔක්කෝම හොරගල් අහුලනවා කියලා. මේක හරියට ක්‍රියාත්මක කරන්න සූදානම් නැහැ. අද මේ මොනවා කිව්වත් එදා මේ මැතිවරණ ක්‍රමය ගේනකොට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට කියපු දේවල්. අද එතුමාගේ මේ ක්‍රමයට සමහර උදවිය ප්‍රශංසා කරන විධිය දැක්කාම, තිබෙන මැතිවරණ ක්‍රමයට ආදරය කරන හැටි දැක්කාම පුදුමයි.

දැන් උදාහරණයක් විධියට මනාප ඡන්ද ක්‍රමයට විරුද්ධව වැඩියෙන්ම කථා කළේ ජනතා විමුක්ති පෙරමුණ. අද කියනවා, වැඩියෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ මේ මැතිවරණ ක්‍රමය තුළ කියලා. ඇයි? මේ ඊයේ පෙරෙයිදා අල්ලස් කොමිෂන් සභාවට ෆයිල් උස්සාගෙන දවසින් දවස යනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ මාධ්‍ය සංදර්ශන කරනවා. එතුමා කිව්වේ, අපි මාධ්‍ය සංදර්ශන කරනවා කියලා. එතුමන්ලා මාධ්‍ය සංදර්ශන කරලා ෆේස් බුක්වල ඉන්න තරුණ තරුණියන්ට ආකල්පයක් ඇති කරලා තිබෙනවා, අපි තමයි හොරු අල්ලන්න සූදානම් වෙලා තිබෙන්නේ. ආණ්ඩුව ඒකට සූදානමක් නැහැ. ඒ නිසා මේ වැඩේට අපට උදව් කරපල්ලා කියලා. සමාජය තුළ කථිකාවතක් ඇති කරන්න උත්සාහ කරනවා, අනේ හොරු අල්ලන්න හදන්නේ කවුරුවත් නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණ. ඒ නිසා මේ දෙගොල්ලන්ටම නොවෙයි. මුන්ට ඡන්දයක් ගහන්න ඕනැයි කියලා මතවාදය රටේ හදන්න. ඉතින් ඒ නිසා මේ කටුසු න්‍යාය තමයි දැන් පාවිච්චි කරන්න හදන්නේ.

අනික් පැත්තෙන් මම මතක් කරන්න කැමැතියි. මේ ඡන්ද ක්‍රමය තුළ - එතුමා කැස්බෑවේ අතුරු මැතිවරණය උදාහරණයට ගත්තා. කැස්බෑවේ අතුරු මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයේ හිටපු ධර්මසේන ආටිගල මහත්මයා තමයි අපේ පක්ෂයෙන් අපි ඉදිරිපත් කළේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිබුණු හොඳම අපේක්ෂකයා තමයි සෝමවීර චන්ද්‍රසිරි මහත්මයාගේ පුත්‍රරත්නය. සෝමවීර චන්ද්‍රසිරි මහත්මයාගේ පුතාට ඒ අවස්ථාව දුන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරගත්ත වැරැද්දක්. ඒ දුන්නේ නැති වුණාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඩික්සන් ජේ. පෙරේරාට දුන්නා. ඒ නිසා ඒ දෙකේ ඡන්ද එකතු කරලා මෙයා පරාද වෙනවා කියන ආකල්පය නොවෙයි. ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගත්ත තීන්දුවක වැරැද්ද නිසා තමයි එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා ජයග්‍රහණය කළේ. නැත්නම් පක්ෂයක් හැටියට සුදුස්සාට සුදුසු තැන ඒ වේලාවේ දුන්නා නම් මේ තීන්දුව අද ජනතා විමුක්ති පෙරමුණට කියන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා මනාප හිනාවට, මනාප ක්‍රමයට - ඒ කාලයේ කිව්වේ, බිත්තිවල හැම තැනම මනාප හිනාව දාගත්ත එවුන් තමයි ඉන්නේ. මේ මැතිවරණ ක්‍රමය ජනතා විරෝධී මැතිවරණ ක්‍රමයක්. අද මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයක් නැහැයි කියන තරමටම අද පත් වෙලා තිබෙනවා. හෙට අනිද්දා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ පිංතූරේ ජනතා විමුක්ති පෙරමුණේ කාර්යාලයේ එල්ලලා තිබුණත් ඒක ගැන කිසිම ප්‍රශ්නයක් වෙන්න ඕනැකමක් ඇත්තේ නැහැ, මේ කථා කරන කථා කිරිල්ලට කනගාටු වෙනවා, ඒ උදවිය මෙතැන නැති එක පිළිබඳව.

දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාගේ වාර්තාව ඉතාම හොඳ කමිටු වාර්තාවක්. අපට කියවන්න ලැබුණා. පළාත් පාලනය සඳහා ඉතාම සාර්ථක මැතිවරණ ක්‍රමයක් ඒ තුළ නියෝජනය වෙනවා. උදාහරණයක් විධියට මම බැලුවා, හෝමගම පළාත් පාලන කොට්ඨාශ කොහොමද කඩලා තිබෙන්නේ කියලා. මත්තේගොඩ 12% ක් සුළු ජාතීන් ඉන්නවා. එහෙම නැත්නම් මුස්ලිම් ජාතිකයන්. මත්තේගොඩ කොට්ඨාශය බහු ආසනයක් බවට පත් කරලා තිබෙනවා. එතකොට සුළු ජාතික පක්ෂවලට ඇතුළත්වීමට තිබෙන ඉඩකඩ ඉතාම හොඳින් ඒකට ඇතුළත් වෙන්න අවකාශය ලබා දීලා තිබෙනවා, පළාත් පාලන මැතිවරණය පිළිබඳව.

මම හිතන්නේ 1977, 1978 මේ මැතිවරණ ක්‍රමය ආවේ, සංවර්ධන සභා මැතිවරණ ක්‍රමය. ඒක නිවැරැදියි. ඉස්සෙල්ලාම තිබුණේ සංවර්ධන සභා මැතිවරණ ක්‍රමයට ලැයිස්තුවක් දාන එක. ලැයිස්තුවේ උඩ මිනිස්සු තේරෙනවා. පල්ලෙහා මිනිස්සු වැඩ කරන්නේ නැහැ. ඒ නිසා තමයි මේ මනාප ක්‍රමය ආවේ. එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ගෙනාපු දවසේ සිට මේ මැතිවරණ ක්‍රමයට ගහපු උදවිය තමයි අද මේ මැතිවරණ ක්‍රමය හොඳයි කියන තැනට ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා මම

මතක් කරන්නේ වෙන මොකුත් නොවෙයි. මේකට අමුතු කාලයක් දැන් ඕනෑකමක් ඇත්තේ නැහැ. සාකච්ඡාවට බඳුන් වෙන්න ඕනෑ. මහජනතාව දීර්ඝ වශයෙන් කථා කරලා තිබෙනවා. මේ රටේ ජීවත් වෙන මිනිස්සුන්ගෙන් ගිහිල්ලා මේ මැතිවරණ ක්‍රමය හොඳද? නරකද? කියලා අහන්න. මම දන්න විධියට මේ දේශපාලන පක්ෂවල නායකයන් ඇරෙන්න අනික් හැම මනුස්සයෙක්ම කියන්නේ මේ මැතිවරණ ක්‍රමය දූෂිතයි. නරකයි. තිබුණු ආසන ක්‍රමයේ මැතිවරණයෙන් මොනවා වුණත් අපට වගකියන මහජන නියෝජිතයෙක් පත් වුණා. අද ඒ තත්ත්වය නැහැයි කියලා. හැබැයි, එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවේත් මන්ත්‍රීවරු තෝරා පත්වෙද්දී සුළු ජාතික නියෝජනයකට ඉඩකඩ ලබා දීලා තිබෙනවා. අද නොවෙයි. එදා. ඒ නිසා සුළු ජාතීන් නියෝජනය වීමට අවශ්‍ය පහසුකම, පසුබිම මේ මැතිවරණ ක්‍රමයට ඇතුළත් වෙන්න ඕනෑ. ඒක සාකච්ඡා වෙමින් තිබෙනවා. ඒක ක්‍රියාත්මක කෙරෙන්න ඕනෑ.

ඊළඟට තමයි මුදල් වියදම් කිරීම පිළිබඳව. මම ඕස්ට්‍රේලියාවේ ජීවත් වන එහි පුරවැසිභාවය තිබෙන අපේ මහත්මයෙක් එක්ක කථා කළා. ඕස්ට්‍රේලියාවේ මේ මැතිවරණ ක්‍රමයේදී, ඕස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තු මැතිවරණයකට ඉදිරිපත්වන අපේක්ෂකයෙක් තමන්ගේ ඒ මැතිවරණය සඳහා කොපමණ මුදලක් වියදම් කරනවාද කියන එක කියන්න ඕනෑ. ඇයි? දැන් අපට මැතිවරණයකට යනකොට සල්ලි නැති වුණාම - මේවාට උතුරන සල්ලි ප්‍රමාණයක් අවශ්‍යයි. අපි විවිධ මුදලාලිලාගෙන්, විවිධ පුද්ගලයන්ගෙන් උදව් උපකාර ගත්තාම බලයට පත් වුණාම අර මුදලාලිලාට සැප සම්පත්, ඉල්ලන දේ දෙන්න සූදානම් වෙන්න වෙනවා. ඕස්ට්‍රේලියාවේ මේ පිළිබඳව හදාරපු එක්කෙනෙක් ඒ මහත්මයා. ඔහු කිව්වේ, ඕස්ට්‍රේලියාවේ නියෝජිතයෙක් ඉදිරිපත් වෙනකොට එයා වියදම් කරන මුදල් ගණන වේලාසනින්ම මැතිවරණ කොමසාරිස්වරයාට කියන්න ඕනෑ. මැතිවරණ කොමසාරිස්වරයා ඉතාම ස්වාධීන පුද්ගලයෙක්. ඒක තමයි අපි කියන්නේ ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් පත් වෙන්න ඕනෑ. පත් කරන්න ඕනෑය කියලා. එතකොට ඔහු ඒ මුදලට වැඩිය වියදම් කළොත් කවුරු හරි ඔහුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කළොත් ඔහු ඊට වඩා මුදල් වියදම් කරලා තිබෙනවා නම්, වියදම් කළා නම් ඒ කොහෙන්ද කියලා ඔයාට කියන්න බැර වුණා නම් ඔහුගේ මන්ත්‍රී ධූරය අහෝසි වන නීති රීති ඒ රටේ තිබෙනවා. ඒ නිසා මැතිවරණ ක්‍රමයක් දූෂිත වෙන්නේ, මුදලත් එක්ක කියන එක පැහැදිලියි. ධනයත් එක්ක කියන එක පැහැදිලියි. ඒක පාලනය කරන්න විවිධ නීති රීති ගෙනැල්ලා කටයුතු කළොත් හොඳයි. මම හිතන්නේ, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ සක්වල ගල තුළ මේ මැතිවරණ ක්‍රම වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. මේවා ඔක්කෝම සෝබන. මේවා මාධ්‍ය සංදර්ශන. ඒකට වෙන වචනයක් ප්‍රකාශ කළා. මට මතක නැහැ. එහෙමනම් මේ රටේ අනික් සියලුම පක්ෂ බොරු කියන්නේ. සත්‍ය ප්‍රකාශ කරන එකම පක්ෂය එතුමන්ලාගේ පක්ෂය විතරයි කියන එක තමයි එතුමන්ලා කියන්නේ. වෙන කවුරුවත් ඇත්ත කියන්නේ නැහැ. අනික් ඔක්කෝම ටික හොරු විධියට, බොරු කියන මිනිස්සු විධියට තමයි කියන්නේ. මම කියන්නේ මේ රටේ වැඩියෙන්ම බොරුයි කියන්නේ අනික් එකා බොරුයි කියන එකා තමයි. ඒ තරමටම මේක ගිහිල්ලා තිබෙන්නේ.

ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරද්දී අපි කියන්නේ ඉස්සර ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ධනපතියෙක් විධියට හැඳින්වුවත් 1977 මැතිවරණයෙන් ඉතාම දුප්පත් දිළිඳු මිනිස්සුන්ට ජේ.ආර්. ජයවර්ධන මහත්මයා නාමයෝජනා ලබා දුන්නා. අවිස්සාවෙල්ල දිහා බැලුවාම, කැස්බෑව බැලුවාම, එතැනින් ගියාම කඩුවෙල පාරම්පාරික එම්.ඩී.එච්. ජයවර්ධන මහත්මයලා, හෝමාගම ගාමිණී ජයසූරිය මහත්මයලා සිටියා. නමුත් එහෙම නැති තැන්වල ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මොනතරම් වංසක්කාර රදළයෙක් කියලා කිව්වත් මේ රටේ දුප්පත්, අහිංසක මිනිස්සුන්ට පාර්ලිමේන්තුවට එන්න දොර ඇරලා දීපු නායකයෙක් තමයි ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා. අනික් පැත්තෙන් අගමැතිවරයා හැටියට ප්‍රේමදාස මැතිතුමාව. එතුමා අගමැති ධූරයට පත් කෙරුවා. මේ නගරයේ සාමාන්‍ය පන්තියක නායකයෙක්. හැබැයි, එතුමාට එතැනට එන්න තිබුණේ දක්ෂකම. හැබැයි, අපි වාගේ මිනිස්සුන්ට ඒ දක්ෂකමෙන් ඉස්සරහාට එන්න කාලයක් යනවා. අද වෙලා තිබෙන්නේ, මේ කථා කරපු මැතිවරණ ක්‍රමය වෙනස් කරගන්න මේ මැතිවරණ ක්‍රමයට යා යුතුයි කියන තැන නොඉන්න හුහදෙනෙකුගේ කල්පනාව, ඊයේ ප්‍රාදේශීය සභාවට පත් වුණා. අද පළාත් සභාවට පත් වෙනවා. එයාට උවමනාව තිබෙනවා, හෙට පාර්ලිමේන්තු යන්න. එහෙම නොවෙයි එදා මිනිස්සු. ගම් සභාවට පත් වෙලා. ගම් සභාවෙන් නගරාධිපති බවට

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

පත් වෙලා, ඊළඟට තිබුණු පාර්ලිමේන්තු - දැන් හෝමාගම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් කළා සමසමාජ පක්ෂයේ නායකයෙක් හැටියට හිටපු විල්බට් සේනානායක මැතිතුමා. එතුමා හෝමාගම සුළු නගර සභාවේ නගරාධිපතිවරයා හැටියට වැඩ කටයුතු කළා. ඉන් පස්සේ පාර්ලිමේන්තුවට ආවේ. සේනානායක කෙනෙක් වුණාට එහෙම එතුමා රදළ පවුලක මනුස්සයෙක් නොවෙයි. සාමාන්‍ය මනුස්සයෙක්. ඒ නිසා මම මේ මතක් කරන්නේ මොකුත් නොවෙයි. අපි මේ යෝජනාව කළේ, අපට මෙපමණ වයසක් ගිහිල්ලා අත්විඳින්න ලැබුණු ඉරණම ගමෙන් එන සාමාන්‍ය මිනිස්සුන්ට මීට පස්සේ මේ වාගේ වද විඳින්නේ නැතිව - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දක්ෂ මිනිහෙකුගේ දක්ෂකම් සදාකාලිකව යටපත් කරලා තියන්න පුළුවන්කමක් නැහැ. වතුර යට බෝලයක් අතින් අල්ලන් ඉන්නතාක් කල් තියන්න පුළුවන්. අත ගත්ත ගමන් බෝලය උඩට එනවා වාගේ ගම්වලින් එන අති දක්ෂකම් තිබෙන අයට මේ ආසනයක ඔහු දක්ෂයෙක් වුණොත් ඔහුට ඉතාම ඉක්මණින් එන්න පුළුවන්. එහෙම නැත්නම් මිනිස්සු තීන්දුවක් ගන්නවා. මිනිස්සු කියනවා, මේ ආසනයේ දාන මිනිහා නොවෙයි දක්ෂ. අර කැස්බෑවේ ඡන්ද ප්‍රතිඵලය රටටම ඒ කාලයේ හොඳ ඡන්ද ප්‍රතිඵලයක් බවට පත් වුණා. ඒ නිසා පක්ෂයක් වැරැදි තීන්දුවක් ගත්තොත් ඒ පක්ෂයට දඬුවම් ලැබෙනවා. අද එහෙම දෙයක් නැහැ.

ඉතින් ඒ නිසා අනික් පැත්තෙන් මේ මුදලට, බලයට, විවිධ දේවල්වලට යට වුණු මිනිස්සුන්ට වග නොකියන පාර්ලිමේන්තුවක්, පළාත් සභාවක් බිහිවන නිසා තමයි අපි මේ කාරණය කිව්වේ. මේකට කාලයක් ගත්තාට කමක් නැහැ. මම මේ කිව්වේ ඉදිරි මැතිවරණයටම වෙන්න නොවෙයි. නමුත් පළාත් සභාවක් හැටියට අපි මෙහෙම පෙළඹවීමක් නොකළොත් මේ කටයුත්ත කවදාවක්වත් කෙරෙන්නේ නැහැ. පළාත් සභාව තුළ සාකච්ඡාවට බඳුන් කළාම මේක පළාත් සභාවේ සාකච්ඡා කළා. මේක හෙට සමහර වේලාවට අපේ පක්ෂයේ නායකයන්ට එක එක විධියට යයි. මගෙන් අහන්නත් පුළුවන් මොකද මේ මගෙන් අහන්නේ නැතිව මේ යෝජනාවල් පළාත් සභාව තුළ ගත්තේ කියලා. ඒකට කමක් නැහැ. බෙල්ල දෙන්න ඕනෑ, තව මිනිහෙකුට හරි යන්න, එක මිනිහෙක්වත්. ඉතින් ඒ නිසා කවුරු හරි බෙල්ල දුන්නාම ඒක ගැන සාකච්ඡාවට බඳුන් වෙනවා කියලා කියනවා. ඉතින් අපි කියන්නේ, මේ දින 100 වැඩ සටහනේ, ඉක්මණින් පුළුවන්තරම් කරන්න. අපි අපේ පක්ෂයේ නායකයන්ටත් කියන්නේ දින 100 අවුරුදු 100 ක් නොවෙයි. දින 100 අවුරුදු 100 ක් කියලා හිතේ තියන් ඉන්නවා නම් ඒක අපට වරදිනවා. ඒ නිසා ඉතාම කෙටි කාලයක් තුළ මේ වැඩ ටික කරලා මේ රටේ යහපාලනය කියන එක මාතෘකාවක් ඇති වුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න. මේ ව්‍යවස්ථා සංශෝධන, කොමිෂන් සභා පිහිටුවන්න. තොරතුරු දැන ගැනීමේ පනත ඇති කරන්න. මේ තුළ තමයි යහපාලනය කියන වචනය ආවේ. ඒක කරන්න සියලුදෙනාටම හැකියාව ලැබේවා.

මම ගෙනාවේ අර කිව්වා වාගේ මට මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නය නොවෙයි. මේ තිබෙන අද ඡන්ද ක්‍රමයක් එක්ක ජීවිතයට හෝමාගම මට මන්ත්‍රීවරයෙක් වෙන්න ලෙහෙසි නැහැ. නමුත් මම කල්පනා කළේ අපි වාගේ සාමාන්‍ය පන්තිවලින් බිහිවෙන - ඒ කාලයේ තරුණයෙක්. අද ඉතින් මේ කෙස් ටික ගියාට. ඒ වගේ අයට මෙපමණ කාලයක් යන්නේ, ඒ තිබුණු දුෂ්කරතා නිසා. ඒක ගමක ඉස්සරහාට එන, ගමක දක්ෂ තරුණයෙකුටවත් අපට වුණු හානිය නොවෙන්න තමයි මේ යෝජනාව බොහොම සද්භාවයෙන් යුක්තව කළේ. ඒ නිසා මේ වෙනුවෙන් අදහස් දක්වපු සියලුදෙනාට මගේ ගෞරවයත්, ස්තූතියත් පිරිනමමින්, මෙපමණ දීර්ඝ කාලයක් මේ සභාව කරගෙන යන්න අවස්ථාව දීපු ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා අද මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාගේ ඒ යෝජනාවට විශේෂ අදහස් විශාල ප්‍රමාණයක් එකතු කළා. මේ සම්බන්ධයෙන් අදාළ හැන්සාඞ් වාර්තාව අපේ රජයට යොමු කරන්න අවශ්‍ය කටයුතු කරනවා. ඒ වාගේම මම එක කාරණයක් කියන්න කැමැතියි. කේවළ ක්‍රමය අනුව, ආසන ක්‍රමය අනුව ඡන්දය තිබෙන එකෙන් දුප්පත් මිනිහෙකුට පාර්ලිමේන්තුවට එන්න අවකාශ ලැබෙනවා කියලා ඔබතුමා කිව්වා.

මම අහලා තිබෙනවා, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා අගමැති වුණු කාලයේ, පාර්ලිමේන්තුවට

ලැයිස්තු හදන කාලයේ එතුමා අනුරාධපුරයේ ගිහිල්ලා එනකොට කවි කොල විකුණන තරුණයකුව බස් එකේදී දැකලා තිබෙනවා. දඹුල්ලට කෙනෙක් සොයන කොට එතුමාට ඔලුවට ආවේ කවි කොළ විකුණපු තරුණයාව. ඒ කවුරුත් නොවෙයි. ටී.බී. තෙන්නකෝන් හිටපු ඇමතිතුමා. ඒ නිසා එතුමා එදා තීන්දු කළා, අර කොලුවාට එන්න කියන්න ඡන්දය ඉල්ලන්න කියලා. ඒ කොලුවා තමයි පාර්ලිමේන්තුවට එහෙන් ආවේ. ඉතින් ඒ මැතිවරණ ක්‍රමයේ හොඳ පැත්තක්.

ඒ වාගේම තමයි මම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ. කළුතර ආසනයේ චම්ලි ගුණවර්ධන මැතිතුමා ගැන තමුන්නාන්සේලා අහලා තිබෙනවා. එතුමාත් එක්ක තමයි අපි දේශපාලනය කළේ. චම්ලි ගුණවර්ධන මැතිතුමා හිටියේ කුළියට. එතුමා මිය යන තෙක්ම හිටියේ කුළියට. එතුමාගේ ගේ එතුමාගේ නෝනා බොහොම අමාරුවෙන් කොළඹ හදා ගත්තේ. අද ඒ මැතිනිය ජීවත් වෙන්නේ එතුමාගේ පෙන්ෂන් එකෙන්.

නමුත් අද කළුතර ගත්තාම හුඟක් දෙනෙක් දන්නවා දූෂණය කොහොමද වෙලා තිබෙන්නේ. මේ මැතිවරණ ක්‍රමය යටතේ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය බොහොම ඉක්මණින් අවසන් කළ යුතුයි. ඒ මතයේ මම ඉන්නවා. අපේ පක්ෂය ඉන්නවා. අතිගරු ජනාධිපතිතුමා ඊයේත් අපිත් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන්ගේ රැස්වීමේදී කිව්වේ මේ මැතිවරණ ක්‍රමය අවසන් කිරීමේ පනත බොහොම ඉක්මණින් ගේනවා. ඒ නිසා ඊට අවශ්‍ය කරන සහයෝගය එක්සත් ජාතික පක්ෂයෙනුත් තිබෙනවා. සන්ධානයේ අනෙකුත් පක්ෂවලත් තිබෙනවා. ඒවා එකතු කර ගෙන අපි ඉදිරියේදී මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න බස්නාහිර පළාතේ විශේෂයෙන් මුළු රටේම තිබෙන විශාලම පළාත් සභාව මේක. මේ බස්නාහිර පළාතේ නඟන හඬ අපේ නායක කාරකාදීන්ට යොමු කරලා - ඇත්ත වශයෙන්ම අද මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂනායකතුමා කරපු යෝජනාව ඉතිහාසගත වන යෝජනාවක්. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය වෙනස් වුණොත් ඔබතුමාත් ඉතිහාස ගත වෙනවා. ඒ නිසා අපි සුභ පතනවා, එතුමාට මේ යෝජනාව ගේන්න අදහස පහළ වීම පිළිබඳව.

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

"දැන් මම මෙම සභාව කල් තබනවා."

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.57ට, 2015 අප්‍රේල් මස 07 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 02.57 p.m till 09.30 a.m, on 07.04.2015.*